# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

### 6 වන ශ්‍රේණිය



ආගම්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**6 වන ශ්‍රේණිය**

ආගම්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

© ජාතික අධ්‍යාපන ආයතනය
පළමු වන මුද්‍රණය 2007

ආගම්, භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

මුද්‍රණය :
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

# පටුන

පිටුව


අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය 02

හැඳින්වීම 03

පෙරවදන 04

ලේඛක මණ්ඩලය 06

විෂය නිර්දේශය

6.1 හැඳින්වීම 09

6.2 විෂය අරමුණු 10

6.3 පන්තියට අදාළ නිපුණතා 11

6.4 විෂය නිර්දේශය 12

නිපුණතා

නිපුණතා මට්ටම්

සන්ධාරය

යෝජිත කාල පරිච්ඡේද 16

6.5 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය 16

6.6 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් 17

6.7 තක්සේරුකරණය හා ඇගයීම 19

ක්‍රියාකාරකම් සන්තතිය

6.8 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය 21

6.9 ගුණාත්මක යෙදවුම් 24

6.10 ක්‍රියාකාරකම් සන්තතිය 25

6.11 තක්සේරු ඇගයීම් විස්තර 152

6.12 ඉගෙනුම් ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ 154


Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

නව සහශ්‍රයේදී සිදුකළ පළමු විෂයමාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුළ පවතින යම් යම් ගැටළු නිරාකරණය කරගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැකිය. මෙම විෂයමාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින චින්තන සමාජීය හා පුද්ගල දුර්වලතා මගහරවා ගැනීමේ අභිලාෂයෙනි.

ආසියාවේ අධ්‍යාපන ක්‍රමය සලකා බැලීමේදී මෙයට වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිටියේ බොහෝ ඉදිරියෙනි. නමුදු වර්තමානයේදී ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියෙන් සිටියි. මෙම පසුබෑමට හේතුව කිසිදු නව දැක්මකින් තොරව පවතින දෙය මත පමණක්ම තීරණ ගනිමින් ඒ දේ පමණක්ම නැවත නැවත ඉදිරිපත් කිරීම ය.

මෙම තත්ත්වය මගහරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිලි දැක්මකින් යුතුව විෂයමාලාව සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂයමාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර විසින් දැනටම දන්නා දේත්, නව අදහස් හා ගවේෂණාත් මගින් අනාගතය ගොඩනගා ගැනීම පිණිස ශිෂ්‍යයන්ගේ කුසලතා හා නිපුණතා ප්‍රගුණ කර ගැනීමට හැකිවන ආකාරයෙනි. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ගුරුවරයාගේ කාර්යභාරයේ පූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වෙයි. දැනට පවතින ගුරු කේන්ද්‍රීය ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් මෙම නව අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අදාළ අභියෝගවලට මුහුණ දීමට සූදානම් විය යුතුවේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුනට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත්සේ උපකාරී වනු ඇතැයි යනු අපගේ පූර්ණ විශ්වාසයයි. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දී ඇති මගපෙන්වීම පිළිපැදීම මගින් ඔබට සාර්ථක ගුරු භවතකු වීමට හැකියාව ලැබෙනු ඇත. එය ඔබට ඉගැන්වීමේදී මෙන්ම ශිෂ්‍යයන් ඇගයීමේදී ද උපකාරී වනු ඇත. ගවේෂණය හා ගුණාත්මක යෙදුම් සම්බන්ධයෙන් දී ඇති මාර්ගෝපදේශන ශිෂ්‍යයාට උපකාරී වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත. එලෙසම එය විදුහල්පතිවරුනට කාල සටහන් පිළියෙල කිරීමේදීත්, සීමිතව පවතින සම්පත් වෙන්කර දීමේදීත් අභ්‍යන්තර අධීක්ෂණයේදීත් මහත් සේ උපකාරී වනු නොඅනුමානය.

කෙසේ නමුදු අපගේ බලාපොරොත්තුව වන්නේ මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් තම නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කරමින් තමන් විසින් ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීම ය. මක්නිසාදයත්, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් නිදසුන් හෝ ආදර්ශ වන නිසාත්, ප්‍රාදේශීයව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා බැවින් ඔවුනට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකිවනු ඇත.

ගුරුභවතුන්ට අමතර ව අධ්‍යාපනඥයන්ට, ගුරු උපදේශකවරුනට හා බාහිර අධීක්ෂණය හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට ද උපකාරී වන ආකාරයට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීමෙහිලා දායක වූ සියලු දෙනාට මගේ කෘතඥතාවය පිළිගන්වමි.

මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතු ය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ මෙම විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා අතින් සිදු විය. මෙම ක්‍රියාවලිය නිසා හුදෙක් බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහිවූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ ඒ විෂය යටතේ සිසුන් අත්පත් කරගත යුතු නිපුණතා හඳුනාගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බවින් ඔබ්බට ගිය, ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශ භාවිතා කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

මෙහි හමුවන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය කොටසේ දී නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පංතිකාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම, පරිසරය නිරීක්ෂණය, සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ තම යහළු යෙහෙළියන්ට තමා දන්නා දේ කියාදීම, හැකි අවස්ථාවන්හි දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස්කර ගැනීම ආදී ගවේෂණාත්මකව ඉගෙනීම් සංස්කෘතියක් දැකිය හැකි විය යුතු ය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති පෙළපොත ද සම්පත් පොතක් ලෙස භාවිත කළ යුතු ය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරැදි කොට සංවිධානාත්මක ව හා අංග සම්පූර්ණ ව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් විය යුතු ය. එය සිසුන් සොයා ගන්නා සියලු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කරන තත්ත්වයක් විය යුතු ය. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය සිසුන්ට බෙහෙවින් ආකර්ශණීය වනු ඇත.

මේ සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ පාඩම් ඔබට තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මඟ පෙන්වීමක් බව සිතන්න. මේ ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස බොහෝ නව පාඩම් සකස් කර ගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

මෙම නව පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විටම සිසුන් ක්‍රියාකාරී ය. එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තවද ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට හඳුනා ගැනීමට හැකිවේ. ඒ හැමවිටම එම දුෂ්කරතා ජය ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදව් කිරීමට යොමු කරන්න. මෙසේ පාඩමත් සමඟ කෙරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් හොඳ ඉගෙනුමකට හේතු වේ.

තවද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම දීර්ඝ කිරීමේ පැවරුම් හා අභ්‍යාස දරුවා උගත් දේ තව දුරටත් ශක්තිමත් කිරීමට සමත්වන ආකාරය පිළිබඳ අවධානය යොමු කරන්න. එය සිසුන් ඇගයීමට ලක් කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දීර්ඝ කිරීමේ අභ්‍යාස කෙරෙහි සිසුන් යොමු කිරීම පිළිබඳව ද සැලකිලිමත් වන්න.

මෙමගින් නව ලොවට උචිත නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම ද, එයටම ගැළපෙන ගුරු භූමිකාවක් හා පංතිකාමරයේ නව ඉගෙනුම් සංස්කෘතියක් බිහිවීම ද අපේක්ෂා කරමි.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## පෙරවදන

ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයට පහත සඳහන් ප්‍රධාන කොටස් ඇතුළත් ය. ඒවා :

- විස්තරාත්මක විෂය නිර්දේශය
- ක්‍රියාකාරකම් සන්තතිය
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් දීර්ඝ කිරීමේ උපකරණ

ඉස්ලාම් ඉගෙනීමෙන් ලබා ගත යුතු යැයි බලාපොරොත්තු වන නිපුණතා ලඟා කරගනු වස් අල්ලාහ් කෙරේ විශ්වාසය තැබීම, ඉබාදතයන්හි යෙදීම, ආගමික විනය, නබිතුමන්ගේ සීරාව, හරයයන්, දර්ශන, ආගමික හා සමාජ චාරිත්‍ර වාරිත්‍ර, සාහිත්‍යය, සංස්කෘතිය, ක්‍රියාකාරී අත්දැකීම ආදිය පදනම් කර ගනිමින් නිපුණතා හා නිපුණතා මට්ටම් ඇතුළත් විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

සිසුන් විසින් සංවර්ධනය කර ගත යුතු නිපුණතා මට්ටම් සම්බන්ධ විෂය සන්ධාරය මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් වීම මෙහි සුවිශේෂී ලක්ෂණය වන්නේ ය. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්වලට උදව්වන ද්‍රව්‍ය (ගුණාත්මක යෙදවුම්) සඳහන් වන නිසා කල් ඇතිව ම මේවා ලබාගෙන සූදානම් කර තබා ගැනීමට අවස්ථාව ලැබේ.

විෂය නිර්දේශය මගින් බලාපොරොත්තුවන ප්‍රතිඵල සහතික කර ගැනීම සඳහා වටිනා යෝජනා රැසක් තක්සේරුව හා ඇගයීම නම් කොටසේ අන්තර්ගතය. පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් යන කොටස පාසල් අධ්‍යාපනයට සම්බන්ධ සියල්ලන්ම කියවා වටහා ගත යුතු ය. ගුරුවරුන්ට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් බාර දෙන විටත්, ගුරු කාර්යයන් අධීක්ෂණය කරන විටත්, අවශ්‍ය පරිදි කාලය වෙන් කර ගැනීමට පාසල් කළමනාකරුවන්ට මෙය අවශ්‍ය මගපෙන්වීම් ලබා දෙන්නේ ය.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන කොටසේ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා නියමිත ක්‍රියාකාරකම් සන්තතිය හඳුන්වා දී ඇත. මේවා සියල්ල ඒ අයුරින් ම ක්‍රියාත්මක කළ යුතු යැයි බලාපොරොත්තු වන්නේ නැත. සිය නිර්මාණාත්මක හැකියාවන්ට හා විචාරාත්මක චින්තන හැකියාව අනුව ක්‍රියාකාරකම් සුදුසු පරිදි සකස් කර ගනු ඇතැයි ගුරුවරයාගෙන් බලාපොරොත්තු වේ. උදාහරණයක් ලෙස කණ්ඩායම් හතරක් සකස් කරගන්නා ලෙස උපදෙස් දී තිබුණ ද පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව ගැන සලකා එය වෙනස් කර ගත හැකිය. කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට අවස්ථාව සලස්වන ආකාරයෙන් අවශ්‍ය තීරණ ගැනීමේ දී ගුරුවරයා අවස්ථානුකූලව ක්‍රියා කළ යුතුය. අදාළ නිපුණතා මට්ටම සපිරෙන සේ ක්‍රියාකාරකම්වලට අවශ්‍ය පමණ කාලය වෙන් කර ඇත. මිනිත්තු 40 ක කාල පරිච්ඡේද ඉක්මවා යාමට සිදුවිය හැකිය. එක් එක් නිපුණතා මට්ටම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පමණ කාලයක් ඒ ඒ ක්‍රියාකාරකම්වලට ලබා දී ඇත. ඒ සමඟ කාල සටහනේ ලබා දී ඇති තනි කාල පරිච්ඡේද, ද්විත්ව කාලපරිච්ඡේදවලට ගැලපෙන අයුරින්, මෙම ක්‍රියාකාරකම් කොටස් කරගත යුතු යැයි ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වෙන්නේය. පෙර දින ආරම්භ කළ ක්‍රියාකාරකමක් පසු දින දිගටම කර ගෙන යන්නේ නම් පළමු දින ඉගැන්වූ කරුණු නැවත මතක් කර ගත හැකි වේ. මෙය ඔබගෙන් බලාපොරොත්තු වන්නකි.

කිසියම් නිපුණතා මට්ටම සාක්ෂාත් කර ගැනීම සඳහා වෙන් වෙන් වූ ක්‍රියාකාරකම් සකස් කර ගත යුතු වේ. එහෙයින් කිසියම් යෝජිත ක්‍රියාකාරකමක් ඒ අයුරින් ම ක්‍රියාත්මක කළ යුතු යැයි කිසි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

විටෙකත් ඔබගෙන් බලාපොරොත්තු වන්නේ නැත. ඉතා හොඳ ප්‍රවේශ හැකියා හා ගවේෂණ හැකියා ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විස්තීරණ කළ හැකි විවිධ උපකරණ යොදා ගෙන ඉතා හොඳ ඉගැන්වීමකි ඔබෙන් බලාපොරොත්තු වන්නේ. අළුත් කරුණු හඳුන්වා දෙන විට ඔබගේ කාර්යක්‍ෂමතාවය හා ඵලදායීතාවය සංවර්ධනය කරන අයුරින් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ තුන්වන කොටසේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය කිරීමට උදව් වන උපකරණ පද්ධති ඇතුළත් ය. ක්‍රියාකාරකම් පද්ධතියක් කේන්ද්‍ර කොට ලබාදෙන මෙම උපකරණ, පන්ති කාමරයට පිටතින් ද සිසුන් අඛණ්ඩ ව ඉගෙනීමේ යෙදීමට උදව් වන්නේ ය. මෙම උපකරණ යොදා ගෙන සිසුන්ගේ ඉගෙනුම පරීක්‍ෂා කොට අදාළ ප්‍රතිපෝෂණ ලබාදීම ඔබගේ කාර්යභාරය වන්නේ ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වයට ඇගයීම් ක්‍රමවල ප්‍රබල වෙනස්කම් අවශ්‍ය වන්නේ ය. සිසුන්ගේ සිතීමේ හැකියා, සමාජ කුසලතා, පෞද්ගලික කුසලතා ආදිය සංවර්ධනය කරන අයුරින් ඉගැන්වීමේ යෙදෙනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| මෙහෙයවීම | : | මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| උපදේශනය හා මග පෙන්වීම | : | විමල් සියඹලාගොඩ<br>සහකාර අධ්‍යක්ෂ ජනරාල්<br>ආගම්, භාෂා, මානව හා සමාජ විද්‍යා පීඨය,<br>ජාතික අධ්‍යාපන ආයතනය.<br><br>යූ. නවරත්නම්<br>අධ්‍යක්ෂ ආගම්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| ලේඛක මණ්ඩලය | : | එම්. එච්. එම්. නාලිර්<br>එස්. එම්. ආර්. සූඩීන්<br>මව්ලවි එම්. එල්. එම්. යූසුෆ්<br>අෂ්ෂෙක් එම්. නවාස් සනූර්දීන්<br>අෂ්ෂෙක් යූ. කේ. රමීස්<br>අෂ්ෂෙක් එම්. ආර්. එම්. මිහ්ලාර්<br>අෂ්ෂෙක් එම්. එච්. එම්. බුහාරි<br>අෂ්ෂෙක් එම්. එච්. එම්. ෆස්ලූර් රහ්මාන් |
| සංස්කරණය | : | අෂ්ෂෙක් එම්. එච්. එම්. බුහාරි<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී (ඉස්ලාම්)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| පරිවර්තනය | : | එස්.ඒ.සී.එම්. කරාමත්<br>එම්. එෆ්. එම්. නල්රි<br>එම්. එච්. එම්. යාකූත් |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# විෂය නිර්දේශය

## 6 වන ශ්‍රේණිය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

විශ්වය, මිනිස් ජීවිතය හා මිනිසා පිළිබඳ ව පැහැදිලි ලෞකික දෘෂ්ටි කෝණයක් ඉස්ලාම් සතු ය. එය අල් කුර්ආනය හා සුන්නාහ් පදනම් කොට ගෙන අවබෝධ කරගත් හා පැහැදිලි ඉස්ලාමීය දැනුමක් සහ නිරවුල් චින්තනයක් ඇති මනා හික්මීමකින් යුක්ත ක්‍රියාශීලී මුස්ලිම් භක්තිකයකු බිහි කිරීම ඉස්ලාම් ඉගැන්වීමේ අරමුණ වේ. ඔහු රටට ප්‍රයෝජනවත් පුරවැසියෙකු වන අතරම මිනිස් සමාජයට වැඩදායී යහපත් මිනිසකු ලෙස කටයුතු කරනු ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 1.0 හැඳින්වීම

භෞතික කය හා අභෞතික සිත (ආත්මය) යන සංඝටක දෙකකින් සමන්විත අයෙකු ලෙස මිනිසා හැඳින්විය හැකි ය. එහෙයින් මිනිස් කය මෙන් ම මිනිස් සිත ද එකසේ පෝෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. මිනිස් කය හා සිත යන දෙක අතර සමතුලිතභාවය සුරකින ලෙස කටයුතු කිරීමෙන් මිනිස් පෞරුෂය වර්ධනය වේ. මෙය ඉස්ලාම් ධර්මයේ පැහැදිලි ස්ථාවරය වන්නේ ය.

එනිසා ආහාර, ඇඳුම් පැළඳුම්, නිවහන, සෞඛ්‍යය වැනි මිනිසාගේ බාහිර අවශ්‍යතා සපුරාලන අයුරින් ම, ඔහුගේ අධ්‍යාත්මික අවශ්‍යතා ද සපුරා ලිය යුතු ය. ඉස්ලාමීය ඉගැන්වීම් හා මග පෙන්වීම් සැකැසී ඇත්තේ මේ සඳහා ය.

එහෙත් වර්තමාන ලෝකයේ පවතින භෞතිකවාදී චින්තනයන්හි අසීමිත බලපෑම නිසා මිනිසාගේ අධ්‍යාත්මය නොසලකා හැර ඇත. මේ හේතුව නිසා මිනිසා සැබෑ ලෝකයේ දී ලබා ඇති අභිවෘද්ධිය හා ඔහු අත්පත් කර ඇති ජයග්‍රහණ මගින් මිනිසා බලාපොරොත්තු වන මානසික සතුට හෝ මානසික ජයග්‍රහණය ලැබෙන්නේ නැත.

එනිසා වර්තමාන මිනිසා ලෝක ඉතිහාසයේ කවර කලකවත් නොවිඳි අයුරින් කනස්සල්ලටත්, මානසික පීඩනයටත්, මානසික අසහනයටත් ගොදුරු වී සිටී. මිනිස් සමාජයේ ඇති අධ්‍යාත්මික ශූන්‍ය බව මෙම කණගාටුදායී තත්වයට හේතු වී ඇතැයි වර්තමාන ලෝකය අවබෝධ කර ගෙන සිටී. එහෙයින් අද ලොව පුරා සිටින විද්වතුන්, අධ්‍යාපනඥයන්, චින්තකයන් අධ්‍යාත්මික ගුණ වගාවේ වැදගත්කම අවධාරණය කෙරෙති. මෙම පසුබිම යටතේ අප රටේ ද පෞද්ගලික, පවුල් හා සමාජ ජීවිතය තුළ ආගමට වැදගත් තැනක් හිමි විය යුතුය යන මතය දැඩිව අවධාරණය කෙරේ. එහෙයින් අද අප පාසල්වල ආගමික විෂයයන් අනිවාර්ය කොට උගන්වනු ලැබේ. මෙමගින් දුර්වල වී යන ධාර්මික හා අධ්‍යාත්මික ගුණාංග ශක්තිමත් කිරීමේ ආගමික ක්‍රියාකාරකම් නව විෂය නිර්දේශය මගින් යෝජනා කර තිබේ.

ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින ලෝකයේ ඇති අභියෝග හමුවේ මිනිසාගේ ආගම හා බැඳුනු පෞරුෂ ගුණාංග නොපිරිහී පැවැතීමට නම්, ආගම ඉගැන්වීම සිත්ගන්නා සුලු අයුරින් සිදුවිය යුතු බව වටහා ගෙන ඇත. නව විෂයමාලා සංශෝධනයට ආගම විෂය ද ඇතුළත් වන්නේ මේ නිසා ය.

එහෙයින් ඉස්ලාම් ආගම ඉගැන්වීම තුළින් ද දැනුම, කුසලතා, ආකල්ප, ව්‍යවහාර යන සියල්ල වැඩි දියුණු කළ යුතු ය. මෙම සියල්ල ලබා ගත හැකි අයුරින් මෙම විෂය ඉගැන්වීම කළ යුතු යැයි බලාපොරොත්තු වේ.

පාසල් පද්ධතිය තුළ ඇති සියලුම විෂය නිර්දේශයන් ප්‍රතිසංස්කරණයට භාජනය කෙරේ. දිනෙන් දින සංවර්ධනය වෙමින් පවතින විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍ර හා දැඩිව බැඳී පවතින මිනිස් ජීවිතයට සාමය හා ශාන්තිය ඇති කරන ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි අයුරින් මෙම විෂය නිර්දේශය සකස් කෙරේ.

ඉස්ලාම් ස්ථිරසාරය. කාලයාගේ ඇවෑමෙන් නො වෙනස් වන්නේ ය. එහෙයින් ශිෂ්‍ය අවශ්‍යතා සපුරාලන අයුරින් සිත් ඇද ගන්නා අන්දමට ද නව ක්‍රමයකට ද සිතෙහි දැඩි ලෙස ධාරණය වන ලෙසට ද ඒවා පිළිපැදීම කෙරෙහි දැඩි බැඳීමක් ඇති වන ආකාරයට ද විෂය නිර්දේශය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. මේ අයුරින් ශ්‍රේණිවලට අදාළ නිපුණතා වර්ධනයට උචිත ඉගෙනුම් පසුබිමක් ඇතිවීම අපේක්ෂා කෙරේ.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

සිසු දරුදැරියන් සමඟ සෘජුව සම්බන්ධවන පිරිසක් වශයෙන් ගුරුවර ගුරුවරියන්ටත්, උක්ත යහපත් අරමුණු සාර්ථක කිරීම උදෙසා තම පූර්ණ සහයෝගය ලබා දෙන අතර, තම අදහස් හා යෝජනා ඉදිරිපත් කර ළමා පරපුර යහමඟ වෙත යොමු කිරීමට සහාය දක්වනු ඇතැයි අපගේ විශ්වාසයයි.

## 0.2 විෂයයේ අරමුණු

★ ඉස්ලාමය කෙරෙහි පූර්ණ විශ්වාසය හා එහි සිද්ධාන්ත පිළිබඳ දැනුමක්, එහි ක්‍රියා පිළිවෙළ පිළිබඳ පරිචයක් ඇති බාල පරපුරක් බිහි කිරීම.

★ කලිමාව, සලාතය, සව්මය, zසකාතය, හජ් වැනි මූලික ඉබාදතයන් හි දර්ශනය හා යහපත් දේ පිළිගෙන, අයහපත් දේ බැහැර කිරීමේ පදනමින් ජීවිතය පවත්වා ගැනීමේ අවශ්‍යතා වටහා ගෙන තම චර්යාවේ ඒවා යොදා ගැනීමේ පුහුණුව ලබා දීම.

★ එදිනෙදා ජීවිතයේ ඇති වන ගැටළු සුහදව විසඳා ගැනීමට ද අන්‍යයන් සමඟ ඇති විය හැකි ගැටුම් වැළකෙන අයුරින් සිය කටයුතු සාර්ථකව ඉටු කර ගැනීමට දැනුම ද පුහුණුව ද සිත් ගන්නා සුළු ස්වභාවය ද ඇති (මුස්ලිම්) පරම්පරාවක් බිහි කිරීම.

★ ඉස්ලාමීය පවුල් ජීවිතය පිළිබඳ අවබෝධය ලැබ පවුලේ සාමාජිකයන් වශයෙන් පවුලේ යුතුකම් වගකීම් වටහාගෙන ඒවා කෙරෙහි දායකත්වය ලබා දෙන පරපුරක් බිහි කිරීම.

★ ඉස්ලාමයේ මූලාශ්‍ර දැන ඒව අනුව ජීවත් වී අන්‍යයන්ට ආදර්ශවත් පුද්ගලයන් ද සමාජයක් ද බිහි කිරීම.

★ ඉස්ලාම් මෙලොව බිහි වූ දා සිට එහි ක්‍රමවත් වර්ධන අවධිවල විවිධ ක්ෂේත්‍රයන්හි දායකත්වය හා කුසලතාවලින් හෙබි සිසු පරපුරක් බිහි කිරීම.

★ විවේක කාලය නිසි ලෙස යොදා ගනිමින්, ඉපැයීමේ දී අවංකභාවය පවත්වමින් ඉස්ලාමීය පදනමින් මෙහෙයවන නායකත්ව ගුණාංග ඇති සිසුන් බිහි කිරීම.

★ මරණය තෙක් අධ්‍යාපනය ලබාගත යුතුය යන ඉස්ලාමීය සිද්ධාන්තය වටහාගෙන ඉගෙනුම අඛණ්ඩ ව ලබාගන්නා කාලීන සිද්ධීන් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨිකෝණය වටහා ගත් පරම්පරාවක් බිහි කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 6.3 පන්තියට අදාළ නිපුණතා

1. ඊමාන්හි කරුණු හය විශ්වාස කොට අනුගමනය කරයි.
2. මූලික ඉබාදතයන් හා එය හා සම්බන්ධ කරුණු දැන අනුගමනය කරයි.
3. එදිනෙදා ජීවිතයේ දී පිළිපැදිය යුතු සාරධර්ම අනුගමනය කරයි.
4. පවුලේ සාමාජිකයන්ට ගෞරවයෙන් සලකයි.
5. එදිනෙදා ජීවිතයේ දී අනවශ්‍ය වියදම් වැළැක්වීමේ පිළිවෙත තමා ද ඉගෙන අන්‍යයන්ට උදව් කිරීමට ද ඉදිරිපත් වෙයි.
6. ෂරි අත්හි මූලාශ්‍රයන් නිවැරදි ව වටහාගෙන ඒවා පිළිපදී.
7. නබි (සල්) තුමාගේ සීරාහි ඇතුළත් වන වැදගත් සිද්ධීන් වටහාගෙන එතුමන්ගේ ඉගැන්වීම පරමාදර්ශ ලෙස සලකා පිළිපදියි.
8. භෞතික පරිසරය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය වටහා ගෙන හැසිරෙයි.

## 6.4 ඉස්ලාම් විෂය නිර්දේශය

| නිපුණතා | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලය |
|---|---|---|---|
| 1.0 | ඊමාන් හි කරුණු හය විශ්වාස කර පිළිපදියි. | | 10 |
| | 1.1 ඊමාන් කිරීමේ අවශ්‍යතාව දැන ඊමාන් කරයි. | ★ මැවීම්වල සූක්ෂම බව දෙස බලා රක්ෂිතයා විශ්වාස කිරීම.<br>★ ආමන්තුබිල්ලාහ් යන වැකිය | |
| | 1.2 අල්ලාහ් ගැන විශ්වාස කර අනුගමනය කරයි. | ★ අල්ලාහ් ඒකයා බව සනාථ කිරීම.<br>★ අල්කුර්ආන් 2:285 | |
| | 1.3 අල්ලාහ්ගේ මලාඉකාවරු පිළිබඳ විශ්වාස කර අනුගමනය කරයි | ★ මලක්වරුන්ගේ නම්<br>★ කාර්යයන්<br>★ ඔවුන් කෙරෙහි විශ්වාස තැබීම නිසා සිදුවන දේ | |
| | 1.4 අල්ලාහ් විසින් පහළ කළ ආගම් විශ්වාස කර පිළිපදියි. | ★ අල්කුර්ආන් 4:36<br>★ ආගම් හතර | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතා, නිපුණතා මට්ටම් විෂය අන්තර්ගතය | කාලය |
|---|---|

1.5 අල්ලාහ්ගේ රසූල්, නබිවරුන් (වක්තෘ) පිළිබඳ දැන අනුගමනය කරයි.
- ★ රසුල් නබි යන වචනවල වෙනස දැනගැනීම
- ★ සෑම නබිවරුන්ම විශ්වාස කිරීම.
- ★ නබි මුහම්මුද් (සල්) තුමා අවසන් වක්තෘ ලෙස දැනගැනීම

1.6 කියාමා දිනයේ සිදුවීම් පිළිබඳ දැන ක්‍රියා කරයි.
- ★ මරණයෙන් පසු ජීවිතයක් ඇති බව දැන ගැනීම
- ★ විශ්වාස කොට සදහම් ක්‍රියාවල යෙදීම
- ★ කියාම ජීවිතයට සූදානම් වීම.

1.7 සියල්ල සිදුවනුයේ අල්ලාහ්ගේ කැමැත්ත පරිදි බව විශ්වාස කටයුතු කරයි.
- ★ අල් කුර්ආන් 57:21:22
- ★ හොඳ හෝ නරක සිදුවන්නේ අල්ලාහ්ගේ කැමැත්ත පරිදි ය
- ★ සියළුම සිද්ධීන් තෘප්තිමත් ව පිළිගැනීම

2.0 මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටුකිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කර ගෙන ඉටු කරයි. 15

2.1 අර්කානුල් ඉස්ලාම් පිළිබඳ දැන අනුගමනය කරයි.
- ★ අර්කානුල් ඉස්ලාම් පිළිබඳ සාමාන්‍ය පහදා දීම

2.2 කලිමා පහ ඉගෙන ගෙන ඒ අනුව තව්හීදය පිළිගෙන ක්‍රියා කරයි.
- ★ කලිමා පහ පදනමින් තව්හීද්

2.3 පිරිසිදුකම ගැන දැන අනුගමනය කරයි.
- ★ අත්තහාරත්

2.4 නජීස් හි විස්තර දැන නජීස් වලින් වැළකී සිටියි
- ★ නජීස් වර්ග

2.5 වුලුඋහි නීතිරීති තේරුම් ගෙන වුලූඋ කරයි.
- ★ වුලුඋහි නීතිරීති

2.6 සලාතයේ වැදගත්කම තේරුම් ගෙන සලාතය ඉටු කරයි.
- ★ සලාතයේ වැදගත්කම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතා, නිපුණතා මට්ටම් විෂය අන්තර්ගතය කාලය

2.7 අzදානය හා දුආ දැන ක්‍රියාත්මක කරයි.
★ අදාන් හා දුආ

2.8 සලාතයේ ෂර්ත් ෆර්ල් මුබ්තිලාත් දැන සලාතය ඉටු කරයි.
★ සලාතයේ වැදගත්කම

2.9 සලාතයේ උසුරුම් කට පාඩම් කර සලාතයේ දී උසුරයි.
★ සලාතයේ උසුරුම්

2.10 අස්සව්ම් ගැන දැන සව්මය ඉටු කරයි.
★ අස්සව්ම් ගැන හඳුන්වා දීම

2.11 zසකාත් ගැන දැන එහි ක්‍රියාකාරකම් ගැන නිරීක්ෂණ සටහන් ලියයි
★ zසකාත් හැඳින්වීම

2.12 අල්හජ් ගැන දැන හජ් ඉටු කිරීම සඳහා ඉතිරි කරයි.
★ අල් හජ් හඳුන්වා දීම

3.0 එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කළ යුතු සදාචාරාත්මක ගුණ ධර්ම පිළිපදියි 12

3.1 උදෑසන කාරියන් නිසි පරිදි ඉටු කරයි.
★ උදෑසන කාර්යයන් ඉටු කිරීමේ වත් පිළිවෙත්

3.2 ආහාර ගැනීමේ දී හා ඇඳුම් ඇඳීමේ දී ඉස්ලාමීය පිළිවෙත් අනුගමනය කරයි.

3.3 සභා පිළිවෙත් අනුගමනය කර ආචාර සමාචාර කරයි.
★ සභා පිළිවෙත්

3.4 ගමන්බිමන් යෑමේ පිළිවෙත් අනුගමනය කරයි.
★ ගමන්බිමන් යෑමේ පිළිවෙත්

3.5 ගුරුවරුන්ට ගෞරව කිරීමේ අවශ්‍යතාව වටහාගෙන මුළු සිතින් ම ගෞරව දක්වයි.
★ ගුරුවරුන් උතුම් අය වෙති.
★ ඔවුන්ට ගරු සරු කිරීම යුතුකම වේ.
★ ඔවුන් වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කළ යුතුය

3.6 සියළු සතුන් කෙරෙහි කරුණාව දක්වයි.
★ මැවුම් සියල්ල අල්ලාහ් ගේ පවුල වේ.
★ මැවුම් කෙරේ කරුණාව දැක්වීම ස්වර්ගයට මාර්ගය වන්නේ ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතා, නිපුණතා මට්ටම් විෂය අන්තර්ගතය | කාලය |
|---|---|
| 4.0 පවුලේ සාමාජිකයන්ට ගරු කරමින් කටයුතු කරයි | 06 |

4.1 වැඩිහිටියන්ට ගෞරවය දක්වමින් හා
බාලයින්ට සෙනෙහස දක්වමින් කටයුතු කරයි.
★ දෙමාපියන්ට සැලකීම
★ වැඩිහිටියන්ට සැලකීම
★ සහෝදර සෙනෙහස

5.0 එදිනෙදා ජීවිතයේ දී අනවශ්‍ය වියදම් වළක්වා ගැනීමට
සුදුසු පියවර ඉගෙන ගන්නා අතර අන් අයට උදව් කිරීමට ද,
ඉදිරිපත් වෙයි.

5.1 සියළු කාර්යවලදී ම හලාල් හරාම් පිළිපදියි.

5.2 සකසුරුවම්කමින් ජීවත් වී, ඉතිරි කර අන්‍යයන්ට දන් පින් ද කරයි.
★ අන්‍යයන්ට උදව් උපකාර කිරීම
★ ඉතිරි කිරීම

6.0 ෂරිආහ් මූලාශ්‍ර නිවැරැදිව වටහා ගෙන ඒවා ඉගෙන
අනුගමනය කරයි.

6.1 අල් කුර්ආනය ප්‍රථම මූලාශ්‍රය බව තේරුම් ගෙන ක්‍රියා කරයි.
★ අල් කුර්ආන් - හැඳින්වීම
★ එය පහළ කරනු ලැබූ ආකාරය
★ අවසාන ආගම බව

6.2 දෙවන මූලාශ්‍රය සුන්නා බව තේරුම් ගෙන කටයුතු කරයි.
★ සුන්නා හැඳින්වීම

6.3 ප්‍රථම මූලාශ්‍රයේ සූරා කීපයක් උසුරා පෙන්වයි.
★ සූරාහ් ඉක්ලාස්
★ සූරාහ් ෆලක්
★ සූරාහ් අන්නාස්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතා, නිපුණතා මට්ටම් විෂය අන්තර්ගතය | කාලය |
|---|---|

7.0 නබි (සල්) තුමාගේ සීරාවේ සිදුවන ප්‍රධාන සිද්ධීන් වටහා ගෙන ඉන් ලැබෙන ඉගැන්වීම් පූර්වාදර්ශ ලෙස ගෙන කටයුතු කරයි.

7.1 නබි (සල්) තුමාගේ තරුණ අවධිය පූර්වාදර්ශ ලෙස අනුගමනය කරයි.

★ නබි (සල්) තුමාගේ උප්පත්තිය හා තරුණ අවධිය

7.2 නබි (සල්) තුමාට නුබුව්වතය ලැබුණු පසුබිම වටහාගෙන නුබුව්වතය විශ්වාස කොට අනුගමනය කරයි.

★ නුබුව්වතය ලැබූ පසුබිම

7.3 මිහ්රාජ් දැන විශ්වාස කර එහි දී ලැබුණු ත්‍යාගය වන සලාතය ඉටු කරයි.

★ නබි සල් තුමාගේ මිහ්රාජ් ගමන

7.4 හිජ්රතය වටහාගෙන ඉස්ලාමය වෙනුවෙන් කැපකිරීම් කර ජීවත් වෙයි.

★ හිජ්රතුන් නබි

7.5 සහාබාවරු කවුරුන් දැයි තේරුම් ගෙන ඔවුන් කළ පරිත්‍යාගයන් හඳුනා ගනී. ඒවා තම ජීවිතයේ දී අනුගමනය කරයි.

★ සහාබාවරුන් හැඳින්වීම

★ සහාබාවරුන්ගේ පරිත්‍යාගයන්

8.0 භෞතික පරිසරය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය වටහාගෙන ක්‍රියා කරයි.

8.1 භෞතික පරිසරයේ ඇති සියල්ල අල්ලාහ්ගේ දායාද බව දැන කෘතඥතාව දක්වයි. ඒවා සුරකියි.

★ භෞතික පරිසරය අල්ලාහ්ගේ දායාදයකි.

★ එය සුරැකීම යුතුකම වේ.

★ පොදු දේපළ සුරැකීම අවශ්‍ය ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ඉගැන්වීම සඳහා යෝජිත කාලපරිච්ඡේද

| | නිපුණතා | කාලච්ඡේද |
|---|---|---|
| 01. | 1.0 | 10 |
| 02 | 2.0 | 15 |
| 03. | 3.0 | 12 |
| 04. | 4.0 | 06 |
| 05. | 5.0 | 06 |
| 06. | 6.0 | 05 |
| 07. | 7.0 | 10 |
| 08. | 8.0 | 06 |
| | මුළු කාලපරිච්ඡේද | 70 |

## 6.5 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ඉගෙනුම් ක්‍රියාවලියේ දී බලාපොරොත්තු වන සිසුන්ගේ සාධන මට්ටම රැඳී ඇත්තේ ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මත ය. ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය තීරණය කරන අවස්ථාවේ දී නිර්මාණවේදී (Constructivism)ඇති වූ 5E ආකෘතිය ඉතා වැදගත් අංගයකි. නව අදහස් හා කරුණු පිළිබඳ ව ස්වයංව වටහා ගැනීමේ හැකියාව ගොඩනැගීම මෙහි ප්‍රධාන පදනම වේ.

සිසුන්ගේ නිර්මාණ හැකියා, සංකල්පන හැකියා, සන්නිවේදන හැකියා වර්ධනය කළ හැකි ඉගෙනුම් ක්‍රමයක් ලෙස මෙය වැදගත්වේ. විශේෂයෙන් ම සිසුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප හේතුවෙන් සිසුන්ගේ චර්යාවල ඇතිවන පැහැදිලි වූ ද ස්ථිර වූ ද වෙනස්කම් ඉලක්ක කොට ගෙන නිපුණතා සකස් කර ඇත. ආගම විෂය සම්බන්ධයෙන් සලකන විට සිසුන්ගේ මොළය දැනුමෙන් පෝෂණය කොට දෑතේ කුසලතාවයන් වර්ධනය කිරීම ප්‍රමාණවත් නැත. ආගමික විෂය තුළින් මූලික වශයෙන් බලාපොරොත්තු වන්නේ චර්යාවල ඇතිවන වෙනසයි. නිපුණතා කේන්ද්‍ර කොටගත් ඉගෙනුම් ඉගැන්වීම් උපාය මාර්ග මෙය ඇති කිරීමට සුදුසු එක් පහසු ක්‍රියාමාර්ගයකි.

නිපුණතා කේන්ද්‍රික අධ්‍යාපනය ගුරු භූමිකාවේ පැහැදිලි වෙනසක් බලාපොරොත්තු වේ. තමා ලබා ඇති දැනුම ඒ ආකාරයෙන් ම සිසුන්ට පවරා දීමේ සම්ප්‍රේෂණ භූමිකාවේ දී ගුරුවරයාගේ ක්‍රියාකාරිත්වය, ආධිපත්‍යමය ස්වභාවය වෙනස් කළ යුත්තකි. නිපුණතා පාදක ඉගෙනීමේ දී ශිෂ්‍යයන් නියුක්ත වීම ඉතා අධිකව දක්නට ලැබේ. විෂයමාලාව තුළින් සිසුන් ළඟා විය යුතුයැයි බලාපොරොත්තු වන අවම මට්ටම තෙක් හෝ ශිෂ්‍යයාට උදව් කිරීම ගුරුවරයාගේ වගකීම වන්නේ ය. සිසුන්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිවැරැදි ව හඳුනා ගෙන ඉගෙනුමට අවශ්‍ය විධිමත් උපකරණ මගින් ඔවුන්ගේ සාධන මට්ටම ළඟාවීමට මග සෙවීම ගුරුවරයාගේ යුතුකම වන්නේ ය.

පාඩම ආරම්භයේදීම, ශිෂ්‍යයා ආකර්ශණය කර උනන්දුවෙන් හා ආශාවෙන් බලාපොරොත්තු වන ස්වභාවය ඔහු තුළ ඇති කළ යුතු ය. මෙහි වර්ධනය කර ගත යුතු මූලික නිපුණතා සම්බන්ධ පෙර දැනුම මතක් කළ යුතු ය. මේ සඳහා විවිධ උපක්‍රම යොදාගත හැකිය. ප්‍රශ්න ඉදිරිපත් කිරීම, රූප සටහන් ප්‍රදර්ශනය කිරීම, පුවත්පත් වාර්තා, ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම, කාඩ්පත් ප්‍රදර්ශනය කිරීම, කවි, කතා, ප්‍රහේලිකා, රඟ දැක්වීම, රංගනය, හඬ පටි දෘශ්‍ය පටි ආදර්ශ වැනි විවිධ ප්‍රයෝග යොදා ගත හැකිය.

නිදසුන් ලෙස හයවන ශ්‍රේණියේ දී පොදු දේපළ සුරැකීම යන මාතෘකාව සිසුන් ඉගෙන ගැනීම සඳහා අනිසි ලෙස පරිහරණය කළ දේපළ දක්වන රූප සටහන් පන්තියේ දී ගුරුවරයා ඉදිරිපත් කරයි. ඒවා පිළිබඳ හැඳින්වීමක් සංවේගයෙන් යුක්තව ගුරුවරයා පන්තියට ඉදිරිපත් කරයි. ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම සහ, රූපසටහන් සිසුන් කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරන්නේ ය. පොදු දේපළ අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ ව සිසුන් කලකිරීමෙන් සාකච්ඡා කරනවා විය හැක. පොදු දේපළ සුරැකිය යුතුය යන්න සිතට එකඟව පිළිගන්නා සිසුන් ඊළඟ පියවර සැලසුම් කරනවා විය හැක.

මෙය ද කණ්ඩායම් ක්‍රියාවක් ලෙස පැවරුවේ නම්, ප්‍රයෝජනවත් යෝජනා රැසක් ඉදිරිපත් වන්නට ඉඩ තිබුණි. අප බලාපොරොත්තු වන්නේ මෙවැනි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය වන්නේය.

ඉස්ලාම්, ජීවත්වීම උදෙසා වූ විෂයයකි. එහි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී චර්යා වෙනස ඉතා වැදගත් වන බව ඔබ එකහෙළා පිළිගනු ඇත. චර්යා වෙනස ඇති කිරීමේ ලා ගුරු භූමිකාව වැදගත් තැනක් ගනී. අදාළ ඒකකය ගුරුවරයා හසුරුවන ආකාරය, සිසුන් කෙරේ ඇති කරන බලපෑම යන දෙක චර්යා වෙනස කෙරේ බලපාන ඒවා ය.

එහෙයින් ගුරුවරයා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුකිරීම සඳහා විවෘත මනසකින් හා අවශ්‍ය පමණ සැලසුම් සහිතව ද පැමිණිය යුතුය යන්න නැවත නැවතත් සඳහන් කළ යුත්තක් නොවේ. මෙහි දී ඉදිරිපත් කර ඇත්තේ ආදර්ශ කිහිපයක් පමණි. තම අභිමතය පරිදි ආදර්ශ වෙනස් කර ගැනීමේ නිදහස ගුරුවරයාට ඇත.

## 6.6 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන

අප රටේ විෂයමාලාව විභාග ඉලක්ක කොට ගත්තා වූ ද ශාස්ත්‍රීය අධ්‍යාපනයට මූලිකත්වය ලබා දෙන්නා වූ ද ප්‍රවණතාවක් සහිත වූ නිසා දරුවන්ගේ කුසලතා, ආකල්ප හා සිරිත් විරිත්, චර්යා වර්ධනය නිසි ලෙස සිදු නොවන තත්වයක් දක්නට ලැබේ. මෙම තත්වයට පිළියම් යෙදීමට සුදුසු වාතාවරණයක් ඇතිවන සේ පාසල් පද්ධතිය හා පාසල් ප්‍රතිපත්තිය සකස් විය යුතු ය.

ඉස්ලාම් විෂය තුළින් නව නිර්මාණාත්මක චින්තනය කරා යොමු කරවනු ලබන සිසුන්ගේ කුසලතා හා ආකල්ප සංවර්ධනය කර ගැනීමට අත්වැලක් ලෙස පාසල් මට්ටමේ දී සංවිධානය කරනු

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ලබන විවිධ පාසල් ක්‍රියාකාරකම් යොදාගැනීම වඩාත් සුදුසු ය. එහෙයින් නව විෂයමාලාව පාසලේ දී ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් පියවර සුදුසු වනු ඇත ;

- ආගමික හා සංස්කෘතික අගයයන් සංවර්ධනය කිරීමට යොමු වන සංවිධාන පාසල තුළ ක්‍රියාත්මක කිරීම.
- මද්රසා, ජාමිආ ආදිය නැරැඹීම සඳහා අධ්‍යාපන චාරිකාවල සිසුන් සහභාගි කරවීම.
- පාසලට අවශ්‍ය ඉස්ලාමීය චාරිත්‍ර සිසුන් විසින් ම සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් ඇති කර ක්‍රියාත්මක කිරීම.
- නව නිර්මාණ, ව්‍යාපෘති ඇතුළත් තරග, වැනි ඒවා සංවිධානය කිරීම.
- නව නිර්මාණ ඉදිරිපත් කළ සිසුන් හා ඔවුන්ට උදව් කළ අය කැඳවා කාර්ය සැසි පැවැත්වීම හා ඔවුන්ගේ සේවාවන් පාසලට ලබා දීම.

මෙම කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා විදුහල්පති ඇතුළු ගුරු මණ්ඩලයේ ද ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ද උද්යෝගිමත් සහභාගීත්වය අත්‍යවශ්‍ය ය.

මෙම විෂයය පාසලේ ක්‍රියාත්මක කිරීම සඳහා කැපවීමෙන් ක්‍රියා කරන ගුරුභවතුන්ට අවශ්‍ය පහසුකම් සැලැස්වීමට විදුහල්පතිවරු නොපසුබට විය යුතුය. මෙම ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සඳහා පාරම්පරික වූ පාසල් ප්‍රතිපත්තිවලින් තරමක් දුරට බැහැර වී පාසල සඳහා සුවිශේෂ වූ ප්‍රතිපත්ති මාලාවක් සකස් කර ගත යුතුය. එවැනි ප්‍රතිපත්ති සාර්ථක කර ගැනීම සඳහා පාසල හා සම්බන්ධ අවම, සමාජයේ සහභාගීත්වය සම්පත් පුද්ගලයන් හා අනෙකුත් ආයතනවල දැනුම ද ලබා ගත යුතුය.

තවද ක්‍රියාකාරකම් සාර්ථක ව ඉදිරියට ගෙන යෑම සඳහා සුදුසුකම් ඇති, අදාළ ව ලබාගත් පුහුණු වූ ගුරුවරු යොදා ගැනීම ද ඵලදායී කාල කළමනාකරණයක් ද ඉතා වැදගත් ය. තවද ඉස්ලාම් විෂය සඳහා වෙන් කරන ලද කාලපරිච්ඡේද දෙක ද්විත්ව කාල පරිච්ඡේදය ලෙස සකස් කිරීම මනාය. තවද මේ විෂයය සඳහා ගුරුවරු තේරීමේ දී, පහත සඳහන් නිර්ණායක කෙරෙහි අවධානය යොමු කිරීම ප්‍රයෝජනවත් වෙනු ඇත.

- ඉස්ලාම් විෂයය සඳහා පුහුණුව ලබා ඇති ගුරුභවතුන්
- මෞලවි/අෂ්ෂෙයික් සහතික පත්‍ර දත් ගුරුභවතුන්
- උපාධිය සඳහා විෂයයක් ලෙස හදාරා ඇති ගුරුභවතුන්

පාසල්වල මෙම විෂය නිර්දේශය ඉහත සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීමෙන් ඉස්ලාමීය දැනුම, පැහැදිලි චින්තනය, මනා හික්මීම තුළින් පරමාර්ථය සාර්ථක වනු ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 6.7 තක්සේරුකරණය හා ඇගයීම

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ශිෂ්‍යයා ලැබිය යුතු නිපුණතා කෙතෙක් දුරට ලබාගෙන සිටී ද යන්න දැන ගැනීමේ සරල ක්‍රමය ලෙස තක්සේරුකරණය හා ඇගයීම සැලකිය හැකිය. ඉස්ලාම් විෂය අන්තර්ගතය තුළින් ශිෂ්‍යයාගේ චර්යා ලක්ෂණ, නැමදුම් වත් පිළිවෙත් කෙරෙහි ඔහුගේ උනන්දුව වැනි කරුණු තක්සේරු කළ යුතු යැයි බලාපොරොත්තු වේ. මෙය පන්ති කාමරය තුළ හා පන්ති කාමරයෙන් පරිබාහිර ව විධිමත් ව හා අවිධිමත් ව අදාළ නිපුණතාවය කරා ශිෂ්‍යයා ළඟා වී සිටී දැයි දැන ගැනීම සඳහා කළ යුත්තකි.

විෂය සම්බන්ධ ඇගයීම විෂය ඒකකයේ ඉගැනුම්- ඉගැන්වීම අවසන් වූ පසුව ද මාසයේ, වාරයේ හෝ වර්ෂ අවසානයේ වාචික ප්‍රශ්න මගින් හෝ ලිඛිත ප්‍රශ්න මගින් හෝ වැඩසටහන් මගින් හෝ සිදු කළ හැකි ය.

මෙය හැර සූරාහ්, අත්කාර්, හදීස්, දුආ ආදියෙහි අක්ෂර නිවැරදිව උච්චාරණය කෙරේ ද? අදාළ වේලාවල දී භාවිතා කරනු ලැබේ ද? නිවැරැදි ව කටපාඩම් කර තිබේ ද? යනාදිය පරීක්ෂා කළ යුතු ඒවා ය. මේ සඳහා ආදර්ශ ඇගයීම් උපකරණ සකස් කිරීමට අවශ්‍ය අත්දැකීම් ගුරුවරු ලබා ගත යුතුය. එහෙයින් තක්සේරුකරණයේ දී අරාබි අක්ෂරවල උච්චාරණය, දීර්ඝ කිරීම්, කටපාඩම් කර තිබීම වැනි ඒවා නිරීක්ෂණය කළ යුතුය.

භෞතික පරිසරය, ගමන් සංවිධානය, සතුන් කෙරෙහි කරුණාව දැක්වීම ආදී ඒකක තුන, කෙටි කාලීන චාරිකා තුළින් තක්සේරු කළ හැකිය. කොළඹ සිට කෑගල්ලට ගමනේ යන අය ගමන් සංවිධාන පිළිපදින අතර, භෞතික පරිසරයේ දක්නට ලැබෙන කඳු බෑවුම්, රබර් වතු, ගංගා, දිය ඇලි, ගහ කොළ ආදියේ වෙනස්කම් අල්ලාහ්ගේ දායාද ලෙස හඳුනා ගත හැකිය. පියාඹා යන කෘමීන්, සතුන් හා පක්ෂීන් සම්බන්ධ සිසුන්ගේ හැසිරීම නිරීක්ෂණය කළ හැකිය. තමා දුටු දායාදයන් හා ජීවීන් සටහන් කර ගැනීමට සලස්වා, ආපසු ගමනේ දී වාහනයේ දී හෝ පන්තියේ සිටිමින් දෙන තොරතුරු අනුව තක්සේරුව කළ හැකි ය.

සකසුරුවම හා ඉතිරි කිරීම යන ඒකක අදාළ කාලයේ දී (මසකට හෝ තුන් මසකට වරක්) ස්වයං ඇගයීම් පත්‍රිකාවක් ලබා දීමෙන් ඉටු කළ හැකිය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ක්‍රියාකාරකම් සන්තතිය

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකි වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව (TRANSMISSION ROLE) හා පසු කාලීන ව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (TRANSACTION ROLE) වර්තමාන පන්තිකාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අඩු දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත්, එය සිදුවිය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් අන්දමින් දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමග ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතර ව සිසු - සිසු අන්තර් ක්‍රියා ද පසු ව ඇති වීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරලේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවයට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ (RESOURCE PERSON) තත්ත්වයට ගුරුවරයා පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්තිකාමරයෙන් බැහැරට ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව (TRANFORMATION ROLE) ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි මේ සෑම ක්‍රියාකාරකමක් ම සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

පළමු වන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (ENGAGEMENT STEP) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග දෙබසකට මුල පුරයි. පසු ව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන්, සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතු ව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම/පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් (FLASH CARDS) වැනි උත්තේජක යොදා ගැනීම/ ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය/දෙබස්, භූමිකා රංගන, කවි, ගීත, ආදර්ශන (DEMONSTRATIONS) වැනි එකක් සෘජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ක්‍රියාකාරකම්වල පළමු පියවර ක්‍රියාත්මක වේ. ඒවා ,

- පන්තියේ අවධානය දිනා ගැනීම.
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුනට අවස්ථාව ලබාදීම.
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දීම.

ආදිය වේ.

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (EXPLORATION) සඳහා සිසුනට අවස්ථාව ලබා දීමට ය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කර ගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතු ව කණ්ඩායම සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරතවීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදව් වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුනට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර, සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුනු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමි වේ.

ක්‍රියාකාරකමේ 3 වන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම සඳහා සිසුන් දිරිමත් කිරීමයි. සෑම සාමාජිකයකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායක ය. සිසු අනාවරණ පැහැදිලි කිරීම (EXPLANATION)

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්තිකාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීම ය.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දී සොයාගැනීම වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (ELABORATION) සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබා දීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය බාර වන්නේ ගුරුවරයාට ය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේත්, සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරැදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක ව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලීම මෙම ක්‍රමවේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුව හා ඇගයීම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබා ගැනීමට සැලසුම්ගත ක්‍රියාකාරකම් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ දෙවන පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් (ASSESS-MENT) ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම් හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් (EVALUATION) ගුරුවරයාට ඉඩ ලැබේ. තක්සේරුව හා ඇගයීම පිළිබඳ විස්තරාත්මක විමසුමක් මෙම ලේඛනය යටතේ මතු දැක්වේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරීමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් වන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ගුණාත්මක යෙදවුම්

- රූප (මක්කම, මදීනාව)
- පෝස්ටර් (වැසිකිළි, කැසිකිළි පිරිසිදුකම)
- කතන්දර
- පාඨ ලියූ කාඩ්පත් (අත්තහියියාත් වැනි)
- අත් පත්‍රිකා
- පුවත් පත් උපුටන
- කැසට් යන්ත්‍ර
- කැසට් පටි/හඬ පටි/හඬ තැටි
- කුඩා සුරා පටිගත කළ කැසට් පටි
- ෆෙල්ට් පෑන්
- ඩිමයි කඩදාසි
- බ්‍රිස්ටල් බෝඩ්
- සුදු ලියන කඩදාසි
- බේසම් - ලීටර 216 කට වැඩි
- මාලිමාව
- මුසල්ලා
- මුස්හෆ්
- තර්ජුමතුල් කුර්ආන්
- නාට්‍ය පිටපත්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | : | ඊමාන් හි කරුණු හය විශ්වාස කර පිළිපදියි. |
| නිපුණතා මට්ටම 1.1 | : | ඊමාන් කිරීමේ අවශ්‍යතාව දැන ඊමාන් කරයි. |
| ක්‍රියාකාරකම 1.1 | : | ඊමාන් කිරීමේ අවශ්‍යතාව දැන ජීවත් වෙමු |
| කාලය | : | විනාඩි |
| ගුණාත්මක යෙදවුම් | : | ● ඇමුණුම 1.1.1 හි සඳහන් වන තොරතුරු ගොනුව<br>● ඇමුණුම 1.1.2 හි සඳහන් ගවේෂණ පත්‍රිකාව<br>● ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් කණ්ඩායමට එක බැගින් |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.1 :

★ තොරතුරු ගොනු අංක 1.1.1 හි ඇති කතන්දරය සිසුන්ට කියා දෙන්න.

★ පියවි ඇසින් දැකිය නොහැකි සමහර දේවල් ගැන විමසන්න.
(උදා : විදුලිය, වාතය)

අපි ඒවා ඇතැයි පිළිගන්නේ කෙසේ දැයි සාකච්ඡා කරන්න.

★ ඊමාන් හා සම්බන්ධ වූ සිසුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- අල්ලාහ් සිටින බව
- අල්ලාහ් ඒකයකු වන බව
- අල්ලාහ් පූර්වාදර්ශයෙන් තොරව මැවීම් කරන බව.
- අල්ලාහ් නැති දෙයින් මැවීම් කරන බව
- සියල්ලන්ගේ ම නැමදුමට පාත්‍රවන්නා අල්ලාහ් බව

පියවර 1.1.2 :

★ පන්තිය කණ්ඩායම්වලට බෙදන්න. කණ්ඩායම්වලට ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න. (ඇමුණුම 1.1.1)

★ ඩිමයි කඩදාසි සහ ෆෙල්ට් පෑන් යනාදිය කණ්ඩායමකට එක බැගින් සපයන්න.

★ සාකච්ඡා කර තීරණවලට එළඹීමට සිසුන් මෙහෙයවන්න.

★ සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කරන්න.

★ මුළු පන්තියටම තම කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දන්වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 1.1.3 : ★ එක් එක් කණ්ඩායමට තම වාර්තාඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

★ පළමුව වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

★ පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- අල්ලාහ් යන්න සංකල්පනාවක් නොවන බව
- සැබැවින් ම අල්ලාහ් සිටින බව
- සූරාහ් ඉක්ලාස් නිදර්ශණය ලෙස දැක්වීමෙන් අල්ලාහ් ඒකයෙකු බව
- අල් කුර්ආනයේ 2:29, 2:117 යන ආයත නිදර්ශණ ලෙස දක්වමින් ඔහුම මැවුම්කරුවා බව
- අල් කුර්ආනයේ 11:123 ආයත නිදර්ශණය වශයෙන් දැක්වීමෙන් ඔහුම නාථයා වන බව
- අල්ලාහ් විශ්වාස කිරීම ඔහුට අවනත වීම ඕනෑම දෙයක් ඔහුගෙන්ම බලාපොරොත්තු වීම යන කරුණු අනුගමනය කළ යුතු බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- තම අවශ්‍යතා ඉටු කර දෙන්නා අල්ලාහ් බව පිළිගෙන ඒවා ඉටු කර දෙන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටී.
- අල්ලාහ් ඒකයකු බවට මූලාශ්‍ර ඉදිරිපත් කරයි.
- අල්ලාහ්ගේ මැවුම් නිරීක්ෂණ කරමින් ඔහුගේ බල පරාක්‍රමය පිළිගනී.
- අල්ලාහ් නැමදිමින්, ඔහුට අවනත ව කටයුතු කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 1.1.1

## තොරතුරු ගොනුව

*මෙම සිද්ධිය සිසුන්ට කියන්න.*

ඇසෙන් දැකිය නොහැකි කිසිවක් මට පිළිගත නොහැකියයි කියමින් තරුණයකු ඇවිදිමින් සිටියේ ය. අතරමග දී පය පැටලී ඔහු බිම ඇද වැටුණේය. ආඃ රිදෙනවා. රිදෙනවා යැයි කෑ මොර ගසමින් අඬන්නට විය.

එතැනට පැමිණි වැඩිහිටියෙකු ඔහුගෙන් සිද්ධ වූ දෙය විමසීය. "ඔබ අඬන්නේ ඇයි ?" වැඩිහිටියා ඇසීය. "ඉවසන්න බැරි තරම් වේදනාවයි..." තරුණයා කීය.

"කෝ ? කොතනද ?"වැඩිහිටියා විමසීය.

"මේ. මෙතනයි." තරුණයා තුවාලය පෙන්වීය.

"ඔබ පෙන්වන්නේ තුවාලය නේ ද? කෝ වේදනාව ?" වැඩිහිටියා විමසීය.

"කතා නොකර යන්න. වේදනාව පෙන්වන්නේ කෙසේ ද ? පෙන්විය හැක්කේ තුවාලයයි." තරුණයා නොඉවසිල්ලෙන් කෑ ගැසීය.

"එහෙනම් ඔබට වේදනාව නෑ නේ ද ? ටිකකට පෙර ඔබ නේ ද කීවේ දැකිය නොහැකි දේ පිළිගැනීමට බැරිය කියා. වේදනාව බලාගන්නත් බෑ. එහෙම නම් වේදනාව තිබෙනවා යැයි පිළිගන්නේ කෙසේ ද ? ඔබේ කීම වැරැදියි කියා ඔබට තේරෙනවා නේ ද?" යැයි වැඩිහිටියා ඇසීය.

"අපට දැකිය නොහැකි වුවත් වෙනත් ක්‍රමවලින් දැන ගත හැකි ඒවා තිබෙන බව ඔබ පිළිගන්නවා දැ"යි වැඩිහිටියා ඇසීය.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- ඔබගෙන් අයෙකු කණ්ඩායමේ නායකයා ලෙස තෝරාගන්න.
- දී ඇති ඡේදය කියවා එහි ඇති අදහස් ලැයිස්තු ගත කරන්න.
- ඔබගේ අදහස් අල්ලාහ් පිළිබඳ ඒවා විය යුතුය.
- එයින් ඔබගේ ඊමානය කොතරම් දුරට තහවුරු වූයේ දැයි දක්වන්න.

ඇමුණුම 1.1.2

## ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම් අංක 01

එය ඉතා ආරක්ෂා සහිත කොටුවකි. එහි බිත්ති පිටතින් ඔප දැමුවාක් මෙන් දිලිසණි. එහි දොරක් හෝ ජනේලයක් නොවිය. හදිස්සියේම කොටුවේ බිත්ති පුපුරා එය තුළින් ඇසීමටත්, බැලීමටත් හැකියාව ඇති ජීවියෙක් පිට විය. උඵ අලංකාර රූපයක් හා මිහිරි හඬක් ඇති ජීවියෙකි. ඔව්. බිත්තරයකින් කුකුළු පැටවෙකු බිහි විය.

1. මේ විශ්මිත දේ කළේ කවුරුන් ද ?
2. ඔහුගේ කුමන හැකියාවන් මේ සිද්ධිය තුළින් මතු කෙරේ ද?



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් අංක 02

දිනපතා උදෑසන නැගෙනහිරෙන් උදාවෙන ඉර සවස් යාමයේ දී බටහිරින් බැස යන්නේ ය. ග්‍රහ, තාරකා එකිනෙක සමඟ ගැටෙන්නේ නැතිව අහසේ භ්‍රමණය වෙමින් පවතී. වැසි වහී. ශාක වැඩේ. සතුන් ඒවා ආහාරයට ගනිති. මිනිසා ශාක කොටස් පමණක් නොව සත්ව කොටස් ද ආහාර වශයෙන් ගනී. සමහර ආහාර අමුවෙන් ද, සමහර උයා ද අනුභව කරයි. අනුභව කළ යුත්තේ කෙසේ ද යන්න තීරණය කරන්නේ මිනිසාගේ බුද්ධියයි. මේ සම්බන්ධ මතභේද හටගන්නේ නැත.

1. මෙම ස්වාභාවික සිද්ධි තුළින් ඔබ වටහා ගන්නා දේවල් සටහන් කරන්න.

කණ්ඩායම් අංක 03

පට ශාකයේ පත්‍ර සියල්ල එකම රසයෙන් යුක්ත ය. එම පත්‍ර ආහාරයට ගන්නා පට පනුවා පට නූල් ලබා දෙයි. එම පත්‍ර ආහාරයට ගන්නා එළුවන් හා ගවයින් කිරි ලබා දෙයි.

තණකොළ ආහාරයට ගන්නා මුවා කස්තුරි ලබා දෙයි. එම මලෙහි පැණි බොන මී මැස්සා මී පැණි ලබා දෙයි.

එකම ශාකයෙන් ආහාර ලබා ගන්නා විවිධ ජීවීන්ගෙන් විවිධ දේ මිනිසා ලබා ගනී

1. මෙය කියවන ඔබගේ සිතෙහි මතුවන අදහස් ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම් අංක 04

අඬමින් පැමිණෙන ළමයා තම පියා පිද්දා නගරයේ අනතුරකින් අභාවයට පත් වූ බවත් තමාටත් මවටත් සොයුරු සොයුරියන්ටත් යන එන මං නැතිව ගොස් ඇති බවත් කියා දුක් වෙයි.

අපට යන එන මං නැති වනසේ පියාගේ පණ ඩැහැගත් දෙවියා ඇයි මෙතරම් කෲර යැයි ඔහු අඬමින් කියයි. මව එසේ කී බවත් කියයි. ඔහු සනසා ආපසු යවන ලදි. වසර කිහිපයකින් පසු ඔහු මට අතරමඟ දී මුණගැසුණේය. තම පියාගේ මරණයට වන්දි වශයෙන් විශාල මුදලක් සවුදියෙන් ලැබුණු බව ද එයින් සොයුරියගේ මංගල්‍ය කටයුතු ඉටුකළ බව ද සොයුරා පිටරට අධ්‍යාපනය සඳහා යැවූ බව ද අළුත් නිවසක් තනාගෙන තමා හා මව සතුටින් ජීවත් වන බව ද පියා සවුදියේ අභාවයට පත් නොවී ශ්‍රී ලංකාවේ අභාවයට පත්වූයේ නම් මේ කිසිවක් නො ලැබෙන්නට ඉඩ තිබුණු බව ද අල්ලාහ්ගේ මෙම කරුණා ගුණය ගැන තමන් ස්තුතිවන්ත වන බව ද කියා සිටියේ ය.

1. මෙය කියවූ විට ඔබගේ සිතෙහි මතුවන හැඟීම් ලැයිස්තුගත කර ලියන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 1.0 : ඊමාන්හි කරුණු හය විශ්වාස කර පිළිපදියි.

නිපුණතා මට්ටම 1.1 : ඊමාන් කිරීමේ අවශ්‍යතාව දැන ඊමාන් කරයි.

ක්‍රියාකාරකම 1.1 : ඊමාන් කිරීමේ අවශ්‍යතාවය දැන ජීවත් වෙමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 1.1.1 හි ඇතුළත් කාව්‍යය
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.1.1 :
- ★ ඇමුණුම් 1.1.1 හි දී ඇති කවිය සිසුන්ට කියවා පෙන්වන්න.
- ★ එහි ඇතුළත් සුවිශේෂ පද පහදා දෙන්න.
- ★ නැවත වරක් කියවා සිසුන්ට සවන්දීමට සලස්වන්න.
- ★ පහත කරුණු මතුවන අයුරින් ඔවුන් සමග සාකච්ඡා කරන්න.

> - ඊමාන් කළ යුතු කරුණු හයක් තිබෙන බව.
> - ඊමාන් කළයුතු එක් එක් කරුණ අනෙක් කරුණු හා කෙසේ සම්බන්ධ වේ ද යන බව.
> - ඊමාන් කරන විට කරුණු හයම එක්කොට පූර්ණ ලෙස ඊමාන් කළයුතු බව

පියවර 1.1.2 :
- ★ සිසුන් කණ්ඩායම් කරන්න.
- ★ ඇමුණුම් 1.1.1 හි ඇතුළත් ඔබ කියවූ කවියේ පිටපතක් සෑම කණ්ඩායමකටම ලබා දෙන්න.
- ★ එය කියවා ඊමාන් කළයුතු කරුණු හය හඳුනා ගැනීමට සලස්වන්න.
- ★ ඒ එකිනෙක සම්බන්ධයෙන් තමා දන්නා තොරතුරු සාකච්ඡා කර ලියා ගැනීමට සලස්වන්න.
- ★ ඔවුන්ගේ දායකත්වය නිරීක්ෂණය කොට ඇගයීමට ලක් කරන්න.
- ★ අවශ්‍ය තැන්වල දී උපදෙස් ලබාදෙන්න.

පියවර 1.1.3 :
- ★ සෑම කණ්ඩායමකටම තමාගේ වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ ප්‍රථමයෙන් වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට අදහස් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රථම අවස්ථාව ලබා දෙන්න.
- ★ අනිකුත් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් විමසන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු පදනම් කොට සමාලෝචනය කරන්න.

- ඊමාන් කළ යුතු කරුණු හය වන්නේ අල්ලාහ් විශ්වාස කිරීම, ඔහුගේ මලාඉකාවරු විශ්වාස කිරීම, ඔහුගේ ආගම් විශ්වාස කිරීම, ඔහුගේ දූතයන් විශ්වාස කිරීම, කියාමා දිනය විශ්වාස කිරීම, කලා කද්රය විශ්වාස කිරීම ආදිය බව.
- අල්ලාහ්ව විශ්වාස කිරීම අනෙකුත් අංගවලට මුල්වන බව.
- ඊමාන්හි කරුණු හයෙන් ඕනෑම එකක් අතහැරුණි නම්, ඔහු මුස්ලිම් කෙනෙකු විය නොහැකි බව.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ඊමාන් කළ යුතු කරුණු හය දැන විශ්වාස කරයි.
- ඊමාන් හි කරුණු හය එකිනෙක සමඟ කෙසේ සම්බන්ධ වේදැයි දැන පහදයි.
- ඊමානීය පදනමින් තම ජීවිතය හැඩගස්වා ගනියි.
- සියළු ක්‍රියාවල අවසානය අල්ලාහ් වෙත ඇතැයි විශ්වාස කරයි.

ඇමුණුම 1.2.1

- මෙය පියවර 1 හි දී පන්තියේ ගායනය කර පෙන්වා සිසුන් සවන් දීමට යොමු කරන්න.
- පියවර 1.1.2 දී මෙය පිටපත් කර කණ්ඩායම්වලට ලබා දෙන්න.
- මෙය කියවා ඊමාන් කළයුතු කරුණු දැන ලියා ගැනීමට සලස්වන්න.

## විශ්වාසය - ඊමාන්

යහ මං පෙත් ඇති ඊමානයේ
    වැදගත් ෆර්ලයන් හයක් වන්නේ
සියළු මැවීම් මවා අහර දෙන්නා
    විශ්වයේ අධිපති අල්ලාහ් වන්නේ
දෙව් අණ එලෙසින් පිළිපදිමින්
    සැරිසරණා මලක්වරුද සිටින්නේ
ඍජු මං පෙන්වන ආගම් සතර ද
    එකසිය දහයක් සුහුෆු ද වන්නේ
නබිවරුන් වෙත පහළ කළේ
    මුහම්මද් තුමාද ඇතුළත් වන්නේ

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

සත්‍ය වූ නබිවරු හා රසුල්වරුන්
　　නාථයාණන් එවූ දූතයන්　　වන්නේ
ලැබී ඇති දිනයන් නිමා කරමින්
　　යායුතු කියාමත් දිනයක් එළැඹෙන්නේ
ලොවේ ඇති සියළුම ජීවීන්
　　මරණයට පත්කොට　　නැගිටුවන්නේ
නැවතත් පණ දී ඒ හැමගේ
　　එක් තැනකට රැස්　　කරවන්නේ
දිගුකාලීන හොඳ හා වැරදි
　　මීසාන් නම් තුලාවෙන්　　කිරන්නේ
යහ ආනිශංශ ඝෘණ වී බරවීමෙන්
　　ලීතා සමඟ ස්වර්ගය වෙත　　යන්නේ
ඉපයූ පාපයන් බර වීමෙන්
　　භයංකර නිරයට ඇතුළත්　　වන්නේ
සියළු කාරණා හා ක්‍රියාවන්
　　දෙවි සැළසුම අනුවම　　සිදුවන්නේ
ඊමානයේ ඇතුළත් මේ හය කාරණයන්
　　වැටහුම සැමටම ෆර්ල්　　වන්නේ

දෙමළෙන් : එම්. එච්. එම්. බුහාරි (ෆලාහි)

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- සෑම කණ්ඩායමක්ම ඇමුණුම් 1.1.1 හි දී ඇති කවිය ලබා ගන්න.
- කණ්ඩායමේ අයෙක් එය හඬනගා කියවන්න.
- සියල්ලන්ම සවන්දී අවබෝධ කරගන්න.
- ඊමාන් කළයුතු කරුණු කවියෙන් හඳුනා ගන්න.
- ඒවා පැහැදිලිව සටහන් කරගන්න.
- පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 1.0 : ඊමාන්හි කරුණු හය විශ්වාස කර පිළිපදියි.

නිපුණතා මට්ටම 1.2 : අල්ලාහ් ගැන විශ්වාස කර අනුගමනය කරයි.

ක්‍රියාකාරකම 1.2 : අල්ලාහ් ඒකයා යැයි විශ්වාස කරමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.2.1 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ලියන කඩදාසි
- පාට පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.2.1 :
- ★ විශ්වයේ මැවීම් කිහිපයක් සිසුනට මතක් කරන්න.
- ★ පුළුල් වූ අහස, විසිරී ඇති පොළොව, ගැඹුරු මුහුද යනාදියෙහි දැකිය හැකි දුර්ලභ මැවුම් කිහිපයක් නම් කරන්න.
- ★ මේ සියල්ල මැවුවේ කවුරුන්දැයි විමසන්න.
- ★ පහත කරුණු මතුවන අයුරින් සාකච්ඡා කරන්න.

- අල්ලාහ් ඒකයා බව
- සියල්ල මැවුවේ අල්ලාහ් බව
- අල්ලාහ්ගේ මැවුම් විශ්මයජනක බව
- ජීවීන්ගේ පැවැත්මට සුදුසු පරිදි මෙලොව මවා ඇති බව

පියවර 1.2.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ ඇමුණුම 1.2.1 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව එකිනෙක කණ්ඩායම්වලට ලබාදෙන්න.
- ★ ලියන කඩදාසි හා පාට පෑන් එකිනෙක කණ්ඩායම්වලට සපයන්න.
- ★ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 1.2.3 :
- ★ එකිනෙක කණ්ඩායම්වල වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ වාර්තාවේ දුර්වලතා සකසා ගැනීමට එම කණ්ඩායමටම අවස්ථා ලබාදෙන්න.
- ★ ප්‍රථමයෙන් ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.
- ★ අනෙකුත් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් විමසන්න.
- ★ පහත කරුණු මතුවන අයුරින් සමාලෝචනය කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- අල්ලාහ් සිටී යන්නට සාධක ලෙස මැවීම් පවතින බව
- සියල්ල සැළසුම් කර මවා සුරකින්නේ අල්ලාහ් බව
- අල්ලාහ්ගේ මැවීම් සියල්ල සූක්ෂ්ම බව
- අල්ලාහ්ව මුළු හදින් විශ්වාස කොට කටයුතු කළයුතු බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- මෙම විශ්වය මවා පාලනය කරන්නා අල්ලාහ් බව පවසයි.
- මෙම විශ්වයේ අධිපතියා අල්ලාහ් බව පවසයි.
- සියළු අවස්ථාවන්හිම අල්ලාහ්ගේ ශක්තිය දැන ඔහුට කෘතගුණ දක්වයි.
- අල්ලාහ් ඒකයා බව විශ්වාස කර ඔහුට පමණක් නැමදීම් කරයි.

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- සෑම කණ්ඩායමක්ම තමන්ට ලබාදී ඇති කාර්ය පත්‍රිකාව හොඳින් කියවන්න.
- අල්ලාහ් සිටී යන්නට හේතු සාකච්ඡා කර කෙටියෙන් සටහන් කරගන්න.
- අල්ලාහ් කෙරෙහි සෙනෙහස දැක්වීමට හේතු සාකච්ඡා කර කෙටියෙන් සටහන් කරගන්න.
- විද්‍යා, සෞඛ්‍ය හා පරිසර විෂයයන්හි දී උගත් මැවුම්වල ලක්ෂණ විස්තරාත්මකව සාකච්ඡා කර ඒවා අල්ලාහ්ගේ විශ්මිත මැවුම් බව සටහන් කරගන්න.
- ගුරුවරයා හා සාකච්ඡාවේ දී සඳහන් වූ අදහස් කේන්ද්‍රකොට ගෙන ගවේෂණයෙහි යෙදෙන්න.

ඇමුණුම 1.2.1

## ගවේෂණ පත්‍රිකාව

1. අල්ලාහ් සිටී යන්නට සාධක වන අංග දෙකක් ලියන්න.
2. අප අල්ලාහ්ට ආදරය කළ යුත්තේ ඇයිද යන්නට හේතු තුනක් ලියන්න.
3. අල්ලාහ්ගේ මැවුම්වලට සාධක විය හැකි අංග 5ක් ලියන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 1.0 : ඊමාන්හි කරුණු හය විශ්වාස කර පිළිපදියි.

නිපුණතා මට්ටම 1.3 : අල්ලාහ් ගේ මලාඉකාවරු පිළිබඳ විශ්වාස කර අනුගමනය කරයි.

ක්‍රියාකාරකම 1.3 : මලාඉකාවරුන් දැන විශ්වාස කරමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.3.1 හි ඇතුළත් තොරතුරු පත්‍රිකාව
- ඇමුණුම 1.3.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ලිවීම් කඩදාසි
- වර්ණ පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.3.1 :
★ ඇමුණුම 1.3.1 ඇති විස්තර පත්‍රිකාව සිසුන්ට පෙන්වා කියවා අවබෝධ කර ගැනීමට සලස්වන්න.
★ මලාඉකාවරුන්ගේ නම් හා ඔවුන්ගේ වගකීම් ගැන සිසුන්ගේ පෙර දැනුම පිරික්සන්න.
★ පහත කරුණු මතුවන අයුරින් සාකච්ඡාව මෙහෙයවන්න.

- මලාඉකාවරුන් අපගේ දෑස්වලට නොපෙනෙන අතර ඔවුන් ආලෝකයෙන් මවා ඇති බව.
- ඔවුන්ට ලිංග භේද හෝ පවුල් දිවියක් හෝ පිපාසය, කුසගින්න, වෙහෙස යනාදිය හෝ නොමැති බව.
- ඔවුන් පාප ක්‍රියාවල යෙදීමේ ස්වභාවයෙන් තොර වූවන් බව.
- අල්ලාහ් ඔවුන්ට පැවරූ වගකීම් කිසිදු අඩුවකින් තොරව ඉටු කරන්නන් බව.
- ඔවුන් විශාල සංඛ්‍යාවක් සිටින බව

පියවර 1.3.2 :
★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
★ ඇමුණුම 1.3.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා කණ්ඩායම්වලට බෙදා දෙන්න.
★ ලිවීම් කඩදාසි හා පෑන් කණ්ඩායම්වලට සපයන්න.
★ සෑම කණ්ඩායමකම ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.

පියවර 1.3.3 :
★ කණ්ඩායම්වලට තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
★ ප්‍රථමයෙන් ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් විස්තීර්ණ කිරීමට අවස්ථාව දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

★ පහත සඳහන් කරුණු මතුවන අයුරින් සාකච්ඡා කරන්න.

- ලෞකික වස්තූන් සමහරක් මෙන් මලාඉකාවරු ද අප පියවි ඇසට නොපෙනෙන බව.
- ඔවුන් අලෝකයෙන් මවන ලද්දන් බව
- ඔවුන්ට අල්ලාහ් පැවරූ වගකීම් කිසිදු අඩුවකින් තොරව ඉටුකරන බව
- ප්‍රධාන මලාඉකාවරු දසදෙනා බව
- ඔවුන් විශ්වාස කොට කටයුතු කිරීම ඊමානයේ අංගයක් බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- මලාඉකාවරුන්ගේ ස්වභාවය සඳහන් කරයි.
- ප්‍රධාන මලාඉකාවරුන් දසදෙනා ගේ නම් හා කාර්යයන් සඳහන් කරයි.
- මලාඉකාවරුන්ගේ කාර්යයන් සම්පූර්ණයෙන් දැන ජීවිතය හැඩගස්වා ගනී.
- මලාඉකාවරුන් අපගේ කුසල් හා අකුසල් සටහන්කරන බව විශ්වාස කොට ක්‍රියාකරයි.

ඇමුණුම 1.3.1

මෙය සිසුන්ට සවන්දීමට හැකිවන අයුරින් කියවීමට සලස්වන්න.

## මලාඉකාවරුන් විශ්වාස කරමු

අප අවට බොහෝ දෑ ඇත. ඉන් සමහරක් අපගේ දෑසට පෙනෙන අතර, තවත් සමහරක් අපගේ දෑසට නොපෙනේ. උදා :- සීනු හඬ, සිරුරේ වේදනාව, මලක සුවඳ වැනි ඒවා අපගේ දෑසට නොපෙනෙන ඒවාය. එනිසා ඒවා නැතැයි පැවසීමට නොහැක. ඒවා සියසින් දැකීමට නොහැකි වුවත් ඒවායේ ක්‍රියාකාරීත්වය දැක, අසා, ආඝ්‍රාණය කොට හා අත්දැකීමෙන් ඒවා පවතින බව පිළිගනිමු. මෙලෙස නොපෙනෙන දෑ විශ්වාස කොට පිළිගැනීම කාලයක් තිස්සේ ලෝකයේ සිදුවන සිද්ධාන්තයකි.

මුස්ලිම්වරුන් වන අපට සැඟවුනු දේ පිළිබඳ විශ්වාස කළයුතු බව අල්ලාහ් විසින් අණකරනු ලැබ ඇත. ඉහත සඳහන් දෑ සැඟවුනු ඒවා වන ලෙසින්ම, එවැනි අන් බොහෝ දෑ ද සැඟවී ක්‍රියාකරන බව අප දන්නෙමු. උදාහරණ ලෙස අපට අල්ලාහ් දැකිය නොහැකි වුවද විශ්වයේ පැවැත්ම අනුව අල්ලාහ් සිටින බව තහවුරු වන්නේ ය.

මෙලෙසම අල්ලාහ්ගේ මලාඉකාවරු ද සැඟවුනු අය වෙති. අපට ඔවුන් දෑසින් දැකිය නොහැකිය. අනෙකුත් ඉන්ද්‍රියයන්ගෙන් අවබෝධ කර ගැනීමට ද නොහැකිය. එහෙත් ඔවුන් සිටින බව අප

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

විශ්වාස කළ යුතුය. ලොව ඇති දෑ හා මැවීම් පවත්වාගෙන යාම සඳහා අල්ලාහ් මලාඉකාවරු ප්‍රයෝජනයට ගනී.

මලාඉකාවරු ආලෝකයෙන් මවනු ලැබූ අය වේ. කැමැති රූපයකින් පෙනී සිටින්නන් වේ. ඔවුන් ස්ථිරව හඳුනා ගැනීම අසීරු ය. මිනිසුන්ගේ අවශ්‍යතා ඉටුකර දීම සඳහා ඔවුන් සෑම තැනම සංචාරය කරති.

අල්ලාහ්ගේ නියමය පරිදි සුළං හැමීමට සැළැස්වීම, වර්ෂාව වැස්සවීම, අනතුරුවලින් මිනිසුන් මුදාගැනීම වැනි බොහෝ කටයුතුවල ඔවුන් යෙදෙති.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- කණ්ඩායම් නියෝජනය කරන සෑම සාමාජිකයෙක්ම අවම වශයෙන් මලාඉකාවරු දෙදෙනෙකුගේ නම හා කාර්යයන් සඳහන් කිරීමට සලස්වන්න.
- මලාඉකාවරුන්ගේ ස්වභාවයන් මොනවාදැයි සාකච්ඡා කරන අතරම මිනිස් ස්වභාවයන්ගෙන් මලාඉකාවරුන්ගේ ස්වභාවයන් කෙසේ වෙනස් වේ දැයි සාකච්ඡා කරන්න.
- මලාඉකාවරුන් විශ්වාස කිරීමෙන් අපට කුමක් ලබාගත හැකි දැයි සාකච්ඡා කර සටහන් කරගන්න.
- සටහන් කරගත් දෑ පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.3.2

## ගවේෂණ පත්‍රිකාව

1. මලාඉකාවරු දසදෙනාගේ නම් සඳහන් කොට ඒ ඉදිරියෙන් ඔවුන්ගේ කාර්යයන් සටහන් කරන්න.
2. මලාඉකාවරුන්ගේ ස්වභාවය සටහන් කරන්න.
3. මලාඉකාවරුන් අප විශ්වාස කළ යුත්තේ ඇයි දැයි සටහන් කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 1.0 : ඊමාන්හි කරුණු හය විශ්වාස කර පිළිපදියි.

නිපුණතා මට්ටම 1.4 : අල්ලාහ් විසින් පහළ කළ ආගම් විශ්වාස කර පිළිපදියි.

ක්‍රියාකාරකම 1.4 : අල්ලාහ්ගේ ආගම් විශ්වාස කර ජීවත් වෙමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- කැසට් පටි යන්ත්‍රයක්
- ඇමුණුම 1.4.1 ඇතුළත් පටිගත කරන ලද කසීදා ටේප් පටිය,
- ඇමුණුම 1.4.2 ගවේෂණ පත්‍රිකා පිටපත්
- ෆෙල්ට් පෑන් කණ්ඩායමට 1 බැගින්
- ඩිමයි කඩදාසි

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.4.1 :
- ★ ඇමුණුම 1.4.1 හි සඳහන් කසීදා පටිය ක්‍රියාකරවා සිසුන්ට සවන්දීමට සලස්වන්න.
- ★ කසීදාව පදනම් කරගෙන ආගම්, එය පහළ කරනු ලැබූ නබිවරු, ඒවා පහළ කළ භාෂා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - මිනිසාට යහමග පෙන්වීම සඳහා අල්ලාහ් විසින් නබිවරුන්ට, සුහුෆු පහළ කළ බව
> - මිනිසාට යහමග පෙන්වීම සඳහා ආගම් පහළ කළ බව
> - අල්ලාහ් ආගම් හතරක් පහළ කළ බව
> - ඒවා විවිධ භාෂාවලින් පහළ කරනු ලැබූ බව
> - අවසන් ආගම අල්කුර්ආන් වන බව.

පියවර 1.4.2 :
- ★ පන්තිය කණ්ඩායම් වශයෙන් බෙදන්න.
- ★ සෑම කණ්ඩායමකටම ගවේෂණ පත්‍රිකා හා ලිපිද්‍රව්‍ය බෙදා දෙන්න.
- ★ සිසුන් ගවේෂණ කාර්යයන්හි යොදවන්න. 1.4.2 සාකච්ඡා කර ක්‍රියාකිරීමට මග පෙන්වන්න.
- ★ සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කොට අගයන්න.
- ★ කුඩා කණ්ඩායම් සිය කණ්ඩායම් වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

පියවර 1.4.3 :
- ★ කුඩා කණ්ඩායම්වලට සිය අනාවරණ වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ පළමු ඉදිරිපත් කළ කණ්ඩායමට තම වාර්තාව විස්තාරණය කිරීමට පළමු අවස්ථාව ලබාදෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- අල්ලාහ් නබිවරුන්ට සුහුෆු පහළ කළ බව
- ආදම් (අලෛ) නබිවරයාට සුහුෆු 10
  ෂීද් (අලෛ) නබිවරයාට සුහුෆු 50
  ඉද්රීස් (අලෛ) නබිවරයාට සුහුෆු 30
  ඉබ්රහම් (අලෛ) නබිවරයාට සුහුෆු 10
  මූසා (අලෛ) නබිවරයාට සුහුෆු 10 ලෙස පහළ කළ බව.
- තව්රාත් ආගම මූසා (අලෛ) ටද, සබූර් ආගම දාවූද් (අලෛ)ටද, ඉන්ජිල් ආගම ඊසා (අලෛ) තුමාට ද, ෆුර්කාන් ආගම මුහම්මද් (සල්) තුමාට ද පහළ කළ බව.
- ෆුර්කාන් ආගම පහළ කළ පසු ඉතිරි ආගම් අක්‍රිය වූ බව
- ෆුර්කාන් පූර්ණ ජීවන මාර්ගයක් බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- අල්ලාහ් පහළ කළ ආගම් ද, ඒවා පහළ කරනු ලැබූ නබිවරුන්ගේ නම් ද, ඒවා පහළ කළ භාෂාව ද පිළිවෙලින් කියයි.
- අල්ලාහ් පහළ කළ ආගම් විශ්වාස කර පිළිපැදිය යුතු බව පිළිගනී.
- ෆුර්කාන් ආගමේ ඉගැන්වීම් පිළිපදී.
- කසීදාව කටපාඩම් කර කියයි.

ඇමුණුම් 1.4.1

පහත කසීදාව හඬ පටියක (කැසට්) පිටපත් කර ගන්න.

| | | |
|---|---|---|
| තෞරාත් | මූසා | අබරානි |
| සබූර් | දාවූද් | යූනානි |
| ඉන්ජිල් | ඊසා | සුරියානි |
| ෆුර්කාන් | මුහම්මද් | අරබානි |

ඇමුණුම 1.4.2

## ගවේෂණ පත්‍රිකාව

- ඔබ දන්නා ආගම්වල නම් ලියන්න.
- ඒවායින් අල්ලාහ් විසින් පහළ කරනු ලැබූ අයුරින් වෙනස් වීමට භාජනය වී ඇති ආගම් සටහන් කරන්න.
- අල්ලාහ් විසින් පහළ කළ වෙනස් නොවූ ආගම් මොනවා ද ?
- යුදෙව්වරුන් පිළිපදින ආගම කුමන නමකින් පහළ වූයේ ද ?
- ඊසා (අලෛ තුමාගේ ඉන්ජිල්) ආගම වෙනස් කළේ කවුරුන් ද ?

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 1.0 : ඊමාන්හි කරුණු හය විශ්වාස කර පිළිපදියි.

නිපුණතා මට්ටම 1.5 : අල්ලාහ්ගේ රසූල්, නබිවරුන් (වක්තෘ) පිළිබඳ දැන අනුගමනය කරයි.

ක්‍රියාකාරකම 1.5 : අල්ලාහ්ගේ දූතයින් විශ්වාස කොට ජීවත් වෙමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- කාර්ය පත්‍රිකාව - ඇමුණුම 1.5.1
- ඩිමයි කඩදාසි සහ ෆෙල්ට් පෑන් කණ්ඩායමට එක බැගින්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.5.1 :
- ★ කළුලෑල්ලේ අලයිහිස්සලාම් සල්ලල්ලාහු අලෛයිහිවසල්ලම් යැයි ලියා ඒවා යොදාගන්නා අවස්ථා සිසුන්ගෙන් විමසන්න.
- ★ නබිවරු පිළිබඳ ව සිසුන් දන්නා කරුණු ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.
- ★ පහත කරුණු අවධාරණය වන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න.

> - අල්ලාහ් ආගම් දේශණා කිරීමට නබිවරු පහළ කරනු ලැබූ බව
> - නබිවරු එක්ලක්ෂ විසිහතර දහසක් සහ රසූල්වරු 313 දෙනෙක් පහළ කළ බව
> - නබිවරු පිරිමින් බව
> - අවසන් නබිතුමා මුහම්මද් (සල්) බව

පියවර 1.5.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ කණ්ඩායම් ගවේෂණය සඳහා වූ කාර්ය පත්‍රිකාව ලබාදෙන්න.
- ★ ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් ආදිය ලබාදෙන්න.
- ★ සෑම කණ්ඩායමටම අවශ්‍ය පරිදි මඟ පෙන්වන්න.
- ★ සිය ගවේෂණය වාර්තාව ඉදිරිපත් කිරීමට කණ්ඩායම් යොමු කරන්න.

පියවර 1.5.3 :
- ★ සෑම කණ්ඩායමටම පන්තිය ඉදිරියට පැමිණ වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ★ ප්‍රථමයෙන් වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ අනෙක් කණ්ඩායම්වලට ද සිය වාර්තාව ඉදිරිපත් කිරීමටත්, සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබාදෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- අල්ලාහ් පහළ කළ ආගම් හා අණපනත් අනුශාසනා කර පහදා දී මඟ පෙන්වීමට නබිවරු පහළ කළ බව
- සමහර නබිවරු රසූල්වරු වන අතර, රසූල්වරු නබිවරුන්ට වඩා ශ්‍රේෂ්ඨයන් වන බව
- මොවුන්ගෙන් 25 දෙනෙකුගේ නම් අල් කුර්ආනයේ සඳහන් වන බව
- නබිවරුන් සියල්ලන්ම පිරිමින් බව
- නබිවරු සත්‍යය, විශ්වාසය, තීක්ෂණ බුද්ධිය සහිත අය බව
- වහී මගින් ලැබුණු තොරතුරු ජනයාට දේශනා කළ බව
- නබිවරු ප්‍රතික්ෂේප කළ අය ඔවුන්ට විවිධ දුක් කරදර ඇති කළ බව
- නබිවරු දැඩි ව තම ස්ථාවරයේ සිටිමින් දුක් පීඩා විඳ දරාගත් බව
- අවසන් නබිවරයා ලෙස මුහම්මද් නබි (සල්) තුමා පහළ වූ බව
- එතුමා ලෝක අවසානය තෙක් මඟපෙන්වීම ලබා දී ඇති බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- නබිවරු පහළ කරනු ලැබීමට හේතු කියයි.
- නබිවරු හා ඔවුන්ගේ දේශනා අගයමින් කටයුතු කරයි.
- නබිවරුන්ගේ නම කියන විටත් ඇසෙන විටත් අලෛයිහිස්සලාම් යැයි සුභ පතයි.
- නබිවරුන්ගේ ආදර්ශමත් ජීවිතය අනුගමනය කරයි.

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- සෑම කණ්ඩායමකටම කාර්ය පත්‍රිකාවක් ලබා දෙන්න.
- තේමා හතර යටතේ ලබා දී ඇති කරුණු මනාව සාකච්ඡා කරන්න.
- ඒවා සටහන් කරගන්න.
- පන්තියේ දී ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 1.5.1

# ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායමට එක බැගින් කාර්ය පත්‍රිකා ලබාදෙන්න.

- නබිවරු මෙලොව පහළ වීමට හේතු කුමක් ද ?

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

- ඔබ දන්නා නබිවරු දහදෙනෙකුගේ නම් ලියන්න.

| | |
|---|---|
| 1. | 6. |
| 2. | 7. |
| 3. | 8. |
| 4. | 9. |
| 5. | 10. |

- නබිවරුන්ගේ ගුණාංග මොනවා ද ?

i. .....................................................................................................................

ii. .....................................................................................................................

iii. .....................................................................................................................

iv. .....................................................................................................................

v. .....................................................................................................................

- නබිවරු සිය ජීවිතයේ දී මුහුණ දුන් ගැටළුවලට හේතු සොයා ලියන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 1.0 : ඊමාන්හි කරුණු හය ගැන විශ්වාස කර පිළිපදියි.

නිපුණතා මට්ටම 1.6 : කියාමා දිනයේ සිදුවීම් පිළිබඳ දැන ක්‍රියා කරයි.

ක්‍රියාකාරකම 1.6 : කියාමා දිනයේ සිදුවීම් දැන ඒ දිනය සඳහා සූදානම් වෙමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- කියාමා දිනයේ ලක්ෂණ පිළිබඳව විස්තර ලියන ලද බ්‍රිස්ටල් බෝඩ්
- ඇමුණුම 1.6.1
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්
- ගවේෂණ පත්‍රිකා ඇමුණුම 1.6.2

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.6.1 :
- ★ කියාමාව පිළිබඳව දන්නා කරුණු කීමට සිසුන් යොමු කරන්න.
- ★ කියාමාව පිළිබඳ විස්තර ලියන ලද බ්‍රිස්ටල් කාඩ් ප්‍රදර්ශනය කරන්න.
- ★ පහත කරුණු මතුවන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න.

- කියාමා දිනයට පෙර ලක්ෂණ සමහරක් පහළ වන බව
- කියාමාව විශ්වාස කිරීම ඊමාන්හි පස්වන වගකීම බව
- සියල්ලන්ම ප්‍රශ්ණකරණයට භාජනය වී ස්වර්ගයට හෝ නිරයට තීන්දු කරනු ලබන බව
- කියාමාව විශ්වාස කිරීමෙන් මෙලෝ දිවිය යහපත් වන බව

පියවර 1.6.2 :
- ★ ප්‍රදර්ශනය කර ඇති බ්‍රිස්ටල් කාඩ්පත - සියල්ලන්ම නිශ්ශබ්දව කියවීමට යොමු කරන්න.
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ ගවේෂණය සඳහා කාර්ය පත්‍රිකා ලබාදෙන්න.
- ★ ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් ලබාදෙන්න.
- ★ ඒ ඒ කණ්ඩායමට අදාළ උපදෙස් ලබාදෙන්න.
- ★ කණ්ඩායම් වාර්තාව ඉදිරිපත් කිරීමට පොළඹවන්න.

පියවර 1.6.3 :
- ★ සෑම කණ්ඩායමකටම සිය ගවේෂණ වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ ඉදිරිපත් කරන වාර්තාව පිළිබඳ ව සංවර්ධනාත්මක ව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ සෑම කණ්ඩායමට මෙසේ සිය වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථා සලසන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- කියාමා දිනය ආරම්භ වීමට ප්‍රථම ලක්‍ෂණ රැසක් පහළ වන බව .
  *උදා :* නායකයින් වැඩිවීම
  බොරුකාරයින් බිහිවීම
  දජ්ජාල් බිහිවීම
  ඉර බටහිරින් උදාවීම
- කියාමාවේ දී ප්‍රශ්න කිරීමෙන් කුසල් කළ අයට ස්වර්ගය ද අකුසල් කළ අයට නිරය ද තීන්දු කෙරෙන බව
- අල්ලාහ්ට හා රසූල්වරයාට අවනත වීමෙන් පමණක් කියාමාවේදී ජයග්‍රහණය ලැබෙන බව
- අල්ලාහ්ගෙන් ස්වර්ගය පතා ද නිරයෙන් ආරක්‍ෂාව පතා ද ප්‍රාර්ථනා කළ යුතු බව

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- කියාමා දිනයට පෙර එන ලක්‍ෂණ සමහරක් සඳහන් කරයි.
- කියාමාවේ දී සිදුවන සිද්ධීන් ගොනු කරයි.
- දැනට සිදුවෙමින් පවතින ලක්‍ෂණ සමහරක් හඳුනා ගනියි.
- ඕනෑම කාර්යයක දී කියාමාව අරමුණු කොට ක්‍රියාත්මක වන ස්වභාවය ලබයි.
- කියාමා දිනයේ ප්‍රශ්න කිරීම ගැන සිතා තම ගතිගුණ හැඩ ගස්වා ගෙන යහ ක්‍රියාවල උවමනාවෙන් දෛනිකව යෙදෙයි.

ඇමුණුම 1.6.1

බ්‍රිස්ටල් බෝඩයේ ලියා ප්‍රදර්ශණය කළ යුතු දේ :

ඊමාන්හි පස්වන කරුණ කියාමාව විශ්වාස කිරීමයි

කියාමාව ආසන්න වන විට ඇතිවන ලක්‍ෂණ කිහිපයක් ඇත.

- මහ්දි (අලෛ) ඉපදීම.
- ඊසා (අලෛ) පහළ වීම.
- දජ්ජාල් බිහිවීම.
- දාබ්බතුල් අර්ල් පිටවීම.
- යඃජූජ්, මඃජූජ් පිටවීම.
- භූමි කම්පා ඇතිවීම
- ඉර බටහිරින් නැගීම.

- පළමුවර සූර් පිඹීම
- අහස පොළොව ඇතුළු සියල්ල විනාශ වීම.
- අල්ලාහ් පමණක් ඉතිරි වීම.
- දෙවන වර සූර් පිඹිනු ලැබීම.
- ජනයා ජීවය ලැබ නැගිට විත් මහ්ෂර් පිටියේ දී රැස්වීම.
- ප්‍රශ්නකරණය සිදුවීම.
- යහපත් දේ කළ අය සතුටින් ස්වර්ගයට පිවිසෙන අතර,
- අයහපත් දේ කළ අය හඬා වැටෙමින් නිරයට ඇතුළු වීම.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- කණ්ඩායම් තුනටම විවිධ වූ මාතෘකා තුනක් යටතේ ලබාදී ඇති ගවේෂණ කාර්ය පත්‍රිකා ලබා දෙන්න.
- කියාමාව ඇතිවීමට පෙර සිදුවන ලක්ෂණ ගැන සාකච්ඡා කර ඒ ඒ කණ්ඩායම් සටහන් කර ගන්න.
- ඒවා පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.6.2

## ගවේෂණ පත්‍රිකාව

මෙයින් කණ්ඩායමට පිටපතක් බැගින් ලබාදෙන්න.

සෑම කණ්ඩායමක් ම තමන් අතර සාකච්ඡා කරමින් වාර්තා සකස් කිරීමට උපදෙස් දෙන්න.

කණ්ඩායම 1 - කියාමාවට පෙර ඇතිවන ලක්ෂණ ලියන්න.

කණ්ඩායම 2 - දැනට සිදුවෙමින් පවතින ලක්ෂණ ලියන්න.

කණ්ඩායම 3 - කියාමාව විශ්වාස කිරීම නිසා අප ජීවිතයේ ඇතිවන වෙනස්කම් ලියන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | : | ඊමාන්හි කරුණු හය විශ්වාස කර පිළිපදියි. |
| නිපුණතා මට්ටම | : | සියල්ල සිදුවන්නේ අල්ලාහ්ගේ කැමැත්ත පරිදි බව විශ්වාස කර කටයුතු කරයි. |
| ක්‍රියාකාරකම 1.7 | : | සියල්ල සිදුවන්නේ අල්ලාහ්ගේ කැමැත්ත පරිදි යැයි විශ්වාස කරමු. |
| කාලය | : | |
| ගුණාත්මක යෙදවුම් | : | ● ඇමුණුම 1.7.1<br>● ගවේෂණ පත්‍රිකාව 1.7.2<br>● ඕමයි කඩදාසි<br>● පාට පෑන් |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.7.1 :

- ★ ඇමුණුම 1.7.1 දී ඇති පත්‍රිකාව හඬනගා කියවන්න.
- ★ එයට සාවධානව සවන්දීමට සිසුන් යොමු කරන්න.
- ★ සිසුන්ගේ බුද්ධි කලම්භනය සිදුවන අයුරින් පහත කරුණු කේන්ද්‍ර කොට සාකච්ඡාව කරන්න.

> - පොළොවේ සහ අහසේ සිදුවන සියල්ල මෙහෙයවන්නේ අල්ලාහ් බව
> - මිනිසාගේ උපත මරණය යන සියල්ලට හේතුව අල්ලාහ් බව
> - ජීවිතයේ අප හමුවන ජය පරාජය යන සියල්ල අල්ලාහ් කල්තියාම නිර්ණය කළ සැලසුම් අනුව සිදුවන බව

පියවර 1.7.2 :

- ★ සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- ★ ඒ ඒ කණ්ඩායමට ගවේෂණ පත්‍රිකාව බැගින් බෙදා දෙන්න.
- ★ ඕමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- ★ සෑම කණ්ඩායමක් ම සිය වාර්තාව ඉදිරිපත් කළ යුතු බව පවසන්න.

පියවර 1.7.3 :

- ★ සෑම කණ්ඩායමටම සිය වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ ප්‍රථමයෙන් වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ ඉතිරි කණ්ඩායම්වලට ද සිය සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත සඳහන් කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- පොළොවේ සහ අහසේ සිදුවන සියලු සිදුවීම් අල්ලාහ්ගේ සැලසුම් අනුව සිදුවන බව
- මිනිසාගේ උපත, පිරිමි හෝ ගැහැණු වීම යන සියල්ල අල්ලාහ්ගේ සැලසුම් අනුව සිදුවන බව
- මිනිස් ජීවිතයේ ජය හා පරාජය අල්ලාහ්ගේ අභිමතය අනුව සිදුවන බව
- ජයග්‍රහණයේ දී අල්ලාහ්ට ප්‍රශංසා කළයුතු බවත් පරාජයේ දී කද්ර් ගැන විශ්වාස කර තෘප්තිමත් විය යුතු බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- විශ්වයේ සිදුවන සියළු සිද්ධීන්ට හේතුව අල්ලාහ්ගේ පෙර සැලැස්ම බව පවසයි.
- අල්ලාහ්ගේ පෙර සැලසුම් පිළිගෙන තෘප්තිමත් වෙයි.
- ජීවිතයේ දී මුහුණදීමට සිදුවන දුක හා අමිහිරි සිදුවීම් අල්ලාහ්ගේ විධිවිධාන බව සිතා සිත සනසාගෙන ජීවත්වෙයි.
- ජයග්‍රහණයේ දී අල්ලාහ්ට තුති කරයි.
- අල්ලාහ් කෙරේ භක්තියෙන් හා සෙනෙහසින් ජීවත් වෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 1.7.1

# කලා කද්ර්

ලොව ඇති සියල්ල මැව්වේ අල්ලාහ් විසින් බව ඔබ දනී.

එමෙන් ම යහපත හා අයහපත ඇති කරන ලද්දේ අල්ලාහ් විසින් ය. ඒවා සිදුවන්නේ ද අල්ලාහ්ගේ අභිමතය පරිදි ය.

කුමක් කෙසේ කවර වේලාවක සිදුවේ ද?

කවුරුන් කුමන අවස්ථාවේ දී කුමක් කරත් ද ?

මේවා අල්ලාහ් විසින් කල් තියාම සැලසුම් කළ ඒවා ය. මේ පිළිබඳ දැනුම ඇත්තේ ඔහුට පමණි. සියල්ල සිදුවන්නේ ඒ අනුව ය. එයට වෙනස් ආකාරයට සිදුවන කිසිවකුත් නැත.

අල්ලාහ්ගේ පෙර විධිවිධානයට කලා කද්ර් යැයි පවසති.

රාත්‍රියෙන් පසුව දහවල් ද,
අඳුරෙන් පසුව ආලෝකය ද,

සිසිල අවසානයේ උෂ්ණත්වය ද,
පිරිහීමෙන් පසු ජයග්‍රහණය ද,
ලාභයෙන් පසු පාඩු ද,
උපතින් පසු මරණය ද,

ලැබෙන සේ අල්ලාහ් සැලසුම් කර ඇත.
මෙලොව සැලසුම් නොකරන ලද අවිධිමත් ස්ථානයක් නොවේ.
පියාගේ ආදායම අනුව මව විසින් නිවසේ මාසික වියදම සැලසුම් කළ යුතුය.
නැතහොත් අඩුපාඩුකම් ඇති වී පවුලේ ප්‍රශ්න පැන නගී.
ඔබේ පාසල් අධ්‍යාපනය සාර්ථක වන්නේ පාඩම් සැලසුම් කළ විටය. ඔබට නිසි පරිදි ඉගෙන ගත හැක්කේ එවිට ය.

රජයක් සැලසුම් සහගත ව වියදම් කළ විටය රටේ ආර්ථිකය යථා පරිදි පවතින්නේ.
සැලැස්මක් නැතිව අහම්බෙන් හෝ ඉබේම හෝ
කිසිවක් කිසිදු තැනක සිදු නොවේ.

මෙලොව ද එසේ ය. මෙලොව ක්‍රියාත්මක වීමේ පටන් එහි ඇති සියළු මැවීම් සම්බන්ධයෙන් අල්ලාහ් මනාව සැලසුම් කර ඇත.

ලැබීම් යනුවෙන් හඳුන්වනු ලබන්නේ එයයි.
ලැබීම් යන මැවුම්කරුවාගේ සැලැස්මට අනුව මෙලොව දී සියල්ල සිදුවන්නේය. අතීතයේ සිදුවූයේ ද එසේය. දැනට සිදුවන්නේ ද අනාගතයේ සිදුවන්නට යන්නේ ද එයයි. මැවුම්කරුවා විසින් නිර්ණය කරනු ලබන මෙම සීමාවන් ඉක්මවා යෑමට කිසිවෙකුටත් බැරිය.

ලැබීම් විසින් මිනිසා යහපත වෙතට හෝ අයහපත වෙතට හෝ බලෙන් කැඳවනු ලබන්නේ නැත. සිතීමට හා ක්‍රියා කිරීමට තරමක නිදහස ලැබී ඇති මිනිසාට මෙසේ නිදහස ලැබී නැති අන් මැවීම් මෙන් බලපෑම්වලට ලක්වන්නේ නැත.

මිනිසා කැමැත්තේ නම් ඊමාන් කොට මැවුම්කරුවා විශ්වාස කොට පිළිගත හැකිය. නැතහොත් මැවුම්කරුවා ප්‍රතික්ෂේප කළ හැකිය. මිනිසා කුසල් හෝ අකුසල් කෙරෙහි බල කරනු නො ලබන්නේ ය යන්නට උදාහරණය මෙයයි. ඔහු බල කරනු ලැබුවේ නම්,

වක්තෘන් වහන්සේගේ අවශ්‍යතාවය නැතිව යන්නේ ය.
ආගම්වල අවශ්‍යතාවයත් නැතිව යන්නේ ය.
දඬුවම් හා ප්‍රශංසාවල අවශ්‍යතාවයත් නැතිව යන්නේ ය.
මිනිසුන් සියල්ලන් ම මැවුම්කරුවාට බැති බියෙන් යුක්ත ව ජීවත් වනු ඇත.

ලැබීම් යන්න කල් ඇතිව තීරණය කරන ලද්දක් වුව ද ඒ සඳහා අප අක්‍රියව නොසිටිය යුතුයි. ආගම් පිළිපදිමින් ඒවා ගෙන ආ වක්තෘන්වරු පිළිපදිමින් අප මැවුම්කරුවාට අවනතව ජීවත් විය යුතුයි.

අවසන් ආගම වන අල්කුර්ආනය හා අවසන් නබිවරයා වූ මුහම්මද් (සල්) තුමා අනුගමනය කරමින් යහපත් මුස්ලිම්වරු වශයෙන් ජීවත්වීමට වෑයම් කළ යුතුය. ස්වර්ගයට අපට මගපෙන්වන මාර්ගය එයයි.

*නංගිලාට සහ මල්ලිලාට ඉස්ලාම් ග්‍රන්ථයෙනි.*

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- 1 වන හා 3 වන කණ්ඩායම් තමනට ලැබුණු කාර්ය පත්‍රිකාව කියවන්න.
- සියල්ල සිදුවන්නේ අල්ලාහ්ගේ විධිවිධාන අනුව බව සාකච්ඡා කරන්න.
- 2 වන 4 වන කණ්ඩායම් තම ජීවිතයේ සිදුවූ සිද්ධියකදී, කද්රය විශ්වාස කළ ආකාරය මතකයට නගා ගන්න.
- එය ගැන සාකච්ඡා කර සටහන් කර ගන්න.
- පන්තිය ඉදිරියට පැමිණ අනාවරණය කරගත් කරුණු ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.7.2

## ගවේෂණ පත්‍රිකාව

සෑම කණ්ඩායමකටම කාර්ය පත්‍රිකාවක් ලබාදෙන්න.

| | | |
|---|---|---|
| කණ්ඩායම් 1 - 3 | - | සියල්ල සිදුවන්නේ අල්ලාහ්ගේ අභිමතය පරිදි ය යන්නට සාධක 5 ක් ලියන්න. |
| කණ්ඩායම් 2 - 4 | - | ඔබේ ජීවිතයේ සිදුවූ සිද්ධියක දී කද්ර්ය විශ්වාස කළේ කෙසේ දැයි ලියන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටු කිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කරගෙන ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.1 : අර් කානුල් ඉස්ලාම් පිළිබඳ දැන අනුමාන කරයි.

ක්‍රියාකාරකම 2.1 : ඉස්ලාම් පිළිබඳ අවබෝධය ලබා ගනිමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.1.1 හි සඳහන් තොරතුරු ගොනුව
- ඇමුණුම 2.1.2 හි සඳහන් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.1.1 :
- ★ ඇමුණුම 2.1.1 හි ඇති තොරතුරු ගොනුව සිසුන්ට පෙන්වන්න.
- ★ එය කියවා අවබෝධ කර ගැනීමට සලස්වන්න.
- ★ පසුව එය ඉවත් කරන්න.
- ★ පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

> - ඉස්ලාම් මිනිස් සමාජයේ වෙනස්කම් ඇති කිරීම සඳහා පහළ කරන ලද ආගමක් බව
> - ඉස්ලාම් සමාජානුයෝගී බව
> - ඉස්ලාමීය යුතුකම්වලට පිටුපසින් අරමුණු රැසක් ඇති බව

පියවර 2.1.2 :
- ★ සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- ★ සෑම කණ්ඩායමකටම ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් ආදිය ලබා දෙන්න.
- ★ ඇමුණුම 2.1.2 පිටපතක් බැගින් ලබා දෙන්න.
- ★ මාතෘකා 3 යටතේ ඇතුළත් කළ යුතු කරුණු ලැයිස්තුගත කරන ලෙස දන්වන්න.
- ★ සිසුන් ක්‍රියාකාරකම්වල යෙදීමට සලස්වා නිරීක්ෂණය කරන්න.

පියවර 2.1.3 :
- ★ සෑම කණ්ඩායමට ම සිය වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ පළමුව වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ සෑම කණ්ඩායමක් ම සිය වාර්තාව ඉදිරිපත් කළ පසු අන් කණ්ඩායම් එම වාර්තාව පිළිබඳ සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අන් කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත සඳහන් කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- මුස්ලිම්වරු අල්ලාහ් ද මලාඉකාවරු ද නබිවරු ද කියාමා දිනය ද කලා කද්ර්‍ය ද විශ්වාස කළ යුතු බව
- ඉස්ලාමයේ, සලාතය, සව්මය, zසකාත් හා හජ් යන වගකීම් ඇතුළත් බව
- ඉස්ලාමයේ,
  අන්‍යොන්‍ය උදව් කිරීම
  මුසාබහා කිරීම
  මඳ සිනහ පෑම
  සංග්‍රහ කිරීම
  සහෝදරත්වය වැනි යහගුණ රැසක් ඇතුළත් බව
- ඉස්ලාම් මිනිස් සමාජය තුළ විවිධ වෙනස්කම් ඇති කළ බව
- වගකීම් ඉටු කිරීම මගින් සහෝදරත්වය, සමානාත්මකතාවය වැනි ගුණ ඇති කරන බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ඊමාන්හි ඇතුළත් කරුණු සඳහන් කරයි.
- ඒ ඒ අවස්ථාවල දී වගකීම් ඉටුකළ යුතු බව වටහා ගනියි.
- ඊමාන් කළ යුතු අංග හා ඉස්ලාම් හි යුතුකම් ලියා ආදර්ශනය කරයි.
- ජීවිතයේ වගකීම්වල අරමුණු ලඟා කරගෙන ජීවත් වෙයි.
- වගකීම් ක්‍රමවත් ව ඉටු කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 2.1.1

ඉස්ලාමයේ පළමු අංගය ඊමාන් ය. අල්ලාහ්, මලාඉකාවරු ආගම්, දූතයින්, කියාමා දිනය වැනි දේ විශ්වාස කළ යුතු බවත්, අල්ලාහ්ගේ පෙර මිනුම් අනුව සෑම ක්‍රියාවක්ම සිදුවන බවත් විශ්වාස කළ යුතුයි. මුස්ලිම් වරයෙකු වන්නේ එවැන්නා ය.

මුස්ලිම්වරුන් නියමිත වේලාවේ දී සලාත් ඉටු කළ යුතුය. රමළාන් මාසයේ දී සව්මය ඉටු කළ යුතුය. පහසුකම් ඇත්තන් zසකාත්, හජ් යන යුතුකම් ඉටු කළ යුතුය.

ඉස්ලාමය විසින් අසල්වැසියා සහෝදරත්වයෙන් සැලකේ. සලාම් කීම, මුසාබහා කිරීම, මදහස පෑම, සංග්‍රහ කිරීම, දන් පින් කිරීම වැනි කාර්ය තුළින් සහෝදරත්වය පිළිබිඹු වේ.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- එක් එක් කණ්ඩායම තමාට දෙන ලද ක්‍රියාකාරකමෙහි යෙදෙයි.
- ඔබට ලබාදී ඇති මාතෘකා ගැන සාකච්ඡා කොට අදාළ වන තොරතුරු ලියාගැනීමට සලස්වන්න.
- ඔබ ලියූ තොරතුරු පත්‍රිකාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 2.1.2

- *මෙම කාර්ය පත්‍රිකාව එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කරන්න.*
- *සාකච්ඡා කර පිළිතුරු දීමට යොමු කරන්න.*

1. අප ඊමාන් කළ යුතු කරුණු පිළිවෙලින් ලියන්න.
2. අනිවාර්ය වූ ඉස්ලාමීය වගකීම් මොනවා ද ?
3. ඉබාදතයන්හි යෙදීම නිසා මුස්ලිම් වරයෙකු සතුවන මූලික යහගුණ මොනවා ද ?

නිපුණතාව 2.0 : මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටු කිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කරගෙන ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.2 : කලිමා පහ ඉගෙන ඒ අනුව තව්හීදය පිළිගෙන ක්‍රියා කරයි.

ක්‍රියාකාරකම 2.2 : කලිමා දැන උසුරමු .

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.2.1 හි ගවේෂණ උපදෙස් පත්‍රිකා
- ඇමුණුම 2.2.2 හි තොරතුරු ගොනුව
- බ්‍රිස්ටල් කඩදාසි
- කතුරු
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.2.1 :
- ★ තොරතුරු ගොනුවේ ඇති කලිමා කියවා පෙන්වන්න.
- ★ සිසුන් ලවා කියවීමට සලස්වන්න.
- ★ කලිමාව පිළිබඳ සිසුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- කලිමා පහක් ඇති බව
- කලිමා මගින් ඊමාන්හි අංග විස්තර කරන බව
- කලිමා වැකි කුර්ආනයේ හා හදීස්හි සඳහන් වන බව
- කලිමා කටපාඩම් කර උසුරිය යුතු බව

පියවර 2.2.2 :
- ★ පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.
- ★ ඇමුණුම 2.2.1 හි සඳහන් ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- ★ ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් ලබා දෙන්න.
- ★ සිසුන්ගේ ක්‍රියාකාරකමෙහි යෙදෙන විට සාකච්ඡා කර මඟ පෙන්වන්න.
- ★ කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

පියවර 2.2.3 :
- ★ කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ පළමුව වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු ව අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ අනික් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කරවන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- කලිමා තයියබා, කලිමා ෂහාදා, කලිමා තම්ජිද්, කලිමා තව්හිද් , කලිමා රද්දුල් කුෆ්ර් යන කලිමා පහක් ඇති බව
- පළමු කලිමාව අල්ලාහ්ගේ පැවැත්ම ද, නබි (සල්) තුමාගේ නුබුව්වතය ද තහවුරු කරන බව
- දෙවන කලිමාව මෙමතහවුරු කිරීමට, සාක්ෂි ඉදිරිපත් කරන බව
- ඊළඟ කලිමා මගින් අල්ලාහ්ගේ බල පරාක්‍රමය ගෙන හැර දක්වන බව
- කලිමා උසුරීමෙන්, යහඵල බොහොමයක් ඇති වේ යැයි හදිස්හි සඳහන් වන බව
- අදාළ අවස්ථාවලදී කලිමා උසුරිය යුතු බව.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- කලිමාවල වැදගත්කම දැන ඒවා උසුරීම අවශ්‍ය අවස්ථා හඳුනාගෙන උසුරයි.
- කලිමා උසුරීමෙන් යහඵල ලබාගත යුතු බව පිළිගනී.
- කලිමා පාරායන කිරීමේ ක්‍රියාවල කැමැත්තෙන් යෙදෙයි.

ඇමුණුම 2.2.1

## විස්තර පත්‍රිකාව

لَا إِلَهَ إِلاَّ اللهُ محمد رسول الله

أشهد أن لاإله الا الله وحده لا شريك له
وأشهد أن محمدا عبده ورسوله

سبحان الله والحمد لله ولا إله الا الله والله اكبر
ولا حول ولا قوة الا بالله العلي العظيم

ඇමුණුම 2.2.2

## ගවේෂණ උපදෙස් පත්‍රිකාව

ගවේෂණ පත්‍රිකා ලබාදී කණ්ඩායමේ සාමාජිකයන්ගේ අවධානය එයට යොමු කරවන්න.

කණ්ඩායම 1 - 1 වන, 2 වන, 3 වන කලිමාවන් හි එකිනෙක පද වෙන් වශයෙන් බ්‍රිස්ටල් බෝඩ් හි සටහන් කර කූඩයක දමන්න.

කණ්ඩායම විසින් නිවැරදි අයුරින් කලිමාව බ්‍රිස්ටල් බෝඩ් හි ඇලවිය යුතුයි.

**කණ්ඩායම 2** - 4 හා 5 වන කලිමාවන් හි පද එකිනෙක වෙන්කොට බ්‍රිස්ටල් බෝඩ් හි සටහන් කොට කූඩයක දමන්න.

කණ්ඩායම විසින් නිවැරදි අයුරින් කලිමාව බ්‍රිස්ටල් බෝඩ් හි ඇලවිය යුතුයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටු කිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කරගෙන ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.3 : පිරිසිදුකම පිළිබඳ ව දැන අනුගමනය කරයි.

ක්‍රියාකාරකම 2.3 : පිරිසිදුකම ගැන දැන ගමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.3.1 ට අදාළ තොරතුරු ගොනුව
- ඇමුණුම 2.3.2 ට අදාළ ගවේෂණ පත්‍රිකාව
- ඕමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.3.1 :
★ ඇමුණුම 2.3.1 හි සඳහන් තොරතුරු ගොනුව කියවා පෙන්වීම
★ පිරිසිදුකම ගැන සිසුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- පිරිසිදුකම ඊමානයේ අංගයක් බව
- සැමවිටම පිරිසිදුකම රැකිය යුතු බව
- පිරිසිදු කරන ද්‍රව්‍ය ලෙස ජලය, පස ආදිය යොදා ගත හැකි බව
- ජලයේ වර්ග කීපයක් ඇති බව

පියවර 2.3.2 :
★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
★ ඇමුණුම් 2.3.1, 2.3.2 ඕමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් කණ්ඩායම්වලට බෙදා දෙන්න.
★ කණ්ඩායම් ගවේෂණ ක්‍රියාවේ යොදවන්න.
★ කණ්ඩායම් අනාවරණ මුළු පන්තියට ම ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

පියවර 2.3.3 :
★ කුඩා කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කිරීමට සලස්වන්න.
★ පළමුව ඉදිරිපත් කළ කණ්ඩායමට තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
★ අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත සඳහන් කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- විවිධ ඉස්ලාමීය අංශ පිළිපැදීමට පිරිසිදුකම අවශ්‍ය වන බව
- පිරිසිදුකම සුරැකීමෙන් ඊමානය සුරැකෙන අතර ස්වර්ගයට යෑමේ අවස්ථාව ද ලැබෙන බව
- ශරීරය, ඇඳුම් හා ස්ථානය සැමවිටම පිරිසිදුව තිබිය යුතු බව.
- නජිස් (අපිරිසිදු දෑ) ඉවත් කිරීමට සමහර විට ජලය ද, අන් අවස්ථාවල වියලි පස ද යොදාගත හැකි බව
- ජලය මාඋන් තහුර්, (ඉතා පිරිසිදු ජලය) මාඋන් තාහිර් (පිරිසිදු ජලය), මාඋන් නජිස් (අපිරිසිදු ජලය) යැයි වර්ග තුනකින් යුත් බව
- මාඋන් තහුර් යන ඉතා පිරිසිදු ජලය, පිරිසිදු කිරීම සඳහා යොදාගත හැකි බව. *උදා* : ගංගා, ඇල, දොළ, ලිං, වර්ෂා ජලය මාඋන් තහුර් ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- පිරිසිදුකමේ වැදගත්කම හා ජලයේ වර්ග දැන ප්‍රකාශ කරයි.
- අපිරිසිදු දෙයින් ඉවත් ව ජීවත් වීමේ හැකියාව ලබයි.
- ශරීරය, ඇඳුම් හා ස්ථානය සැමවිට ම පිරිසිදුව තබාගත යුතු බව අවබෝධ කර ගනී.
- සැමවිටම පිරිසිදුව සිටිය යුතු බවත්, අපිරිසිදු වූ විට පිරිසිදු විය යුතු බවත් පිළිගනී.

ඇමුණුම 2.3.1

# තොරතුරු ගොනුව

*"ඉස්ලාම් පිරිසිදු ය. ඒ නිසා ඔබ ද පිරිසිදුව සිටින්න.*

*මක්නිසා ද යත් පිරිසිදු අයෙකු නොවන කිසිවකු ස්වර්ගයට පිවිසෙන්නේ නැත "* යැයි නබි (සල්) තුමාණෝ පැවැසූහ.

*"ඔබේ ඇඳුම් පිරිසිදු ව තබාගන්න. තවද අපිරිසිදුකම හෙළා දකින්න."* (74:23)

ඇමුණුම 2.3.2

# කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- *ගවේෂණ පත්‍රිකාව ලබා කණ්ඩායමේ සියලු දෙනා එහි අවධානය යොමුකරන්න.*
- *වාර්තාවක් සකස් කොට පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.*

## *ගවේෂණ පත්‍රිකාව*

| | | |
|---|---|---|
| කණ්ඩායම් 1 | - | පිරිසිදුකම පිළිබඳ හදීසයක් හා පිරිසිදුකම මගින් ලැබෙන යහපත් ඵල සොයා සටහන් කරන්න. |
| කණ්ඩායම 2 | - | අපිරිසිදුකම නිසා අත්වන අයහපත් ඵල සොයා සටහන් කරන්න. |
| කණ්ඩායම 3 | - | ජලයේ වර්ග සොයා, ඒවා එකිනෙකට උදාහරණ කිහිපයක් සහිතව ද ලියා දක්වන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටුකිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කරගෙන ඉටු කරයි. |
| නිපුණතා මට්ටම 2.4 | : | නජීස්හි විස්තර දැන නජීස්වලින් වැළකී සිටියි. |
| ක්‍රියාකාරකම 2.4 | : | නජීස්වලින් ඉවත්ව ජීවත් වෙමු. |
| කාලය | : | |
| ගුණාත්මක යෙදවුම් | : | ● ඇමුණුම 2.4.1 තොරතුරු ගොනුව<br>● ඇමුණුම 2.4.2 ගවේෂණ පත්‍රිකාව<br>● ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්<br>● ජලය පිරවූ ප්ලාස්ටික් බාල්දියක්<br>● ප්ලාස්ටික් කෝප්පයක්<br>● දූවිලි සහිත පස<br>● මාකර් පෑන් |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.4.1 :

★ දී ඇති කතාව පන්තියේ ශිෂ්‍යයෙකු ලවා කියවීමට සලස්වන්න.
★ එමගින් පිරිසිදුකමේ වැදගත්කම සාකච්ඡා කරන්න.
★ එම සිද්ධිය පිළිබඳව සිසුන්ගෙන් අදහස් විමසන්න.

පියවර 2.4.2 :

★ පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- නජීස් යනු අපිරිසිදු දෑ බව
- නජීස් හි වර්ග තුනක් ඇති බව
- නජීස් පිරිසිදු කරන ක්‍රම ඇති බව
- නජීස්වලින් පිරිසිදු වී ජීවත් විය යුතු බව

පියවර 2.4.3 :

★ පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.
★ කණ්ඩායම්වලට ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
★ ඩිමයි කඩදාසි, වර්ණ පෑන් සපයන්න.
★ අවශ්‍ය උපදෙස් සපයා ගවේෂණ ක්‍රියාවලියේ යොදවන්න.
★ කණ්ඩායමේ ගවේෂණ වාර්තා ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.
★ කුඩා කණ්ඩායම්වල අනාවරණ පන්තියේ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
★ එම කණ්ඩායමට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
★ අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඇතුළත් වන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- ඉස්ලාමය අනුව පිරිසිදු දේ හා අපිරිසිදු දේ යැයි දෙවර්ගයක් ඇති බව.
- අපිරිසිදු දෑ නජිස් යැයි හඳුන්වන අතර ඒවා වළක්වා ගත යුතු බව.
- දැඩි, මෘදු හා සාමාන්‍ය වශයෙන් නජිස් වර්ග 3 වන බව. බල්ලන් හා ඌරන් දැඩි නජිස්, මළ මුත්‍ර සාමාන්‍ය නජිස් හා මව්කිරි බී හැදී වැඩෙන වසර දෙකට අඩු පිරිමි දරුවකුගේ මුත්‍ර මෘදු නජිස් වන බව
- දැඩි නජිස් පිරිසිදු කිරීමට පස හා ජලය අවශ්‍ය වන බව
- සාමාන්‍ය නජිස් ඉවත් කිරීමට ජලය අවශ්‍ය වන බව
- මෘදු නජිස් ඉවත් කිරීමට ජලය ඉසීම ප්‍රමාණවත් වන බව
- නජිස්වලින් පිරිසිදු වී සිටීම සලාතය වැනි නැමදුම්වල යෙදීමට අවශ්‍ය බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- (අපිරිසිදු) නජිස් හඳුනාගෙන ඒවා පිරිසිදු කරන ආකාරය කියා දෙයි.
- නජිස් වූ විට එය කුමන වර්ගයේ නජිස් දැයි හඳුනාගෙන නියම අයුරින් පිරිසිදු කිරීමේ හැකියාව ලබා ගනී.
- සැමවිටම නජිස්වලින් ඉවත් ව පිරිසිදුව ජීවත් විය යුතුය යන්න අගය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 2.4.1

# තොරතුරු ගොනුව

එය කුඩා ජනාවාසයකි. එහි ජීවත් වූයේ සාමාන්‍ය කම්කරුවන් ය. එහි රෝගීන් රාශියකි. කුඩා දරුවන් අතර ද බොහෝ රෝග දක්නට ලැබේ.

එහි මාර්ග අවට ජලය බැස යන කාණුවල කුඩා දරුවන් මළ මුත්‍ර පහ කරනු දැකිය හැකිය. දරුවෝ, බල්ලන්, බළලුන් සමඟ සෙල්ලම් කරමින් කල් ගෙවති.

ජනාවාසය අසල කුණු ගොඩකි. එහි මළ සතුන් ද කුණු කසල ද ගොඩ ගැසී ඇත. දුර්ගන්ධය දසත පැතිරේ. හරකුන්, බල්ලන්, ඌරන් මෙම කුණු ගොඩ අවුස්සා කමින් සිටිනු දැකිය හැක.

ජනාවාසයේ ජනයාගේ සෞඛ්‍ය තත්ත්වය සොයා බැලීමට පැමිණි සෞඛ්‍ය නිලධාරියා, එම ප්‍රදේශය අධීක්ෂණය කළේය. ඔහු සියලු ජනතාව රැස් කළේය. රැස්වීමේ දී කතාවක් පැවැත්වීමට ඔහු සූදානම් විය. එම නිලධාරියා ඔබ නම් ...

ගවේෂණ උපදෙස් පත්‍රිකාව

- එකිනෙක කණ්ඩායම් තම ගවේෂණ පත්‍රිකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
- ඔබේ කණ්ඩායම හා සාකච්ඡා කර ගවේෂණයෙහි යෙදෙන්න.
- අනෙකුත් කණ්ඩායම් ගවේෂණයෙහි යෙදෙන විට ඔබ නිරීක්ෂණය කළ දෑ සාකච්ඡා කර සටහන් කරගන්න.
- පිරිසිදු කිරීමේ දී පිළිපැදිය යුතු කරුණු සාකච්ඡා කර සටහන් කරගන්න.
- ඔබේ අදහස් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ගවේෂණ පත්‍රිකාව

| | | |
|---|---|---|
| **කණ්ඩායම 1** | - | දැඩි නජීසය පිරිසිදු කරන අයුරු කර පෙන්වන්න.<br>(*උදා* : බල්ලෙක් ලෙවකෑ ඇඳුමක්) |
| කණ්ඩායම 2 | - | සාමාන්‍ය නජීසයක් පිරිසිදු කරන අයුරු කර පෙන්වන්න.<br>(*උදා* : අසූචි තැවරුණු රෙද්දක්) |
| කණ්ඩායම 3 | - | සැහැල්ලු නජීසයක් පිරිසිදු කරන අයුරු රඟ දක්වන්න.<br>(*උදා* : වයස අවුරුදු දෙකකට අඩු මව් කිරි ප්‍රධාන ආහාරය වශයෙන් ගන්නා පිරිමි දරුවකුගේ මුත්‍ර) |

සැ.යු. : *එක් කණ්ඩායමක් තම ක්‍රියාකාරකම ඉදිරිපත් කරන විට අනෙකුත් කණ්ඩායම් එය නිරීක්ෂණය කොට, ඔවුන්ට අත්හැරුණු කරුණු සටහන් කර තම කණ්ඩායමේ සාකච්ඡා කොට වාර්තාවක් පන්තියේ ඉදිරිපත් කරන්න.*

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටුකිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කරගෙන ඉටුකරයි.

නිපුණතා මට්ටම 2.5 : වුළූ හි නීතිරීති තේරුම් ගෙන වුළූ ඉටු කරයි.

ක්‍රියාකාරකම 2.5.1 : ඉස්ලාමීය පිළිවෙලට පිරිසිදුව ජීවත් වෙමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.5.1 හි ඇතුළත් නිරීක්ෂණ පත්‍රිකාව
- පිරිසිදු ජලය
- කුල්ලතයින් ප්‍රමාණයට වැඩි ජලය රැස්කළ හැකි භාජනයක් (ගැ.47½/ ලීටර් 215.9)
- මාර්කර් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.5.1 :
- ★ පන්තියේ කුර්ආන් (මුස්හබ්) පිටපතක් ඇත. එයින් ආයතයක් සෙවීමට අවශ්‍ය බව ප්‍රකාශ කරයි. එය විවෘත කර බැලීමට සූදානම් වුව ද ගුරුවරයා එය වළක්වයි. හේතුව අල්කුර්ආනය පිරිසිදු දෙයකි. එය ස්පර්ශ කළ යුත්තේ පිරිසිදුව සිටින විටය. යනුවෙන් පවසමින් ගුරුවරයා පාඩමට පිවිසීම
- ★ පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව පවත්වන්න.

> - ඉස්ලාම් හි පිරිසිදුකම - අත්තහාරත් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද යන බව
> - සුළු කිල්ල හා මහා කිල්ල යනු කුමක් ද යන බව
> - සුළු කිල්ලෙන් මිදෙන අයුරු කෙලෙස ද යන බව
> - වුළූ කිරීමේ දී සැළකිය යුතු කරුණු මොනවා ද යන බව

පියවර 2.5.2 :
- ★ පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.
- ★ කණ්ඩායමේ කෙනෙකු වුළූ කරන විට අන් සාමාජිකයන්ට එහි අඩුපාඩු සටහන් කරගන්නා ලෙස පවසන්න.
- ★ තම කණ්ඩායමේ සාමාජිකයන් සියල්ලන් විසින් ම සටහන් කළ අඩුපාඩුකම් සියල්ල සටහන් කර ගන්නා ලෙස කණ්ඩායම් නායකයා යොමු කරන්න.

පියවර 2.5.3 :
- ★ පසුව සියල්ලන් එක්රැස් කර කණ්ඩායම් නායකයන් මගින් අඩුපාඩු ඉදිරිපත් කිරීමට සලස්වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සමාලෝචනය කරන්න.

- අත්තහාරත් යනු නෑම අනිවාර්ය වූ අවස්ථාවල ස්නානය කොට පිරිසිදු වීමත්, වුළූඋ කළ යුතු අවස්ථාවල වුළූඃ කර ඉබාදත් කිරීමට සුදුසු තත්ත්වයක සිටීමත් බව.
- මිනිසාගේ සමහර ස්වාභාවික තත්ත්වයන් හා ක්‍රියාවන් නිසා නෑම අනිවාර්ය වන බව
- නියම වූ සමහර ඉබාදතයන් පිළිගනු ලැබීමට වුළූඋ කිරීම අවශ්‍ය වන බව
- වුළූඋ සඳහා සුන්නත් හා ෆර්ල් ඇති බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- වුළූඋ හි ෆර්ල් ලියා දක්වයි.
- ෆර්ල් හා සුන්නත් පිළිපදිමින් වුළූඃ නිවැරදිව ඉටුකරයි.
- නජිස්වලින් ආරක්ෂා වෙයි.
- වුළූඋ හි ෆර්ල් හා සුන්නත් වෙන්කර දක්වයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස් :

- කණ්ඩායමේ සිටින සියල්ලන්ටම කාර්ය පත්‍රිකාවේ පිටපතක් ලබා දෙන්න.
- සෑම කණ්ඩායමකම සාමාජිකයෙක් වුළුඋ කරන අතර එය නිරීක්ෂණය කොට අඩුපාඩු සටහන් කරගන්න. ( √, × යොදන්න.)
- කණ්ඩායමේ සියල්ලන්ගේම අඩුපාඩුකම් සාකච්ඡා කර පන්තියට ඉදිරිපත් කරන්න.

ඇමුණුම 2.5.1

| | නොකළේය × | | | | | කළේය √ | | | | | නිවැරැදි ව - කළේය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කණ්ඩායම් සාමාජිකයන් | | | | | කණ්ඩායම් සාමාජිකයන් | | | | | කණ්ඩායම් සාමාජිකයන් | | | | |
| | 1 | 2 | 3 | 4 | 5 | 1 | 2 | 3 | 4 | 5 | 1 | 2 | 3 | 4 | 5 |
| ෆර්ලයන් | | | | | | | | | | | | | | | |
| 1. නියියත් තැබීම | | | | | | | | | | | | | | | |
| 2. මුහුණ සේදීම | | | | | | | | | | | | | | | |
| 3. වැළමිට ඇතුලුව දෙඅත් සේදීම | | | | | | | | | | | | | | | |
| 4. හිස මස්හු කිරීම | | | | | | | | | | | | | | | |
| 5. වළලුකර ඇතුළත් ව දෙපා සේදීම | | | | | | | | | | | | | | | |
| 5. ඉහත අනුපිළිවෙලට කිරීම | | | | | | | | | | | | | | | |
| සුන්නතයන් | | | | | | | | | | | | | | | |
| 1. කිබ්ලාවට මුහුණලා සිටීම | | | | | | | | | | | | | | | |
| 2. අඋඉදු, බිස්මි උසුරීම | | | | | | | | | | | | | | | |
| 3. මැණික් කටුව දක්වා දෙඅත් සේදීම | | | | | | | | | | | | | | | |
| 4. මිස්වාත් කිරීම | | | | | | | | | | | | | | | |
| 5. කට සේදීම | | | | | | | | | | | | | | | |
| 6. නාසය සේදීම | | | | | | | | | | | | | | | |
| 7. දකුණ පෙරටු කිරීම | | | | | | | | | | | | | | | |
| 8. හිස සම්පූර්ණයෙන් මස්හ් කිරීම | | | | | | | | | | | | | | | |
| 9. කන් දෙක සේදීම | | | | | | | | | | | | | | | |
| 10. එකිනෙක තෙවතාවක් කිරීම | | | | | | | | | | | | | | | |
| 12. වුළුඋ හි දුආ උසුරීම | | | | | | | | | | | | | | | |

* *දුර්වලතා සටහන් කරන්න.*

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටුකිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කරගෙන ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.6 : සලාතයේ වැදගත්කම තේරුම්ගෙන සලාතය ඉටු කරයි.

ක්‍රියාකාරකම 2.6.1 : සලාතය නොකඩවා ඉටුකරමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.6.1 - ගීයක්
- ඇමුණුම 2.6.2 ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.6.1 :

★ ඇමුණුම 2.6.1 ඇතුළත් ගීතය හොඳින් ගායනා කළ හැකි ශිෂ්‍යයෙක් ලවා ගායනය කරවන්න.

★ සිසුන් සලාතය ඉටුකරන්නේ දැයි විමසන්න.

★ සලාතය නිවැරදිව ඉටු නොකිරීමේ ආදීනව සිසුන්ට පවසන්න.

★ පහත කරුණු සම්බන්ධව සාකච්ඡා කරන්න.

- සලාතය ඉස්ලාමයේ ප්‍රධාන කුළුණ බව
- ඊමානය හා කුෆ්රය වෙන්කර දක්වන්නේ සලාතයෙන් බව
- සලාතය ඉටු කිරීම නිසා පව් සමා කෙරෙන බව
- සලාතය පාපී ක්‍රියාවලින් අප සුරකින බව

පියවර 2.6.2 :

★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.

★ එකිනෙක කණ්ඩායම්වලට ගවේෂණ පත්‍රිකා ලබාදෙන්න.

★ එකිනෙක කණ්ඩායම්වලට වර්ණ පෑන්, ලිවීමේ කඩදාසි සපයන්න.

★ සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

★ තම ක්‍රියාකාරකම පන්තියේ ඉදිරිපත් කළ යුතු බව සියළු කණ්ඩායම්වලට පවසන්න.

පියවර 2.6.3 :

★ තම ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට එකිනෙක කණ්ඩායම් කැඳවන්න.

★ දුබලතා හා ප්‍රබලතාවන් පිළිබඳ ව අනෙක් කණ්ඩායම හා සාකච්ඡා කිරීමට සලස්වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු පදනම් කොට ගෙන සමාලෝචනය කරන්න.

- ඉස්ලාමයේ ප්‍රධාන වත්පිළිවෙත සලාතය බව
- සලාතය අනිවාර්ය කරනු ලැබුවේ මිහ්රාජ් ගමනේ දී ය. ඒ නිසා එය අනෙකුත් වත් පිළිවෙත්වලින් වෙනස් වන බව
- සලාතය මඟින් ගැත්තන් අල්ලාහ් සමඟ සම්බන්ධ වන බව
- සලාතය නිසි පරිදි ඉටු කිරීම නිසා පව් සමා කෙරෙන බව
- සලාතය හේතුවෙන් පුද්ගලික හා සමාජ වෙනස්කම් ඇති වන බව
- සලාතය ඉටු නොකරන්නන්ට අල්ලාහ්ගේ දඬුවම අත්වන බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ඉස්ලාමීය වගකීම්වලින් ප්‍රධාන වගකීම කුමක්දැයි පවසයි.
- සලාතයේ දී පාරායනය කරන දුආ කටපාඩමින් පිළිවෙලින් කියයි.
- සලාත ඉටු කිරීම තුළින් පව් සමාවෙන බව වටහාගෙන සලාතයේ නිරත වේ.
- සලාතයේ යහඵල වටහාගෙන නොකඩවා සලාතයේ නිරත වේ.
- පස්වේල් සලාතය ජමාඅත් සමග නොවරදවා ඉටු කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 2.6.1

අල්ලාහ්ට අප වැන්දොත්
සැම සතුටම ගලා එතේ
එම නාථයා ගැන සිතුවොත්
යහ දිවියක් ළඟා වෙතේ } /// (අල්ලාහ්ට)

දෙව් මැදුරක් තිබිලත්
ඇරයුම් හඬ ඇසිලත්
පල්ලි යාමට සිත නැත්දෝ
මැවුම්කරුවා අමතක දෝ } /// (අල්ලාහ්ට)

දේව මග පෙන්වීම් තිබිලත්
දූත නබි ගේ වැකි තිබිලත්
දෑසින් නොබලන්නෙහි දෝ
දෙකනින් නොඅසන්නෙහි දෝ } /// (අල්ලාහ්ට)

සියළුම දෙව් අණ
හද පත්ලෙන් පිළිගනිමු
දූත නබිගේ දේශනයන්
මිහිතලයේ පතුරුවමු } /// (අල්ලාහ්ට)

ඇමුණුම 2.6.2

*මෙම ගවේෂණ පත්‍රිකාව එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කර ක්‍රියාකාරකමෙහි යොදවන්න.*

## ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම 1 - සලාතයේ ප්‍රයෝජනයන් සාකච්ඡා කර ලැයිස්තුගත කරන්න.

කණ්ඩායම 2 - දෛනිකව ඇති පංච කාල සලාතය පදනම් කොට ගෙන ඔබගේ එක් දිනක කාල සටහනක් සකස් කරන්න.

කණ්ඩායම 3 - සලාතයේ වැදගත්කම පිළිබඳ ව පවසන හදීස් 5 ක් සොයා අර්ථය සමඟ සටහන් කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටු කිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කොට ගෙන ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.7 : අzදානය හා දුආව දැන ක්‍රියාත්මක කරයි.

ක්‍රියාකාරකම 2.7 : අzදානයට සවන් දෙමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම අංක 2.7.1හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- අzදානය පටිගත කළ කැසට් පටිය හෝ සිත්ගන්නා අයුරින් අzදාන් කීමට හැකි ශිෂ්‍යයෙක්
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.7.1 :
- ★ අzදානය තැටිගත කළ කැසට් පටිය ක්‍රියාකරවන්න. නැතහොත් සිත්ගන්නා අයුරින් අදාත් පැවසීමට ශිෂ්‍යයෙකු යොමු කරන්න.
- ★ අzදාන් සම්බන්ධ ශිෂ්‍යයන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ පහත කරුණු මතුවන අයුරින් සාකච්ඡා කරන්න.

> - පස්වේල් සලාතයට කරන ආරාධනාව අzදානය වන බව
> - අzදාන් පැවසීමට අධික ආනිශංස ඇති බව
> - අzදාන්ය අසා පිළිතුරු දිය යුතු බව
> - අzදාන්ය අවසානයේ දුආ පාරායනය කළයුතු බව

පියවර 2.7.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ කණ්ඩායම්වලට නියමිත ගවේෂණ පත්‍රිකාවේ පිටපත ලබාදෙන්න.
- ★ ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් කණ්ඩායම්වලට එක බැගින් දෙන්න.
- ★ කණ්ඩායම්වල ශිෂ්‍ය ක්‍රියාකාරීත්වය තහවුරු කරන්න.
- ★ සෑම කණ්ඩායමක්ම තම ගවේෂණ වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතු බව පවසන්න.

පියවර 2.7.3 :
- ★ කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ ප්‍රථමයෙන් වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ අනෙකුත් කණ්ඩායම්වලට තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත සඳහන් කරුණු පදනම් කොට ගෙන සමාලෝචනයෙහි යෙදෙන්න.

- නබි (සල්) තුමාගේ කාලයේ සිට සලාතය සඳහා මිනිසුන්ට ආරාධනා කළ ක්‍රමය අදාන් බව
- අදාන් පැවසීමේ කාර්ය මුලින් ම ඉටුකළේ බිලාල් (රළි) තුමා බව අදාන් පවසන්නන්ට පරලොව දී උසස් තත්ත්ව පිරිනමනු ලබන බව
- අදාන් ඇසෙන විට සාවධානව සිට පිළිතුරු දිය යුතු බව
- අදාන් අවසන් වූ විගස දුආ උසුරා සලාතය ඉටු කිරීමට යා යුතු බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- අදානයේ අරමුණ, එහි වදන් හා එයට පිළිතුරු දිය යුතු ක්‍රමය පවසයි.
- අදානය ඇසෙන විට එයට ගරු කරමින් සාවධානව පිළිතුරු සපයයි.
- අදානය අවසානයේ දුආ පාරායනය කරයි.
- අදාන් පැවසීමට කැමති වෙයි.
- අදාන් හඬත් සමඟ සලාතය සඳහා කඩිනමින් යෑමේ පුරුද්ද ඇති කර ගනී.

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | අදාන් වාක්‍යවලට පිළිතුරු දිය යුතු ක්‍රමය B කොටසින් තෝරා A කොටසේ අදාළ ස්ථානයට ඉදිරියෙන් ලියන්න. |
| කණ්ඩායම 2 | - | අදානයේ වාක්‍යවල අර්ථය සටහන් කරන්න. |
| කණ්ඩායම 3 | - | අදාන් දුආවේ හිස්තැන්වලට සුදුසු පද තෝරා ලියන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 2.7.1

# ගවේෂණ පත්‍රිකාව

(කණ්ඩායම 1)

ඇදානයට දිය යුතු පිළිතුරු තෝරා සුදුසු අයුරින් ලියන්න.

## A කොටස

(1) الله اكبر الله اكبر ..............................................................................................

(2) أشهد أن لا إله إلا الله ..............................................................................................

(3) أشهد أن محمدا رسول الله ..............................................................................................

(4) حي على الصلاة ..............................................................................................

(5) حي على الفلاح ..............................................................................................

## B කොටස

(අ) لا حول ولا قوة إلا بالله العلي العظيم

(ආ) الله اكبر الله اكبر

(ඉ) لا حول ولا قوة إلا بالله العلي العظيم

(ඊ) أشهد أن لا إله إلا الله

(උ) لا حول ولا قوة إلا بالله العلي العظيم

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

(කණ්ඩායම 2)

**A** *කොටසින් සුදුසු අර්ථය තෝරා* **B** *කොටසට යා කරන්න.*

| | **A** කොටස | **B** කොටස |
|---|---|---|
| (අ) | වහා පැමිණෙන්න. | الله اكبر |
| (ආ) | අල්ලාහ්ගේ දූතයා | لآإله الا الله |
| (ඉ) | නින්ද | أشهد |
| (ඊ) | මම සාක්ෂි දරමි | حي |
| (උ) | අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය. | الفلاح |
| (ඌ) | ජයග්‍රහණය | الصلاة |
| (එ) | උතුම් | رسول الله |
| (ඒ) | සත්‍යම පැවසීය | خير |
| (ඔ) | සලාතය | نوم |
| (ඕ) | නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර වෙන කිසිවෙක් නොමැත | صدقت |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

(කණ්ඩායම 3)

*පහත සඳහන් හිස්තැන්වලට සුදුසු පද යොදා පුරවන්න.*

اللهم ______________ هذه______________ التامة

والصلاة___________ أت______________ الوسيلة

___________وابعثه___________ محمودا

___________وعدته___________لا__________

التامة تخلف رب الدعوة الفضيلة الذى

الميعاد محمد مقاما إنك

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටුකිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කරගෙන ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.8 : සලාතයේ ෂර්ත්, ෆර්ල්, මුබ්තිලාත් දැන සලාතය ඉටු කරයි.

ක්‍රියාකාරකම 2.8.1 : සලාතයේ නීති රීති පිළිපදිමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම් 2.8.1 හි ඇතුළත් විස්තර පත්‍රිකාව
- ඇමුණුම 2.8.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව (අවශ්‍ය තරම් පිටපත්)
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.8.1 :
- ★ ඇමුණුම් 2.8.1 හි ඇතුළත් හදීසය සිසුන්ට කියවා පෙන්වන්න.
- ★ සලාතයේ වැදගත්කම පිළිබඳ ව සිසුන්ගේ පෙර දැනුම ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ★ නබි (නබි) තුමා හා සහාභාවරු සලාතය වැදගත්කොට සැලකූ බව පවසා එහි වැදගත්කම අවබෝධ කර ගැනීමට සලස්වන්න.
- ★ පහත කරුණු ගොඩනැගෙන අයුරින් සාකච්ඡා කරන්න.

> - සලාතය ඉතා වැදගත් වගකීමක් වන බව
> - සලාතයේ ෂර්ත්, ෆර්ල්, මුබ්තිලාත් ඇති බව
> - ඉහත ෂර්ත් හා ෆර්ල් සැළකිල්ලෙන් යුතු ව පිළිපැදීමෙන් හා මුබ්තිලාත්වලින් වැලකීමෙන් සලාතය පරිපූර්ණ වන බව

පියවර 2.8.2 :
- ★ සිසුන් සමාන කණ්ඩායම්වලට බෙදන්න.
- ★ එකිනෙක කණ්ඩායම්වලට ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- ★ එකිනෙක කණ්ඩායම්වලට ඩිමයි කඩදාසි හා මාකර් පෑන් ලබා දෙන්න.
- ★ සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම නිරීක්ෂණය කොට තහවුරු කරන්න.
- ★ එකිනෙක කණ්ඩායම් තම ක්‍රියාකාරකම පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

පියවර 2.8.3 :
- ★ එකිනෙක කණ්ඩායම්වලට තම ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ අනෙකුත් කණ්ඩායම්වලට තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු පදනම් කොට ගෙන සමාලෝචනයේ යෙදෙන්න.

- ඉස්ලාමයේ මූලික වගකීම් අතර සලාතය දෙවන වගකීම වන බව
- සලාතය ඉටු කිරීමට අදාළ ෂර්තයන් 10 ක් ඇති බව
- සලාතය පරිපූර්ණ වීම සඳහා ෆර්ල් 19 ක් ඇති බව
- සලාතයට වින කරන ක්‍රියාවන් (මුබ්තිලාත්) 10 ක් ඇති බව
- සලාතයේ ෂර්ත්, ෆර්ල්, මුබ්තිලාත් දැන සැළකිල්ලෙන් යුතුව ඉටුකිරීමෙන් එය පූර්ණත්වයට පත් වී යහඵල ලබා දෙන බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- සලාතයේ විශේෂත්වය හා වැදගත්කම හඳුනාගනී.
- සලාතයේ ෂර්ත්, ෆර්ල්, මුබ්තිලාත් දැනගනී.
- සලාතයේ නීතිරීති අනුගමනය කරමින් එය ඉටු කළ යුතු බව පිළිගනී.
- පස්වේල් සලාතයන් සැළකිලිමත් ව ඉටු කරයි.

ඇමුණුම 2.8.1

## විස්තර පත්‍රිකාව

නබි (සල්) තුමාගෙන් තමා ඇසූ බව අබූ හුරෙයිරා (රළි) මෙසේ දැනුම් දෙයි.

*ඔබ නිවස ඉදිරියෙන් ගඟක් ගලා බසින්නේ යැයි සිතන්න. කෙනෙකු දිනපතා එහි පස් වතාවක් ස්නානය කරයි. ඔහුගේ ශරීරයේ අපවිත්‍ර දෙයක් තිබිය හැකි දැ යි විමසූ විට, කිසිදු අපවිත්‍ර දෙයක් නොරැඳෙන බව සහාභාවරුන් පැවසූහ.*

මෙය පස්වේල් සලාතයට උදාහරණයකි. *පස්වේල් සලාතය මගින් අල්ලාහ් පාපයන් ඉවත් කරයි යනුවෙන් නබි (සල්) තුමා පැවසූහ.*

*(මූලාශ්‍රය - බුහාරි, මුස්ලිම්)*

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- සියළු දෙනා තම කණ්ඩායම් ක්‍රියාකාරීත්වයට දායක වන්න.
- කණ්ඩායම් වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 2.8.2

## ගවේෂණ පත්‍රිකාව

(කණ්ඩායම 1)

පහත දැක්වෙන පින්තූරවල සලාතයේ ෆර්ලයන් සොයා පිළිවෙලින් ලියන්න.



(1) මක්කාවට මුහුණලා
අල්ලාහු අක්බර් යනුවෙන් පවසා



(2) අත් ඔසවා



(3) රුකූ ඉරියව්ව
සුබ්හාන රබ්බියල් අලීම්



(4) සමිඅල්ලාහු ලිමන් හමිදා
රබ්බනා ලකල් හම්ද්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

(කණ්ඩායම 2)

පහත දැක්වෙන පින්තූරවල සලාතයේ ෆර්ල් සොයා පිළිවෙලින් ලියන්න.



සජ්දා ඉරියව්ව
සුබ්හාන රබ්බියල් අඃලා වබිහම්දිහි



මැද ඉදුම(ඉදිරිපස පෙනුම)



මැද ඉදුම (පසුපස පෙනුම)



සලාතය අවසානයේ
සලාම් පැවසීම (දකුණු පස)



සලාම් පැවසීම (වම්පස)



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් අංක 3 - පහත වාක්‍යවලින් සලාතයේ ෂර්තයන් තෝරා ලියන්න.

කණ්ඩායම් අංක 4 - පහත වාක්‍යවලින් සලාතයේ මුබ්තිලාතයන් තෝරා ලියන්න.

- සලාතයේ යෙදී සිටිය දී එය අත්හරින්නේ දැයි සිතීම
- මුස්ලිම්වරයකු වීම
- නැම අනිවාර්ය වූ අය එය ඉටු කිරීම. වුළූ නොමැති අය එය ඉටු කිරීම.
- සලාතය ඉටු කිරීමේ දී එකම ක්‍රියාවක් නොකඩවා තුන් වතාවක් කිරීම.
- අල් කුර්ආන්, දුආ නොවන වෙනත් යමක් පැවසීම
- තම්යීස් නැමැති වෙන් කොට හඳුනා ගැනීමේ තත්ත්වයට පත්වීම.
- අව්රත් ආවරණය
- ඕනෑකමින් කැහීම හා කථාකිරීම
- කිබ්ලාවට මුහුණලා සිටීම
- ශබ්ද නගා සිනාසීම හෝ ඇඬීම
- සවුමය කඩවන ක්‍රියාවල යෙදීම
- ශරීරය, ඇඳුම්, ස්ථානය පිරිසිදුව තිබීම
- කිබ්ලාවෙන් පපුව වෙනත් දිශාවකට හැරවීම
- සලාතය තමාට අනිවාර්ය වන බව දැනගැනීම
- ෆර්ල් වූ ක්‍රියාවක් ඕනෑකමින් වැඩිපුර කිරීම
- සලාතයේ වේලාව දැන සිටීම
- අව්රතය අනාවරණය වූ විට එය නොසලකා හැරීම
- සලාතය ඉටුකරන ක්‍රමය දැන සිටීම
- ෆර්ලය හෝ ෂර්තය අත්හැරීම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | : | මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටු කිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කර ගෙන ඉටු කරයි. |
| නිපුණතා මට්ටම 2.9 | : | සලාතයේ, උසුරුම් කට පාඩම් කර සලාතයේ දී උසුරයි. |
| ක්‍රියාකාරකම 2.9 | : | සලාතයේ උසුරුම් දැන පිළිපදිමින් සලාතය ඉටුකරමු. |
| කාලය | : | |
| ගුණාත්මක යෙදවුම් | : | ● රෙකෝඩරය<br>● වාක්‍ය ලියූ කාඩ්පත්<br>● ඇමුණුම 2.9.2 ගවේෂණ පත්‍රිකාව<br>● සූරා ෆාත්තිහා, අත්තහියියාත් පටිගත කළ කැසට් පටිය<br>● ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්<br>● මුසල්ලා/පැදුරු (ප්‍රමාණවත් සංඛ්‍යාවක්) |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.9.1 :

★ කැසට් රෙකෝඩරය ක්‍රියාත්මක කර, සූරාෆාත්තිහාව හා අත්තහියියාත් යන දෙක වෙන වෙන ම මුළු පන්තියටම ඇසෙන්නට සලස්වන්න. එයට සාවධානව අසා සිටීමට සිසුන් යොමු කරන්න.

★ මේවා පාරායනය කරන අවස්ථා ගැන කීමට සිසුන්ට අවස්ථා සලසන්න.

★ පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- සලාතයේ දී උසුරන සමහර පාරායනයන් අනිවාර්ය වන බව
- සූරා ෆාත්තිහාව සහ අත්තහියියාත් යන දෙක සලාතයේ දී පාරායනය කළ යුතු බව
- සලාතයේ දී උසුරන පාරායනයන් කට පාඩම් කර උසුරිය යුතු බව
- සූරා ෆාත්තිහාව සහ අත්තහියියාත් පාරායනය නොකළ සලාතය වළංගු නොවන බව

පියවර 2.9.2 :

★ පන්තිය කණ්ඩායම් 6කට බෙදන්න.

★ කණ්ඩායම්වලට වාක්‍ය ලියූ කාඩ්පත් ලබා දෙන්න.

★ ගවේෂණ පත්‍රිකා ලබාදෙන්න.

★ ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් කණ්ඩායම්වලට සපයන්න.

★ සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

★ කණ්ඩායම් වාර්තාව පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 2.9.3 :

★ එකිනෙක කණ්ඩායම්වලට පන්තියේ තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ අනෙකුත් කණ්ඩායම්වල අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

★ පහත කරුණු පදනම් කොට ගෙන සමාලෝචනයේ යෙදෙන්න.

- සලාතයේ පාරායනාවන් බොහෝ ඇත. ඒවායින් සමහරක් සුන්නත් ය. අනෙක් ඒවා ෆර්ල් ය. ෆර්ල් වූ පාරායනය අනිවාර්යයෙන් ම පාරායනය කළ යුතුය.
- සලාතයේ අනිවාර්ය පාරායනාවන් වන සූරා ෆාත්තිහා සහ අත්තහියිය්යාතය නිවැරදිව කටපාඩම් කර උසුරිය යුතු බව,
- සූරා ෆාත්තිහා සහ අත්තහියිය්යාත් නො උසුරන කිසිදු සලාතයක් වළංගු නොවන බව
- සියල්ලන්ම මෙය කටපාඩම් කොට සලාතයේදී පාරායනය කළ යුතු බව

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- සලාතය උදෙසා අනිවාර්ය වන පාරායනයන් වන්නේ සූරා ෆාත්තිහා හා අත්තහියියාත් ඉටුවීම ය.
- සූරා ෆාත්තිහා සහ අත්තහියියාත් වනපොත් කිරීමට ඉදිරිපත් වෙයි.
- සලාතයේ දී එය පාරායනය කරයි.
- එය නිවැරදිව පාරායනය කළ යුතුය යන ආකල්පය ලබා ගනී.

ඇමුණුම 2.9.1

සූරා ෆාතිහාවේ වාක්‍ය හය වෙන වෙනම සටහන් කරන්න. එලෙස අත්තහියියාතයද සටහන් කරගන්න.

මේ අයුරින් අත්තහියාත් 3ක් ද, සූරා ෆාතිහා තුනක් ද සටහන් කරගන්න. ඒවා එකිනෙක කණ්ඩායම්වලට ඉදිරිපත් කර ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## සූරා ෆාත්තිහා

بسم الله الرحمن الرحيم

الحمد لله رب العالمين

الرحمن الرحيم

ملك يوم الدين

إياك نعبد وإياك نستعين

اهدنا الصراط المستقيم

## අත්තහියාත්

صراط الذين انعمت عليهم غير المغضوب عليهم ولا الضالين

التحيات المباركات الصلوات الطيبات لله

السلام عليك ايها النبي ورحمة الله وبركاته

السلام علينا وعلى عباد الله الصالحين

أشهد أن لا اله الا الله

وأشهد أن محمدا رسول الله

اللهم صل على محمد وعلى آل محمد



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- එකිනෙක කණ්ඩායම් තමන් ලබාගත් වාක්‍ය ලියූ කාඩ්පත් කෙරෙහි අවධානය යොමු කරන්න.
- ඒවා සාමාජිකයන් අතර මාරුවෙන් මාරුවට අංක පිළිවෙලට කියවන්න.
- තමන් ලබාගත් ගවේෂණ පත්‍රය හොඳින් අධ්‍යයනය කරන්න.
- සලාතයේ එම පාරායනයන් අන් අයටත් ඇසෙන අයුරින් මදක් ශබ්ද නගා කියවන්න.
- සලාතයේ යෙදෙන කණ්ඩායම් නිරීක්ෂණය කොට වැදගත් කරුණු සාකච්ඡා කරන්න.
- ඔබේ අදහස් පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 2.9.2

## ගවේෂණ පත්‍රිකාව

- සූරා ෆාත්තිහා හා අත්තහියියාත් වැකි, අංක සහිතව කාඩ්පත්වල සටහන් කරගන්න.
- කණ්ඩායම්වලට බෙදා දී කණ්ඩායමේ සාමාජිකයන් එකිනෙක හුවමාරු කරමින් අංක පිළිවෙලට නැවත නැවතත් කියවීමට සලස්වන්න.
- එක් කණ්ඩායමක් ශබ්ද නගා පාරායනය කරමින් සලාතයේ යෙදිය යුතු අතර අනෙක් කණ්ඩායම් එය නිරීක්ෂණය කළ යුතුය.
- මෙලෙස සෑම කණ්ඩායමක් ම සලාතයේ යෙදිය යුතුය.
- පසුව තම නිරීක්ෂණයන් වාර්තාවක් ලෙස පන්තියේ ඉදිරිපත් කළ යුතුය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටුකිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කර ගෙන ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.10 : අස්සව්ම් ගැන දැන සව්මය ඉටු කරයි.

ක්‍රියාකාරකම 2.10 : සවුමයේ වැදගත්කම අවබෝධ කොට එය ඉටු කරමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.10.1 හි ඇතුළත් ඡේදය
- ඇමුණුම 2.10.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකාව
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.10.1 :
- ★ ඇමුණුම 2.10.1 හි ඇතුලත් ඡේදය ශබ්දනගා කියවා සිසුන්ට ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- ★ වඩාත් හොඳින් කියවිය හැකි ශිෂ්‍යයෙක් ලවා නැවතත් කියවා ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- ★ පහත කරුණු මතුවන අයුරින් සාකච්ඡා කරන්න.

> - සව්මය ඉටු කිරීම අනිවාර්ය වගකීම බව
> - සව්මය මගින් විවිධ යහඵල ලැබෙන බව
> - එමගින් අකුසලයන් ඉවත් කෙරෙන බව

පියවර 2.10.2 :
- ★ සෑම කණ්ඩායමකටම ඇමුණුමේ 2.10.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා පිටපතක් බැගින් ලබා දෙන්න.
- ★ ඩිමයි කඩදාසි හා වර්ණ පෑන් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- ★ කණ්ඩායම්වල ක්‍රියාකාරකම් නිරීක්ෂණය කොට තහවුරු කරන්න.
- ★ කණ්ඩායම් තම වාර්තාව පන්තියේ ඉදිරිපත් කළ යුතු බව පවසන්න.

පියවර 2.10.3 :
- ★ කණ්ඩායම්වලට තම ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ★ අනෙකුත් කණ්ඩායම්වලටත් තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු පදනම් කොට ගෙන සමාලෝචනයේ යෙදෙන්න.

- රම්ලාන් මාසයේ සෑම දිනකම අරුණෝදයේ සිට ඉර බැසයන තුරු සෑම මුස්ලිම්වරයෙකුම කෑමබීම හා ඉඳුරන් පිනවීමෙන් අල්ලාහ් වෙනුවෙන් වැළැකී සිටීම සවුමය වන බව
- රෝගීන්, කුඩා දරුවන් හා මගියන්ට සවුමය ඉටුකිරීමෙන් නිදහස දී ඇති බව.
- සවුම් මගින් මිනිසාට මෙලොව හා පරලොව ප්‍රයෝජන අත්වන බව
- තරාවීහ්, ඉෆ්තාර්, දන්පින් වැනි ඉබාදත් රම්ලානයේ කෙරෙන බව
- සවුම් යනු අල්කුර්ආන් හා සුන්නාවෙහි බලතල වගකීමක් බව
- ගැත්තාගේ ප්‍රාර්ථනා පිළිගනු ලබන පාපයන්ට සමාව ලැබෙන එක් රාත්‍රියක් රම්ලානයේ ඇති බව

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- සවුමයේ වැදගත්කම හා එය ඉටුකිරීමේ අවශ්‍යතාව දැනගනී.
- සවුමය විනයානුකූලව ඉටුකරයි.
- සවුමයේ අධ්‍යාත්මික හා ලෞකික ප්‍රයෝජන අත්දැකීමෙන් ලබයි
- අනුන්ගේ දුක දැන උපකාර කරයි.
- පාපවලින් හා අයහපත් ගුණාංගයන්ගෙන් ඉවත් වී ජීවත් වෙයි.

ඇමුණුම 2.10.1

## ජේදය

අල්ලාහ්ගේ කැමැත්ත පරිදි සකස් වූ වසරේ නව වන මාසය වන රාමළාන් මාසයේ දී සියළු ඉන්ද්‍රියයන් පාලනය කර සවුමය ඉටු කිරීම අනිවාර්ය වූවකි.

දුගී දුප්පතුන්ගේ ජීවිතයේ දී අත්විඳින දුක් කම්කටොළු හා කුසගින්නේ වේදනාව අන් අය දැන ගැනීමටත්, පහසුකම් ඇති අයට ලබාදෙන පාඩම ලෙසත් සවුමය සැලකේ.

නොකඩවා වෙහෙසෙන අභ්‍යන්තර අවයවවලට විවේකය ලබාදෙමින්, සිතෙහි ඇති තන්හාව දුරු කොට අන් අය සමග බෙදාහදා ගැනීමේ සිතුවිල්ල හද තුළ ඇති කරන්නේත් සවුමයයි.

අන් අය දැකිය යුතුයි, ප්‍රශංසා කළ යුතුයැයි නොසිතා ඉටුකරන එකම ඉබාදතය ලෙස සව්මය සැලකිය හැකිය. එය මිනිසාගේ අකුසලයන් නැති කිරීමේ පුණ්‍ය කර්මයක් ද වන්නේය.

ගවේෂණ පත්‍රිකා සඳහා වූ උපදෙස්

- සෑම කුඩා කණ්ඩායමයක් ම තමන්ට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව ඉතා හොඳින් අධ්‍යයනය කරන්න.
- එය කණ්ඩායම් තුළ සාකච්ඡා කරන්න.
- සවුමයේ ප්‍රයෝජන සවුමයේ දී වැලකී සිටිය යුතු දේ, යහපත් දේ, මතුවන සේ සාකච්ඡා මෙහෙයවන්න.
- ඉතා වැදගත් ලෙස සැලකෙන තොරතුරු පමණක් සටහන් කරගන්න.
- එක් එක් කුඩා කණ්ඩායම් තම තමන්ගේ ගවේෂණ සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට සූදානම් වෙන්න.
- එක් එක් කුඩා කණ්ඩායම් විසින් ඉදිරිපත් වෙන අදහස් තවදුරටත් සංවර්ධනාත්මක ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 2.10.2

## ගවේෂණ පත්‍රිකාව

එක් එක් කුඩා කණ්ඩායම්වලට ලබාදී ගවේෂණයේ යොදවන්න.

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | සවුමය යනු කුමක් ද ? එය කුමන අයට අනිවාර්ය වේ ද යන්න සොයා ලියන්න. |
| කණ්ඩායම 2 | - | සවුමයේ ප්‍රයෝජන පිළිබඳ සාකච්ඡා කර හඳුනාගෙන ඒවා ලැයිස්තුගත කරන්න. |
| කණ්ඩායම 3 | - | පසුගිය සවුම් සමයේ දී ඔබ කළ පුණ්‍ය කර්මයන් ගැන සාකච්ඡා මෙහෙයවා ලැයිස්තුගත කරන්න. |
| කණ්ඩායම 4 | - | මුස්ලිම්වරයෙකු සවුමයේ යෙදී සිටින අවස්ථාවේ ඈත් වී සිටිය යුතු අංගයන් ගැන සාකච්ඡා කර ලියන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටු කිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කර ගෙන ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.11 : සැකාත් ගැන දැන එහි ක්‍රියාකාරකම් ගැන නිරීක්ෂණ සටහන් ලියයි.

ක්‍රියාකාරකම 2.11 : සැකාතය වටහා ගමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.11.1 තොරතුරු ගොනුව
- ඇමුණුම 2.11.2 ගවේෂණ පත්‍රිකා
- ෆෙල්ට් පෑන් හා ඩිමයි කඩදාසි

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.11.1 :
- ★ ඇමුණුම 2.11.1 හි අඩංගු කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න.
- ★ සැකාත් යන්නෙහි වචනාර්ථය තේරුම් කරගන්න.
- ★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- ඉස්ලාමීය වගකීම් අතර zසකාත් ද එකක් බව
- zසකාත් ලැබිය හැක්කේ යම් සුවිශේෂී පිරිස්වලට බව
- අන් අයට zසකාත් ලැබීමට අයිතියක් නැති බව
- කිසියම් ප්‍රමාණයට වඩා සම්පත් ඇති අයට zසකාත් වගකීම අනිවාර්ය බව
- zසකාතය සාමූහිකව ලබාදීමෙන් එය ලබන්නාට වැඩි ප්‍රයෝජන ලැබෙන අතර zසකාත් දෙන්නාට වැඩි යහඵල අත්වන බව

පියවර 2.11.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ කණ්ඩායම්වලට ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- ★ එක් එක් කණ්ඩායම්වලට ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් ලබා දෙන්න.
- ★ එක් එක් කණ්ඩායමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කරන්න.

පියවර 2.11.3 :
- ★ කුඩා කණ්ඩායම්වල අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.
- ★ ඉදිරිපත් කළ කරුණුවලට අදාළ තම අදහස් ඉදිරිපත් කිරීමට අනිකුත් කණ්ඩායමට අවස්ථා සලස්වන්න.
- ★ අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ කණ්ඩායම් සියල්ල අනාවරණ ඉදිරිපත් කළ පසු පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- ඉස්ලාමීය වගකීම් අතර සලාතය හා zසකාතය වෙන් කොට සැලකිය නොහැකි බව
- zසකාත් ලැබීමට හිමිකම් ඇති කොටස් අටක් ගැන කුර්ආන් හා හදීස්හි අර්ථ දක්වා ඇති බව
- zසකාත් අනිවාර්ය වන ද්‍රව්‍යවලට අදාළ නිසාබ් ඇති බව
- ඒ ඒ ද්‍රව්‍ය නිශ්චිත ප්‍රමාණ ඇති බව
- අදාළ කොටස් 8 හැර අනිකුත් අයට zසකාත් හිමි නැති අය බව
- zසකාත් වගකීම ඉටු කිරීම නිසා මෙලොව හා පරලොව ආනිශංස ඇති වන බව
- zසකාත් ඉටු නොකළේ නම් පව් හා දඬුවම් හිමිවන බව
- සදකා හා zසකාත් යන වචන දෙක අල් කුර්ආනයේ සඳහන් වන්නේ එකම අර්ථයෙන් බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- zසකාත් ලැබීමට සුදුසු අය කවුරුන්දැයි නම් කරයි.
- zසකාත් අනිවාර්ය වූ ද්‍රව්‍ය හඳුනා ගනී.
- ඇති අය නැති අයට උදව් උපකාර කළ යුතු බව පිළිගනී.
- zසකාත් අනිවාර්ය වන ද්‍රව්‍යවල පින්තූර රැස්කර අලවා පොත් පිංචක් සකස් කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 2.11.1

## තොරතුරු ගොනුව

සලාම් සුනාමියෙන් සියල්ල අහිමි වී අනාථ වී පැමිණි අයෙකි. ඔහු අද තරමක් විශාල වෙළෙඳ ව්‍යාපාරයක හිමිකරුවෙකි. ඉස්ලාමීය පුවත්පතකට ඔහු ලබා දුන් සම්මුඛ සාකච්ඡාවක් පහත දැක්වේ.

*"සුනාමියෙන් මගේ ගේ දොර වෙළෙඳ සැල් යනාදී සියල්ල විනාශ වුනා. මගේ පවුලේ සාමාජිකයන් කිහිප දෙනෙක් ද නැති වුනා. කිසිවකුත් නැති අයෙකු ලෙස මෙම ප්‍රදේශයට පැමිණ පල්ලියේ දී සලාතය ඉටු කළ පසු අල්ලාහ්ගෙන් දුආ කළා. අල්ලාහ් මගේ ප්‍රාර්ථනාව අනුමත කළා විය හැකියි. මට මේ ගමේ උදවිය වෙළෙඳාමක් ආරම්භ කිරීමට අවශ්‍ය උදව් උපකාර කළා. අද සෑහෙන තරමේ වෙළෙන්දෙක් බවට පත් වීමට හැකි වූයේ ඒ නිසා ය."*

මෙම ගමේ උදවිය ඔබට උදව් කළේ කෙසේ ද ?

*මගේ වෙළෙඳාම ආරම්භ කිරීමට අවශ්‍ය තරම් මුදල් ලබා දුන්නා.*
*මම අල්ලාහ් කෙරේ විශ්වාස තබා වෙළෙඳාම ආරම්භ කළා.*
*අල්හම්දුලිල්ලාහ් - අවුරුදු දෙකක් තුළ මම අද ඉන්න තත්ත්වයට පත් වුනා.*

දැන් මෙම ගමේ බෛතුල් මාලයට ඔබ කුමක් කරන්න බලාපොරොත්තු වෙනවා ද ?

*මම මගේ zසකාතය ද බෛතුල්මාලයට දීමට බලාපොරොත්තු වෙනවා.*

ඇමුණුම 2.11.2

## ගවේෂණ පත්‍රිකා

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | zසකාතය සලාතය සමඟ සම්බන්ධ කර දක්වන අල්කුර්ආනයේ වාක්‍ය තුනක් තෝරා ලියන්න. (33:33) (19:31) (5:55) වාක්‍යවල පරිවර්තනය ලියන්න. |
| කණ්ඩායම 2 | - | zසකාත් ලැබීමට හිමිකම් ඇති කණ්ඩායම් අට නම් කර ඇති අල්කුර්ආන් වාක්‍ය තෝරා ලියන්න. (9:60) පරිවර්තනය ලියන්න. |
| කණ්ඩායම 3 | - | zසකාත් වගකීම නිසි ආකාරයට ඉටු වන්නේ නම් ඔබේ ප්‍රදේශයේ ඇතිවන වෙනස්කම් අනාවරණය කර වගුගත කරන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 2.0 : මූලික ඉබාදතයන් හඳුනාගෙන ඒවා ඉටු කිරීමට අවශ්‍ය කරුණු අවබෝධ කර ගෙන ඉටු කරයි.

නිපුණතා මට්ටම 2.12 : හජ් ගැන දැන හජ් ඉටුකිරීම සඳහා ඉතිරි කරයි.

ක්‍රියාකාරකම 2.12 : හජ් ඉටු කිරීමට නියයත් තබමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 2.12.1 හි තර්ජුමතුල් කුර්ආන් පිටපත්
- ඇමුණුම 2.12.2 ගවේෂණ පත්‍රිකා
- ඕමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 2.12.1 :
- ★ කෑබතුල්ලාහ්, හජ් සම්බන්ධ ඡායාරූප පෙන්වන්න.
- ★ එම ඡායාරූප පදනම් කරගෙන හජ් හා සම්බන්ධ අත්දැකීම් සිසුන්ගෙන් විමසන්න.
- ★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - හජ් මුස්ලිම්වරුන්ගේ මූලික වගකීම්වලින් එකක් බව
> - දුල්හජ් 8 වන දින සිට 13 වන දින දක්වා වූ දින හජ් ඉටු කරන දින බව
> - හජ් මගින් ලබාගන්නා අධ්‍යාත්මික හා ලෞකික ප්‍රයෝජන රැසක් ඇති බව

පියවර 2.12.2 :
- ★ සිසුන් කණ්ඩායම් කරන්න.
- ★ ඒ ඒ කණ්ඩායම් අදාළ කාර්ය පරිශ්‍ර වෙත යොමු කරන්න.
- ★ ගවේෂණ අනාවරණ කාර්යයේ යොමු කරන්න.
- ★ තම අනාවරණ මුළු පන්තියටම ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 2.12.3 :
- ★ කුඩා කණ්ඩායම් සිය වාර්තාව ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ අන් කණ්ඩායම්වල සංවර්ධනාත්මත අදහස් ලබාගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- ඉස්ලාමයේ පස්වන වගකීම හජ් බව
- හැකියාව හා පහසුකම් ඇති මුස්ලිම්වරු සිය ජීවිතයේ දී එක් වරක් හෝ හජ් වගකීම ඉටු කළ යුතු බව
- සුල්හජ් අටවන දින සිට 13 වන දින දක්වා ඉක්රාම් සමඟ මිනා, අරෆා, මුස්දලිෆා ආදී ස්ථානවල රැඳී සිට, ජම්රාහි ගල් විසිකර, හිස මුඩු කොට තවාෆ් හත ඉටු කිරීම සමඟ හජ් වගකීම සපිරෙන බව
- ලෝකවාසී ඉස්ලාමීය ජනයා ජාති, ආගම්, වර්ණ, භාෂා භේදයන්ගෙන් තොරව එක්සේසත් වන අවස්ථාව හජ් වන බව
- හාජිවරුන්ගේ සියළු පව් කමා කෙරෙන බව
- එදා උපන් ළදරුවකු ලෙස ආපසු පැමිණෙන බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ඉස්ලාම්හි පස්වන වගකීම හජ් බව ද හජ් වගකීම ඉටු කරනුයේ කඃබා, මිනා, අරෆා යන ස්ථානවල දී බව ද පවසයි.
- හජ් වගකීම ඉටු කරන ආකාරය විස්තර කරයි.
- ජීවිතයේ වරක්වත් හජ් ඉටු කළ යුතුය යන්න අගයයි.
- ඉස්ලාමීය වගකීම් ඉටුකිරීමෙන් සහෝදරත්වය හා සමානාත්මතාව තහවුරු කරයි.

ඇමුණුම 2.12.1

## තර්ජමතුල් කුර්ආන්

අල්ලාහ් වෙනුවෙන් හජ් හා උම්රා ඉටු කරන්න. (2:196)

හජ් ඒ සඳහා වෙන් කරන ලද ෂව්වාල්, දුල්හජ්, දුල් කඃදා යන මාසවල පමණ ඉටු කරන්න. (2:197)

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඡායාරූපය අනුව මෙහි ඉටුවන කාර්යය කුමක් දැයි අනාවරණය කර වාර්තා සකස් කරන්න.

කණ්ඩායම - 1



කණ්ඩායම II



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඡායාරූපය අනුව මෙහි ඉටුවන කාර්යය කුමක් දැයි අනාවරණය කර වාර්තා සකස් කරන්න.

කණ්ඩායම III



කණ්ඩායම IV



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 3.0 : එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කළ යුතු සදාචාරාත්මක ගුණධර්ම පිළිපදියි.

නිපුණතා මට්ටම 3.1 : උදෑසන කාරියන් නිසි පරිදි ඉටු කරයි.

ක්‍රියාකාරකම 3.1 : උදා කිරිය ක්‍රමවත් ව ඉටු කරමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 3.1.1 වැසිකිලියට/කැසිකිළියට යනවිට අනුගමනය කළ යුතු කරුණු ලියන ලද පෝස්ටරයක්
- ඇමුණුම 3.1.2 ගවේෂණ පත්‍රිකා
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.1.1 :
- ★ උදයේම අවදි වූ විට ඉටුකළ යුතු යුතුකම් මොනවාදැයි සිසුන්ගෙන් විමසන්න.
- ★ ඒවා ඉටු කිරීම හා සම්බන්ධ සිසු අදහස් විමසන්න.
- ★ ඇමුණුම 3.1.1 පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- ★ පහත කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - උදයේම අවදි වූ විට පළමුවෙන් උදා කිරියන් ඉටු කළ යුතු බව
> - වැසිකිළි/කැසිකිළි යන විට පිළිපැදිය යුතු පිළිවෙත් රැසක් ඇති බව
> - ඒ සෑම අවස්ථාවටම අදාළ දුආ ඇති බව

පියවර 3.1.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ බ්‍රිස්ටල් බෝඩයේ ලියා ඇති විස්තර නිශ්ශබ්දව කියවන ලෙස ඒ ඒ කණ්ඩායම් යොමු කරන්න.
- ★ ගවේෂණ උපදෙස් පත්‍රිකාව අනුව ක්‍රියාකාරකමේ යොදවන්න.
- ★ තම කණ්ඩායම් වාර්තාව පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 3.1.3 :
- ★ කුඩා කණ්ඩායම්වලට තම අනාවරණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ★ වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ අන් කණ්ඩායම්වලට සිය සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- උදා කිරිය ක්‍රමවත් ව ඉටු කිරීම සුවය ලබාදෙන්නක් බව
- මලපහ කිරීම, නෑම, ව්‍යායාමය, ආහාර පාන අනුභව කිරීම ආදිය උදා කිරියට අයත් වන බව
- මලපහ කිරීමේ දී පිළිපැදිය යුතු කරුණු ඉස්ලාම් උගන්වා ඇති බව
  - * ආවරණය වූ ස්ථානයක් තෝරා ගැනීම,
  - * පාවහන් පැළඳ සිටීම,
  - * වම් පාදය පෙරටු කොට වැසිකිළියට/කැසිකිළියට පිවිසීම

  ආදිය මෙයට ඇතුළත් බව
- වැසිකිළියට/කැසිකිළියට පිවිසීමට පෙර පාරායනය කළ යුතු දුආ ඇති බව
- පළතුරු ගස් හා සෙවන දෙන ගස් යට, ජලාශ අවට, පොදු පිට්ටනි ආදී ස්ථානවල මලපහ කිරීම නුසුදුසු බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- උදා කිරිය ක්‍රමවත් ව ඉටු කිරීම සඳහා පිළිපැදිය යුතු සුන්නත් වූ ක්‍රම ලියා දක්වයි.
- පරිසරයට හානිකර අයුරින් මලමුත්‍ර පහ කිරීම නුසුදුසු බව පිළිගනී.
- මලමුත්‍ර පහ කිරීමට සුදුසු ස්ථාන හා ආකාරය තෝරා ගනී.
- මලමුත්‍ර පහකිරීමේ නිවැරදි ක්‍රම එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 3.1.1

## තොරතුරු ගොනුව

පහත කරුණු බ්‍රිස්ටල් කාඩ්පතක පැහැදිලිව ලියා දර්ශනය කරන්න.

මලමුත්‍ර පහ කිරීමට යන විට පිළිපැදිය යුතු ක්‍රම :

- පාවහන් පැළඳීම
- හිස වසා ගැනීම
- اللّهمّ إنّي أعوذبك من الخبث والخبائث

  යැයි පාරායනය කරමින් පිවිසීම
- කුර්ආනය දික්රු හෝ තමා ලඟ තබා නොගැනීම
- වම් පාදයට බර යොදා කුන්දුවෙන් ඉඳීම
- මලමුත්‍ර පහ කර අවසන් වූ පසු ජලයෙන් සේදීම
- පිරිසිදු කිරීමට පෙර අත ජලයෙන් තෙත් කර ගැනීම
- සබන් යොදා පිරිසිදු කිරීම
- වැසිකිළිය පිරිසිදු කිරීම
- දකුණු පාදය පෙරට තබා පිටවීම
- غفرانك الحمد لله الذي أذهب عنّي الأذى وعافاني

  යන දුආව පාරායනය කිරීම
- දෑත් සබන් යොදා සෝදා ගැනීම

ඇමුණුම 3.1.2

## ගවේෂණ පත්‍රිකාව

ඔබේ කණ්ඩායමට ලැබී ඇති උපදෙස් පත්‍රිකාව අධ්‍යයනය කරන්න. ඒ පිළිබඳ සාකච්ඡා කර පන්තියට කණ්ඩායම් වාර්තාවක් ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | උදයේ අවදිවූ විට අප ඉටු කළ යුතු ප්‍රධාන කටයුතු පහක් ලියන්න. |
| කණ්ඩායම 2 | - | උදා කිරිය ක්‍රමවත් ව ඉටුකිරීමෙන් අප ලබන ප්‍රයෝජන පහක් ලියන්න. |
| කණ්ඩායම 3 | - | මලමුත්‍ර පහ කරන විට පිළිපැදිය යුතු සුන්නත්වූ පිළිවෙත් 10 ක් ලියන්න. |
| කණ්ඩායම 4 | - | මලමුත්‍ර පහ කිරීමේ දී වළක්වා ගත යුතු කරුණු 5 ක් ලියන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 3.0 : එදිනෙදා ජීවිතයේ අනුගමනය කළ යුතු සදාචාරාත්මක ගුණධර්ම පිළිපදියි.

නිපුණතා මට්ටම 3.2 : ආහාර ගැනීමේදී ද ඇඳුම් ඇඳීමේදී ද ඉස්ලාමීය පිළිවෙත් අනුගමනය කරයි.

ක්‍රියාකාරකම 3.2 : ආහාර ගැනීමේ දී ඉස්ලාමීය පිළිවෙත් සුරකිමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :

- තර්ජුමතුල් කුර්ආන් පිටපතක් (3.2.1)
- ඇමුණුම 3.2.2 ගවේෂණ උපදෙස් පත්‍රිකා
- බිස්කට් පැකට් දෙකක්
- ඩිමයි කඩදාසි සහ ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.2.1 :

★ මිහිරිව අල්කුර්ආනය පාරායනය කළ හැකි සිසුවකු ලවා ආහාර සම්බන්ධ අල්කුර්ආන් ආයතය පාරායනය කරවීම සහ එහි තර්ජුමාව කියවීම.

★ පහත කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- මිනිසා ජීවත් වීමට ආහාර අවශ්‍ය බව
- ආහාරය හලාල් හරාම් යැයි දෙකොටසකට බෙදිය හැකි බව
- රසූල් මුහම්මද් (සල්) තුමා පෙන්වා දුන් ක්‍රමය අනුගමනය කර ආහාර අනුභව කළ යුතු බව
- ආහාර ලබාදුන් අල්ලාට ස්තුතිවන්ත විය යුතු බව

පියවර 3.2.2 :

★ සිසුන් කණ්ඩායම්වලට බෙදා කණ්ඩායම්වලට බිස්කට් බෙදන්න. ඒවා කන ලෙස උපදෙස් දෙන්න.

★ ගවේෂණ උපදෙස් පත්‍රිකාව අනුව කාර්ය පරිශ්‍රවල දී ක්‍රියාකාරකම්වලට යොමු කරන්න.

★ පන්තියට ඉදිරිපත් කිරීම සඳහා සිය අනාවරණ වාර්තා සූදානම් කර ගැනීමට යොමු කරන්න.

පියවර 3.2.3 :

★ කුඩා කණ්ඩායම්වල අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.

★ ප්‍රථමයෙන් ඉදිරිපත් කළ කණ්ඩායම පළමුව අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

★ අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමුකරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- ආහාර අත්‍යවශ්‍ය දෙයකි. එහි ශක්තිය රසය හා සතුට ඇතුළත් බව
- අල්ලාහ් ආහාර හලාල් හරාම් යැයි දෙවර්ගයකට බෙදා ඇති අතර හලාල් ආහාර අනුභව කර අල්ලාහ්ට ස්තුති දක්වන ලෙස පවසා ඇති බව
- ස්වභාවයෙන් ම හරාම් වූ ආහාර හා ලබාගන්නා ක්‍රමය අනුව හරාම් වන ආහාර ඇති බව. (උදා : ඌරන්, මළ දෑ ආදිය ස්වභාවයෙන් හරාම් වූ දෑ වේ. පොලිය, සොරකම් කළ ද්‍රව්‍ය, ක්‍රමවත් ව දබිහ් නොකළ සතුන්ගේ මස් ආදිය,කපනු නොලැබූ ඒවා ලබන ක්‍රමය අනුව හරාම් වූ දෑ)
- රසූල් (සල්) තුමා පෙන්වා දී ඇති ක්‍රමය අනුගමනය කර ආහාර අනුභව කළ යුතු බව
- ආහාර ගැනීම බිස්මිල් කියා ආරම්භ කර අල්හම්දුලිල්ලාහ් කියා අවසන් කළ යුතු බව
- සුන්නත් වූ ක්‍රම අනුගමනය කර නියමිත පාරායනා උසුරීමෙන් බරකත් අත්වන බව
- ආහාර ගැනීම සඳහා දකුණත භාවිතා කිරීම, ජලය අපතේ නොහැරීම හා ජලය උගුරෙන් උගුර පානය කළ යුතු බව

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ආහාරයේ හලාල් හා හරාම් යැයි කොටස් දෙකක් ඇති බවත්, හලාල් වූ ආහාර සුන්නත් වූ ක්‍රම අනුගමනය කර අනුභව කළ යුතු බව පවසයි.
- හලාල් වූ ආහාර පමණක් අනුභව කළ යුතු බව හා එය ද නබි (සල්) තුමාගේ ක්‍රමය අනුව අනුභව කළ යුතු බව පිළිගනී.
- සිය දෛනික අනුභවය සඳහා හලාල් වූ ආහාර තෝරයි.
- ඒවා සුන්නත් වූ ක්‍රම පිළිපදිමින් අනුභව කරයි. අවශ්‍ය පාරායනයන් කරයි.

ඇමුණුම 3.2.1

## තර්ජමතුල් කුර්ආන්

- විශ්වාසය තැබූ ජනයිනි. අප විසින් ඔබට පිරිනමන ලද දේවලින්, පිවිතුරු දේම අනුභව කරන්න. (2:172)

- ජනයිනි. මිහිපිට තිබෙන දෙයින් (බුදින්නට ඔබට) අනුමත කරන ලද පිවිතුරු දේ පමණක් අනුභව කරන්න. ෂයිතාන්ගේ පියවර අනුගමනය නොකරන්න. (2:168)

ඇමුණුම 3.2.2

## ගවේෂණ පත්‍රිකාව

- ගුරුවරයා අනුමැතිය දුන් පසු ඔබට බෙදා දෙන ලද බිස්කට් අනුභව කරන්න.
- ඒ ඒ කණ්ඩායම්වලට අදාළ වැඩ පරිශ්‍ර වෙත ගොස් ගවේෂණ ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | ඔබට සපයන ලද බිස්කට් කන අවස්ථාවේ දී අනුගමනය කළ ඉස්ලාමීය පිළිවෙත් ලියා දක්වන්න. |
| කණ්ඩායම 2 | - | බිස්කට් කන අතර එය ඔබ අතින් ගිලිහී බිම වැටුණෝ යැයි සලකා එවිට අනුගමනය කළ යුතු ඉස්ලාමීය පිළිවෙත් ලියන්න. |
| කණ්ඩායම 3 | - | ඉස්ලාම් හරාම් බව දන්වා ඇති ආහාර 10 ක් ලියන්න. |
| කණ්ඩායම 4 | - | ඉස්ලාම් හලාල් කර ඇති ආහාර දහයක් ලියන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කළ යුතු සදාචාරාත්මක ගුණධර්ම පිළිපදියි. |
| නිපුණතා මට්ටම 3.2 | : | ආහාර ගැනීමේ දී ද ඇඳුම් ඇඳීමේ දී ද ඉස්ලාමීය පිළිවෙත් අනුගමනය කරයි. |
| ක්‍රියාකාරකම 3.2 | : | ඇඳුම් ක්‍රමවත් ව අඳිමු. |
| කාලය | : | |
| ගුණාත්මක යෙදවුම් | : | ● ඇඳුම් පිළිබඳ අල්කුර්ආන් වාක්‍ය<br>● ඇමුණුම 3.2.1 තර්ජුමතුල් කුර්ආන් පිටපත්<br>● ඇමුණුම 3.2.2 ගවේෂණ උපදෙස් පත්‍රිකාව<br>● ඩිමයි කඩදාසි සහ ෆෙල්ට් පෑන් |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.2.1 :

★ ඇඳුම සම්බන්ධ අල්කුර්ආන් වාක්‍යය ඉම්හිරිව පාරායනය කළ හැකි ශිෂ්‍යයෙකු ලවා පාරායනය කරවන්න. එහි තර්ජුමාව කියවා පෙන්වන්න.

★ පහත කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාවේ යෙදෙන්න.

- මිනිසා පරිපූර්ණ වන්නේ ඇඳුම් අඳින විට බව
- ඇඳුම මිනිසාට අලංකාරය ලබාදෙන බව
- ඇඳුම නිසා මිනිසාට අලංකාරය, ආරක්ෂාව, ගෞරවය ලැබෙන බව.
- පිරිමින්ට හා ගැහැණුන්ට වෙන වෙන ඇඳුම් ඇති බව.
- පිරිමින්ට පට ඇඳුම් හා රන් ආභරණ හරාම් බව
- අව්රතය වැසෙන සේ ඇඳුම් ඇඳිය යුතු බව
- ඇඳුම් අඳින විට පිළිපැදිය යුතු ක්‍රම ඇති බව

පියවර 3.2.2 :

★ සිසුන් කණ්ඩායම් 3 කට බෙදන්න.

★ ගවේෂණ උපදෙස් පත්‍රිකා අනුව කාර්ය පරිශ්‍ර වෙත ගොස් ක්‍රියාකාරකම්වල යෙදීමට කණ්ඩායම් යොමු කරන්න.

★ කණ්ඩායම් අනාවරණ මුළු පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

පියවර 3.2.3 :

★ කුඩා කණ්ඩායම්වලට සිය අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

★ ප්‍රථමයෙන් ඉදිරිපත් කළ කණ්ඩායම ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

★ අනිකුත් කණ්ඩායම්වල නිර්මාණශීලී අදහස් ද ලබා ගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු අවධාරණය වන සේ සමාලෝචනය ඉදිරිපත් කරන්න.

- ඇඳුම මිනිසාට අයත් දෙයකි. මෙය උණුසුම, සිසිල ආදියෙන් මිනිසා ආරක්ෂා කරයි.
- පට ඇඳුම්, රන් අභරණ, වළලුකරයට පහළින් ඇඳුම් ඇඳීම පිරිමින්ට තහනම් බව
- පිරිමින්ට හිමි ඇඳුම් ගැහැණුන්ද ගැහැණුන්ට හිමි ඇඳුම් පිරිමින් ද ඇඳීම තහනම් බව
- ඇඳුම් අලංකාරවද, පිරිසිදුව ද, සිරුර ආවරණය කළ හැකි ලෙස ද තිබිය යුතු බව
- ඇඳුම් අඳින විට හා ඇඳුම් ඉවත් කරන විට අදාළ දුආ පාරායනය කළ යුතු බව
- ඇඳුමෙහි ද හලාල් බව සුරැකිය යුතු බව

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ඇඳුම යනු අල්ලාහ් ලබාදුන් දායාදය බව ද, පිරිමින්ට හා ගැහැණුන්ට වෙන් වූ ඇඳුම් ඇති බව ද පිරිමින්ගේ හා ගැහැණුන්ගේ අවිරත වෙනස් බව ද පවසයි.
- හරාම් වූ ඇඳුම්, හලාල් වූ ඇඳුම්, පිරිමින්ගේ ඇඳුම් හා කාන්තාවන්ගේ ඇඳුම් වෙන් කොට දක්වයි.
- පිරිසිදු හලාල් වූ ඇඳුම් ඇඳිය යුතු බව ද, ඇඳුම අල්ලාහ්ගේ දායාදය බව ද පිළිගනී.
- සැමවිටම සිය ඇඳුම් පිරිසිදුව තබා ගනී. ඇඳුම් අඳිනවිටත්, ඇඳුම් ගලවන විටත් අදාළ දුආ පාරායනය කරයි.

ඇමුණුම 3.2.1

## තර්ජමතුල් කුර්ආන්

ආදම්ගේ දරුවනි,

ඔබගේ විළිය වැසිය හැකි හා අලංකාර ඇඳුම් සැබැවින්ම අප ඔබට දායාදය කොට ඇත්තෙමු. එහෙත් වඩාත් උතුම් වනුයේ පිරිසිදුකම යන ඇඳුමයි. මෙය අල්ලාහ්ගේ සාක්ෂි සහිත වුවකි. ඔවුන් යහපත් හැඟීම් ලබත්වා.

ඇමුණුම 3.2.2

## ගවේෂණ පත්‍රිකාව

- එක් එක් කණ්ඩායම ලබා දී ඇති ගවේෂණ උපදෙස් පත්‍රිකාව ගැන සැලකිලිමත් වන්න.
- සිය කණ්ඩායම සමඟ අදාළ උත්තරය ගැන සාකච්ඡා කරන්න.
  - ඇඳුම්වල ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

    i.

    ii.

    iii.

  - පිරිමින්ගේ අව්රතය කුමක් ද ?

    i.

    ii.

    iii.

  - ස්ත්‍රීන්ගේ අව්රතය කුමක් ද ?

    i.

    ii.

    iii.

  - ඔබ ඇඳුම් අඳින විට සැලකිලිමත් විය යුතු කරුණු පහක් ලියන්න.

    i.

    ii.

    iii.

    iv.

    v.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 3.0 : එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කළ යුතු සදාචාරාත්මක ගුණධර්ම පිළිපදියි.

නිපුණතා මට්ටම 3.3 : සභා පිළිවෙත් අනුගමනය කර ආචාර සමාචාර කරයි.

ක්‍රියාකාරකම 3.3 : සලාම් පවසා සභා පිළිවෙත් අනුගමනය කරමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- බ්‍රිස්ටල් පතක ලියන ලද නබි වැකි
- ඇමුණුම 3.3.1 ගවේෂණ උපදෙස් පත්‍රිකා
- ඇමුණුම 3.3.2 හි ඇති කියවීම් ගොනුව
- තර්ජුමතුල් කුර්ආන්
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.3.1 :
★ සිසුන්ට සලාම් කියන්න.
★ බ්‍රිස්ටල් පතෙහි ලියා ඇති නබි වැකිය කියවා පෙන්වන්න.
★ පහත කරුණු මතුවන ලෙස සාකච්ඡාව මෙහෙයවන්න.

- මුස්ලිමෙකු තවත් මුස්ලිමෙකු දුටුවිට සලාම් කියා සුබ පැතිය යුතු බව
- සලාම් කීම මුස්ලිම්වරුන්ගේ ඉබාදත් වලින් එකක් බව
- සලාම් කීම නිසා මෙලොව හා පරලොව ආනිශංස අත්වන බව
- නිවසට ඇතුළු වීමට පෙර සලාම් කියා අවසරය ලබා ගත යුතු බව සලාම් කීමත්, එයට පිළිතුරු දීමත් අල්ලාහ්ගේ රහ්මත් ලබාදෙන ඒවාය.

පියවර 3.3.2 :
★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න. ඔවුන් වැඩ පරිශ්‍ර වෙතට යොමු කරන්න.
★ සිසුන් ක්‍රියාකාරකම්වල යොදවන අතර කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කළ යුතු බව පවසන්න.

පියවර 3.3.3 :
★ කුඩා කණ්ඩායම්වල අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
★ පළමුව ඉදිරිපත් කළ කණ්ඩායම පළමුව විස්තීරණ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු අවධාරණය වන සේ සමාලෝචන ඉදිරිපත් කරන්න.

- සලාම් කිය යුතු ආකාරය අල්ලාහ් මලයිකාවරු මාර්ගයෙන් ආදම් (අලෛ) තුමාට දන්වා ඇති බව
- අයෙක් තව අයෙකුට මදහසින් යුක්තව, සලාම් කියන විට අන්‍යෝන්‍ය ආදරය, මිතුරුකම ඇතිවන බව
- සලාම් කියන ලෙසද එයට පිළිතුරු දෙන ලෙසද අල්කුර්ආනයේ අණ කර ඇති බව
- සභාවලට හා නිවෙස්වලට පිවිසෙන විටත් සමුගන්නා විටත් සලාම් පැවැසිය යුතු බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- සියල්ලන්ටම සියළුම වේලාවල දී සලාම් කිවයුතු බව පවසයි.
- සලාම් කීමේ වැදගත්කම අගයයි.
- තමා මුණගැසෙන අයට සලාම් කීම පුරුද්දක් කර ගනී.
- සලාමය හා පිළිතුර ලියා අලවයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 3.3.1

# කියවීම් ගොනුව

## සලාම් කීමේ යහඵල

නබි වැකි

1. ඔබ අතර සලාමය පතුරුවන්න.
2. කතා කිරීමට ප්‍රථම සලාම් කියන්න.
3. ඔබ අතර කෙනෙකු තවත් කෙනෙකු හමු වූ විට සලාම් පවසන්න.
4. දන්නා නොදන්නා සැමටම සලාම් කියන්න.
5. සලාමයට පළමුව පිළිසෙන්නා අල්ලාහ් හමුවෙහි යි යහපත් අයයි.
6. වාහනයේ යන්නා පයින් යන්නාටත් පයින් යන්නා වාඩි වී සිටින්නාටත්, සංඛ්‍යාවෙන් අඩු අය සංඛ්‍යාවෙන් වැඩි අයටත්, වැඩිහිටියන් බාලයින්ටත්, සලාම් කිව යුතුය.
7. ආදරණීය දරුව, ඔබ ඔබේ නිවසට ඇතුළුවීමට පෙර සලාම් උසුරන්න. එය ඔබටත් ඔබේ නිවැසියන්ටත් වර්ධනයක් වනු ඇත.
8. නිවසට ඇතුළුවීමට ප්‍රථම නිවසේ සිටින්නන්ට සලාම් කියන්න.
9. සලාම් නොකී කවරෙකු වුව ද නිවසට ඇතුළු වීමට ඉඩ නොදෙන්න.
10. නිවසෙන් පිටවන විට සලාමය මගින් ඔබේ නිවසත් අල්ලාහ්ගේ සුරැකුමට ලක්කරන්න.

ඇමුණුම 3.3.2

## ගවේෂණ පත්‍රිකාව

- සෑම කණ්ඩායමට ද මෙය ලබාදෙන්න.
- සාකච්ඡා කර ලිවීමට යොමු කරන්න.

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | සලාම් කීමේ වැදගත්කම දක්වන තර්ජුමතුල් කුර්ආනයේ 24:27, 26:61, 4:86 වාක්‍ය තෝරා ලියන්න. |
| කණ්ඩායම 2 | - | සලාම් කීමෙන් ලැබෙන මෙලෝ හා පරලෝ ආනිශංස ලියා දක්වන්න. |
| කණ්ඩායම 3 | - | السلام عليكم ورحمة الله وبركاته යන්න හිත්ගන්නා අයුරින් ලියා පන්තිය ඉදිරියේ දී පෙනීමට තබන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 3.0 : එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කළ යුතු සදාචාරාත්මක ගුණධර්ම පිළිපදියි.

නිපුණතා මට්ටම 3.4 : ගමන්බිමන් යෑමේ පිළිවෙත් අනුගමනය කරයි.

ක්‍රියාකාරකම 3.4 : ගමන් බිමන් යහමින් අවසන් කරමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ගමන් බිමන් යාමේ දී උසුරන දු ආ ලියන ලද බ්‍රිස්ටල් කාඩ්පත්
- ඇමුණු 3.4.1 ගවේෂණ උපදෙස් පත්‍රිකා
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.4.1 :
- ★ ගමන් බිමන් යන විට උසුරන දු ආව පාරායනය කර පෙන්වන්න. නැතහොත් මිහිරි ලෙස පාරායනය කළ හැකි ශිෂ්‍යයෙකු ලවා උසුරීමට සලස්වන්න.
- ★ ගමන් බිමන් සම්බන්ධ සිසුන්ගේ අත්දැකීම් ප්‍රකාශ කිරීමට යොමු කරවන්න.
- ★ පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- ගමන් බිමන් යෑම මිනිස් ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බව
- ගමන් බිමන් මෙලොවට හා පරලොවට ප්‍රයෝජනවත් එකක් විය යුතු බව
- ගමන් බිමන් යන විට අන් මගීන්ට ද උදව් කළ යුතු බව
- අල්ලාහ්ගෙන් දුආ ප්‍රාර්ථනා කරමින් ගමන් යෑම කුසල් රැසක් අත් කර දෙන බව

පියවර 3.4.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ ඔවුන් කාර්ය පරිශ්‍ර වෙත යොමු කරවා ගවේෂණ උපදෙස් පත්‍රිකාව අනුව අනාවරණ සිදු කිරීමට යොමු කරවන්න.
- ★ තම අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 3.4.3 :
- ★ කුඩා කණ්ඩායම් තම අනාවරණ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ පළමුව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබාදෙන්න.
- ★ අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- සෑම පුද්ගලයින්ම තම නිවසේ සිට වෙනත් ස්ථානවලට ගමන් බිමන් කරන බව
- ගමන් යහපත් අරමුණු සහිත ඒවා වන බව
- තවත් සමහර ගමන්වල අරමුණු අයහපත් ඒවා වන බව
- ගමන් බිමන් මෙලොවට හා පරලොවට ප්‍රයෝජනවත් විය යුතු බව
- නිවසින් පිටවන විට ගමන් කිරීමේ සලාත (සුන්නත්) රක්අත් දෙකක් ඉටු කළ යුතු බව
- නිවසින් පිටවන විටත් ගමනේ යෙදෙන විටත් ආපසු පැමිණි විටත් අදාළ දුආ පාරායනය කළ යුතු බව
- ගමනේ දී මහළු අය, කාන්තාවන්, දරුවන්, රෝගීන්, ආබාධ සහිත අය, තනිවම ගමන් බිමන් යාමට බැරි අය ආදී විවිධ අය සහභාගී වන බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ගමන් බිමන් හා සම්බන්ධ සුන්නත් වූ පිළිවෙත් පවසයි.
- ගමන් බිමන් යාමේ දී අල්ලාහ්ගෙන් දුආ ප්‍රාර්ථනා කළ යුතු බව කියයි.
- ඉහත දුආ කටපාඩමින් කියයි.
- ගමන් බිමන් යන අවස්ථාවල දී උසුරිය යුතු දුආ හා අන් පිළිවෙත් තමා ගමන් බිමන් යන විට අනුගමනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 3.4.1

බ්‍රිස්ටල් කාඩ්පතෙහි ලියා ප්‍රදර්ශන කළ යුතු දුආ :

නිවසින් පිටත් වන විට

بسم الله توكلت على الله

لا حول ولا قوة إلا بالله

වාහනයට ගොඩ වූ විට

سبحان الذي سخر لنا هذا وما كنا له مقرنين

وإنا إلى ربنا لمنقلبون

නැවත නිවසට ඇතුළු වූ විට

بسم الله ولجنا وبسم الله خرجنا

وعلى الله ربنا توكلنا

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 4.3.2

## ගවේෂණ පත්‍රිකා

- කණ්ඩායමට අදාළ කාර්ය පරිශ්‍රය වෙත යන්න.
- දී ඇති ගවේෂණ උපදෙස් අනුගමනය කරමින් ක්‍රියාකාරකම්වල යෙදෙන්න.
- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම්වන්න.
- පහත වගුව හිස්තැන් පුරවන්න.
  - ගමනක් යෑමට පෙර මුස්ලිම්වරයෙක් ඉටු කළයුතු යුතුකම් තුනක් ලියන්න.

    1.

    2.

    3.
  - ගමන් යනවිට අප හැසිරිය යුත්තේ කෙසේ ද ?

    1.

    2.

    3.
  - ගමනට සම්බන්ධ දුආ කවරේද ?

    1.

    2.

    3.

    4.

නිපුණතාව 3.0 : එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කළ යුතු සදාචාරාත්මක ගුණධර්ම පිළිපදියි.

නිපුණතා මට්ටම 3.5 : ගුරුවරුන්ට ගෞරව කිරීමේ අවශ්‍යතාව වටහාගෙන මුළු සිතින් ම ගෞරව දක්වයි.

ක්‍රියාකාරකම 3.5 : ගුරුවරුන්ට සළකමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- තර්ජමතුල් කුර්ආන් - ඇමුණුම 3.5.1
- ඇමුණුම 3.5.2 ගවේෂණ උපදෙස් පත්‍රිකා
- ඕමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.5.1 :
- ★ ඇමුණුම 3.5.1 හි සඳහන් කුර්ආන් වැකි උපුරා එය සිසුන්ට සවන්දීමට සලස්වන්න.
- ★ එම කතාව පිළිබඳ සිසුන්ගේ හැඟීම් විමසන්න.
- ★ ගුරුවරුන්ගේ ඉටුවන සේවාවන් හා ඔවුනට සැලකිය යුතු ආකාරය ගැන සිසුන්ගෙන් කරුණු විමසන්න.
- ★ පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - දැනුම ඇති අයගේ තත්ත්වය අල්ලාහ් උසස් කොට ඇති බව.
> - වැඩිහිටියන්ට ගෞරව කිරීම රසූල් (සල්) තුමා විසින් අවධාරණය කර ඇති බව
> - දෙමාපියන් හා ගුරුවරුන් වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කළ යුතු බව
> - අල්ලාහ් ද, මලඉකාවරු ද, අහසේ හා පොළොවේ ඇති මැවුම් සියල්ල ද ගුරුවරුන් වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කරන බව
> - ගුරුවරු මෙලොව හා පරලොව ජයග්‍රහණය සඳහා මගපෙන්වන්නන් බව
> - ගුරුවරුන්ට ගරු සත්කාර කරන්නන් පසුකාලයේ දී සාර්ථකත්වයට පත්වන බව

පියවර 3.5.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ කාර්ය පරිශ්‍ර වෙත යොමු කරන්න. ගවේෂණ උපදෙස් පත්‍රිකාව අනුව ක්‍රියා කිරීමට පොළඹවන්න.
- ★ තම අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.
- ★ කුඩා කණ්ඩායම්වලට සිය අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පළමුව අනාවරණ ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

★ අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

පියවර 3.5.2 : ★ පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- ගුරුවරුන් සමාජයට ඉතා අවශ්‍ය අය බව
- අන්ධයින් හා පෙනුම ඇත්තන් අසමාන වන්නා සේ උගතුන් හා නූගතුන් සමාන විය නොහැකි බව
- දෙමාපියන් කිසියම් ප්‍රමාණයක් දක්වාත්, ගුරුවරුන් මතු දිවිය දක්වාත්, මගපෙන්වන්නන් බව
- ගුරුවරුන්ට ගෞරව කිරීමෙන් ඔවුන්ගේ ආදරය හිමි කර ගෙන ඔවුන් වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කළ යුතු බව
- ගුරුවරුන්ට කීකරුව ජීවත් වූවන් පසුකාලයේ දී ඉතා දියුණු අය වශයෙන් පත් වූ බවට ඓතිහාසික සාධක ඇති බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ගුරුවරුන්ට ගරු සරු දැක්විය යුතු අන්දම විස්තර කරයි.
- ගුරුවරුන්ට ගරු සරු ව හා කීකරුව සිටීමේ තම දියුණුව අත්වන බව පිළිගනී.
- ගුරුවරයෙකු දුටු විට ගරු සැලකිලි දක්වයි.
- ගුරුවරුන් වෙනුවෙන් තම එදිනෙදා සලාතයෙන් පසු දුආ ප්‍රාර්ථනාවල යෙදෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 3.5.1

- ඔබ නොදැන සිටිනවා නම්, උගතුන්ගෙන් විමසා දැනගන්න. (16:43)
- නියතවශයෙන් අල්ලාහ්ගේ ගැත්තන් අතර ඔහුට බිය බැති වන්නේ උගතුන් ය. (35:28)
- ඔබ අතර සිටින ඊමාන් දාරින්ගේ සහ උගතුන්ගේ නිලතල අල්ලාහ් උසස් කරන්නේ ය. (58:11)
- ඉබ්රාහිම් (අලෛ) තුමා තම පියා අමතා

  මාගේ පියාණෙනි, ඔබට නොලැබූ දැණුම හා ඥානය මා ලබා ඇත්තෙමි. ඔබ මා අනුගමනය කරන්න. මා ඔබ ඍජු මාර්ගයේ යොමු කරමි. (19:43)
- මලාඉකාවරුන් හා උගතුන් සාධාරණත්වය ස්ථාපිත කොට ඔහු හැර වෙනත් නාථයෙක් නොවන බවටත් ඔහු සියල්ලටම වඩා උසස් වන බවටත්, ඥානවන්තයා බවටත් සාක්ෂි පවසන්නෝය. (3:18)

ඇමුණුම 3.5.2

- කණ්ඩායමකට එක පිටපතක් බැගින් ලබාදෙන්න.
- මෙහි අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියා ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

1. ගුරුවරයෙකුට ගෞරව දැක්විය යුත්තේ ඇයි ? හේතු පහක් ලියන්න.
2. ගුරුවරුනට අප ඉටු කළ යුතු යුතුකම් පහක් ලියන්න.
3. ඉස්ලාමීය දෘෂ්ඨිය අනුව ගුරුවරුන් වැදගත් වන්නේ කෙසේ දැයි ලියා දක්වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | : | එදිනෙදා ජීවිතයේ දී අනුගමනය කළ යුතු සදාචාරාත්මක ගුණධර්ම පිළිපදියි. |
| නිපුණතා මට්ටම 3.6 | : | සියළු සතුන් කෙරෙහි කරුණාව දක්වයි. |
| ක්‍රියාකාරකම 3.6 | : | සතුන්ට කරුණාව දක්වමු. |
| කාලය | : | |
| ගුණාත්මක යෙදවුම් | : | ● ඓතිහාසික සිද්ධිය - ඇමුණුම 3.6.1<br>● ගවේෂණ අනාවරණ පත්‍රිකා - ඇමුණුම 3.6.1<br>● ඕමයි කඩදාසි සහ ෆෙල්ට් පෑන් |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 3.6.1 :
- ★ 3.6.1 හි ඓතිහාසික සිද්ධිය සිසුන්ට හඬනගා කියවන්න.
- ★ එය සාවධානව අසා සිට ඒ සිද්ධියට අදාළව තම සිතෙහි ඇතිවන හැඟීම් ඉදිරිපත් කර සාකච්ඡා කිරීමට සලස්වන්න.
- ★ ඔවුන් මේ පිළිබඳව දන්නා දේ සහ ඔවුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ පහත සිද්ධීන් අවධාරණය වන අයුරින් සාකච්ඡාව මෙහෙයවන්න.

> - ● ජීවීන් සියල්ලන්ම අල්ලාහ්ගේ මැවුම් වන බව
> - ● හේතුවක් නොමැතිව කිසිදු ජීවියෙකුට හිංසා පීඩා නොකළ යුතු බව
> - ● සියළුම ජීවීන්ට යහපත ම කළයුතු බව හා එයට අල්ලාහ්ගේ යහඵල අත්වන බව

පියවර 3.6.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ කණ්ඩායම් කාර්ය පරිශ්‍ර වෙත යොමු කරන්න.
- ★ ගවේෂණ උපදෙස් පත්‍රිකාවට අදාළ ක්‍රියාකාරකම්වල යෙදීමට සිසුන් යොමු කරන්න.
- ★ තම අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

පියවර 3.6.3 :
- ★ කුඩා කණ්ඩායම්වලට සිය අනාවරණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ ඉදිරිපත් කළ කණ්ඩායමට, නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට පළමුව අවස්ථාව ලබාදෙන්න.
- ★ අනික් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථා ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු මතුවන සේ සමාලෝචනය ඉදිරිපත් කරන්න.

- මිනිසා මෙන් අනෙක් ජීවීන්ද අල්ලාහ්ගේ මැවුම් බව
- ගව, එළුවන්, පක්ෂීන්, බල්ලන්, බළලුන්, කෘමීන් ආදී සියලු ජීවීන් කෙරේ කරුණාව දැක්විය යුතු බව
- කුරුළු කූඩුවකින් ගෙන ආ කුරුළු පැටවුන් නැවත ඒ කූඩුවෙන්ම තබන ලෙස රසූල් මුහම්මද් (සල්) තුමා පවසා ඇති බව
- අල්ලාහ් මිනිසුන් කෙරේ අධික ආදරය දක්වන බව
- බල්ලෙකුට ජලය පානය කිරීමට දුන් මිනිසෙකු ස්වර්ගයට නියම වූ බව
- බළලෙකුට කෑම දීම ප්‍රතික්ෂේප කළ කාන්තාවක් නිරයට නියම වූ බව
- හැකි සෑම විටම ජීවීන් කෙරේ කරුණාව දැක්වීම කළ යුතු බව

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ජීවීන් සියල්ලන්ම අල්ලාහ්ගේ මැවුම් නිසා ඒවා කෙරේ ආදරය, කරුණාව දැක්විය යුතු බව කියයි.
- ජීවීන් කෙරේ අනුකම්පාව දැක්විය යුතු යැයි පිළිගනියි.
- සතුන් කෙරේ කරුණාව දක්වයි.
- ජීවීන් සියල්ලන් කෙරෙහි ම කරුණාව දැක්වීම පුරුද්දක් කර ගනියි.

ඇමුණුම 3.6.1

මෙම කතාව පන්තියේ දී කියවා පෙන්වන්න.

දිනක් හසන් (රලි) තුමා ආහාර ගැනීම සඳහා වාඩි වූහ. එවිට බඩගින්නෙන් සිටින බල්ලෙකු පැමිණ ආහාර සොයා ඇවිදිමින් සිටියේය. එතුමා බල්ලාට රොටියක් කෑමට දැමූහ. එය කා අවසන් කළ බල්ලා තවත් ආහාර බලාපොරොත්තුවෙන් සිටියේය. එතුමා තවත් රොටියක් බල්ලාට කන්නට දුන්හ. එය ද කා දැමූ බල්ලා නැවැත ද ආහාර බලාපොරොත්තුවෙන් සිටියේය. එවිට එතුමන්ගේ ශිෂ්‍යයේ ඉදිරියට විත් බල්ලා එළවා දැමීමට ඉදිරිපත් වූහ. එවිට හසන් (රලි) තුමා බල්ලා නොඑළවන ලෙස ඉල්ලා සිටියහ. අල්ලාහ්ගේ මැවුමක් බඩගින්නේ තැවන විට මම මගේ කුස පුරවා ගැනීමට ලැජ්ජා වෙමි යි කියමින් තවත් රොටියක් කන්නට දුන්හ.

මෙයින් නබි (සල්) තුමාගේ මුණුබුරන් සතුන් කෙරෙහි කොතරම් අනුකම්පාව දැක්වූවා දැයි අවබෝධ වනු ඇත. නබි (සල්) තුමාගේ මිත්‍රයන් වූ සහාබිවරුන් ද මේ ආකාරයෙන් ම සතුන්ට අනුකම්පා දැක්වූහ.

ඇමුණුම 3.6.2

## ගවේෂණ පත්‍රිකාව

ඔබගේ කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

කණ්ඩායම 1 - ජීවීන් කෙරේ කරුණාව, දයාව දැක්විය යුත්තේ ඇයි ? හේතු දෙකක් කියන්න.

කණ්ඩායම 2 - ඔබ ජීවියෙකු කෙරේ ආදර ය, කරුණාව දැක්වූ අවස්ථාවක් සඳහන් කරන්න.

කණ්ඩායම 3 - සහාබාවරු සතුන් කෙරේ කරුණාව දැක්වූ බවට සාධක වන කරුණක් ගොනු කර ලියන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 4.0 : පවුලේ සාමාජිකයිනට ගරු කරමින් කටයුතු කරයි.

නිපුණතා මට්ටම 4.1 : වැඩිහිටියන්ට ගෞරව දක්වමින් හා බාලයින්ට සෙනෙහස දක්වමින් කටයුතු කරයි.

ක්‍රියාකාරකම 4.1 : පවුලේ සාමාජිකයින්ට ගරු කරමින් කටයුතු කරමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් : ● ඇමුණුම 4.1.1 - ගවේෂණ පත්‍රිකාව

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.1 :

★ *"මවට අසනීපයි. අක්කාත් ගෙදර නෑ. මට නිවාඩුවක් ගන්නත් විදියක් නෑ. මොනව කරනවා ද තේරෙන්නේ නෑ."* යනුවෙන් පවසා සිසුන්ගේ අදහස් විමසන්න.

★ පහත කරුණු ඉස්මතු කරමින් සාකච්ඡා කරන්න.

- සහෝදර සහෝදරියන් එක් කුස උපන්නන් බව.
- එම සහෝදර සහෝදරියන් අතර සහෝදර සෙනෙහස පවතින බව
- සහෝදර සෙනෙහස වැදගත්වන බව හා එය ප්‍රයෝජනවත් බව

පියවර 4.1.2 :

★ පන්තියේ සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.

★ ඇමුණුම 4.1.1 හි දී ඇති නාට්‍යාංගයේ පිටපත් කණ්ඩායමට එක බැගින් සපයන්න.

★ එම නාට්‍යය රඟදැක්වීමට සූදානම් වීමට අවස්ථාව ලබාදෙන්න.

පියවර 4.1.3 :

★ නාට්‍යය රඟදැක්වීමට එක් එක් කණ්ඩායමට අවස්ථාව ලබාදෙන්න.

★ රඟදැක්වීමේදී සහෝදර සෙනෙහස පිළිබිඹුවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න.

★ රඟදැක්වීමෙන් අනතුරුව, නාට්‍ය පිළිබඳ අදහස් දැක්වීමට කණ්ඩායම්වලට අවස්ථාව ලබාදෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු අවධාරණය කරමින් සමාලෝචන සාකච්ඡාවක් මෙහෙයවන්න.

- සහෝදර සහෝදරියන් යනු එක්කුස උපන්, නංගී අක්කා, මල්ලි, අයියා ආදීන් බව
- සහෝදර සහෝදරියන් අන්‍යෝන්‍ය වශයෙන් ආදරය හා සෙනෙහස දැක්විය යුතු බව : අන්‍යෝන්‍ය වශයෙන් උදව් උපකාර කළයුතු බව
- අත්වැරදි සිදුවන අවස්ථාවලදී ඒවාට සමාව දිය යුතු බව
- කරදර දුක් කම්කටොළු වලදී සැනසිය යුතු බව. සතුටේ දී පැසසිය යුතු බව, අවශ්‍ය අවස්ථාවල දී කයෙන් හා දැයෙන් උදව් කළ යුතු බව
- පවුල් සාමාජිකයින් අතර බැඳීම දැඩි කළ යුතු බව, පවුලේ උන්නතියට එය උපකාර වන බව. බියෙන් සැකෙන් තොරව ජීවත් වීමට එය ඉවහල් වන බව, පවුලේ යහපතට එය වැදගත්බව හා දෙමව්පියනට එය සතුටක් බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- සහෝදර සෙනෙහස පිළිබිඹුවන අවස්ථා කිහිපයක් ලියා දක්වයි.
- සහෝදර සහෝදරියන් සමඟ ආදරයෙන් කටයුතු කරයි.
- කරදරවල දී සහෝදර සහෝදරියන්ට උදව් උපකාර කරයි.
- සලාම් පැවසීම, මුසාබහා කිරීම, තෑගිබෝග හුවමාරු කර ගැනීම ආදිය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ක්‍රියාකාරකම් පත්‍රිකාව

## කණ්ඩායම් ක්‍රියාකාරකම

### කණ්ඩායම 1

*(ජාවිද් ගේ පියා පුවත්පතක් කියවමින් සිටියි. ඔහු ඉදිරියේ ජාවිද් හා ජවාද් රණ්ඩු වෙති. පියා මැදිහත් වී රණ්ඩුව සමථයට පත් කරයි. ජාවිද් එහි රැඳී සිටියි. ජවාද් පිටව යයි.)*

පියා : ජාවිද්; මේ ලෝකේ ජවාද් නේද ඔබට ඉන්න හොඳම යාලුවා. ඒ පොඩි එකා සමග ඇයි රණ්ඩු වෙන්නෙ ? *(එය ඇසූ ජාවිද්, පියාගෙන් සමාව අයදියි. පෙරදින පියා ගෙනවිත් දුන් ළමා පොත අතට ගනියි. මල්ලී සොයමින් එහි මෙහි දුවයි.)*

ජාවිද් : ජවාද් ... මල්ලි... මට සමාවෙන්න. මා මීට පස්සෙ ඔයත් එක්ක රණ්ඩු වෙන්නෙ නෑ ! මෙන්න මගෙන් ඔයාට සුළු තෑග්ගක්. අරගන්න. *(පොත මල්ලිට දෙයි.)*

ජවාද් : ඇයි අය්යා අද ටිකක් වෙනස් වෙලා ...?

ජාවිද් : මම කුර්ආන් ආයත් කිහිපයක් කියෙව්වා. ඒවා මගේ හිතට කාවැදුනා. ඒවායින් මගේ සිත වෙනස් වුනා.

ජවාද් : *(පොත ලබාගනිමින්)* ජසාකල්ලාහු හෛරන්. මාත් මීටපස්සෙ අයියත් එක්ක රණ්ඩු වෙන්නෙ නෑ ! *(දෙදෙනා වැළඳ ගනී. පසුව අත්වැල් බැඳගෙන ඇවිද යයි.)*

### කණ්ඩායම 2

*(ජාවිද් මිදුලේ ඇවිදිමින් සිටී. සමනළයින් හා මීමැස්සන් මල් පැළවල ඇති මල්වල වසා පැණි උරා බොති. බත් කූරන් ද එහි සැරිසරති. ජවාත්, බත් කූරෙකු අල්ලා ගනී. උගේ වලිගයේ නූල් කැබැල්ලක් ගැට ගසයි. ආලින්දයේ පොතක් බලමින් සිටි ජවාද් මෙය දකියි.)*

ජවාද් : අයියේ, අයියේ... ! *(කෑ ගසමින් ජවාද් වෙත දුවගෙන එයි.)*

ජාවිද් : ඇයි... ඇයි... මල්ලි ...?

ජවාද් : කතා කරන්නට බැරි මේ අහිංසක සතුන්ට හිරිහැර කරන්න එපා යැයි නබි (සල්) තුමා පවසා තිබෙනවා නේ ද ?

ඇයි ඔබ උන්ට කරදර කරන්නෙ... පවු නේ ද...?

ජාවිද් : ඔව්... මයි... මට අමතක වුනා... හදීසය මතක් කර දුන්නාට ස්තූතියි...

ඊසාකල්ලාහු හෛරත්

ජවාද් : පාප ක්‍රියාවක් වැළැක්වූ පින් මට ලැබුණා.

ජාවිද් : සවන් දුන්නා; එයට අවනත වුනා; අල්ලාහ්ගේ වදන ක්‍රියාවට නැංවූ පින් මට අයත් වුනා.

මව : ජවාද්... ජාවිද්... මෙහේ එන්න. *(මවගේ හඬ ඇසූ සහෝදරයින් දෙදෙනා ගෙතුළට පිටත්වෙයි.)*

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම 3

(*ජවාද් පාසල් ඇරී නොණ්ඩි ගසමින් පාරේ එමින් සිටී. ඔහු පසුපස වේගයෙන් පැමිණි ජාවිද් මෙය දකියි*)

ජාවිද් : ඇයි මල්ලි... මොනවද වුණේ ? ඇයි නොණ්ඩි ගහන්නේ ?

ජවාද් : මම පය ලිස්සිලා වැටුණා...

ජාවිද් : ඔබාගේ පොත් මල්ල මට දෙන්න... පරිස්සමින් මගේ කර උඩ වාඩිවෙන්න.

ජවාද් : එපා අයියේ... මම ඇවිදගෙනම එන්නම්

ජාවිද් : එපා මල්ලි... ඔයාගේ කකුලෙ තුවාලෙ ටිකක් අමාරු වගෙයි...

ජවාද් : එච්චර අමාරු නෑ අයියෙ... මම හෙමින් හෙමින් ඇවිදගෙන එන්නම්

ජාවිද් : එහෙනම්... මගේ කර වටේ අත දමා අල්ල ගන්න... (*ජවාද් අයියාගේ කර වටේ දකුණු අත දමා අල්ලා ගනී... දෙදෙනා හෙමින් හෙමින් ගෙදරට එයි.*)

මව : මොනවද වුනේ ජවාද් ...?

ජාවිද් : අම්මේ... මල්ලි ලිස්සිල වැටිලා. කකුල ටිකක් තුවාල වෙලා... බයවෙන්න එපා...මම බෙහෙත් බඳින්නම්...

මව : දෙදෙනාටම බඩගිනි ඇති නේද ...? බත් ටික කාලම බෙහෙත් දාන්න.

ජාවිද් : මල්ලිගෙ තුවාලෙ රිදෙනවා ඇති නේද අම්මේ... බෙහෙත් දාලම අපි බත් කමු.

මව : හොඳයි ලොකු පුතා. (*දෙදෙනා එක්වී ජවාද්ගේ තුවාලය පිරිසිදු කර බෙහෙත් බඳියි*)

කණ්ඩායම 4

(*ජවාද්ගේ කකුලේ තුවාලයට බෙහෙත් දමා ජාවිද් හා මව, ජවාද් ඔසවාගෙන විත් ඇඳේ හාන්සි වීමට සලස්වයි. ඇඳේ කොනක ජාවිද් හිඳ ගනී.*)

ජාවිද් : අම්මේ... අම්ම... ගෙදර වැඩ ටික කරන්න. මම මල්ලි ළඟ ඉන්නම්.

මව : හොඳයි. අවශ්‍ය නම් මට කථා කරන්න.

ජවාද් : අයියේ... ඔයත් ගිහින් ටිකක් හාන්සි වෙලා එන්න.

ජාවිද් : නෑ මල්ලි... මල්ලිට නින්ද යනකම් මම ළඟ ඉන්නම්. මම අල්කුර්ආනය කියවන්නම්. ඔයා අසාගෙන ඉන්න. (*මුස්හෆ් එක අතටගත් ජාවිද් කුර්ආන් පාඨ කියවයි. ජවාද් එය අසා සිටී. ටික වේලාවකින් ජවාද් නින්දට වැටේ. ජාවිද් කුර්ආන් කියවීම නවතා හෙමින් නැගිට මව වෙත යයි.*)

කණ්ඩායම් ක්‍රියාකාරකමට අදාළ උපදෙස්

- ඔබගේ කණ්ඩායමට අයත් නාට්‍ය පිටපත ලබාගන්න.
- එය කියවන්න.
- එය රඟදැක්වීමට සූදානම්වන්න.
- කණ්ඩායමේ සාමාජිකයින් එක්ව එය පරීක්ෂණාත්මක ව රඟදක්වා බලන්න.
- නාට්‍යය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම්වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 5.0 | : | එදිනෙදා ජීවිතයේ අනවශ්‍ය වියදම් වළක්වා ගැනීමට සුදුසු පියවර ඉගෙන ගන්නා අතරම අනුන්ට උපකාර කිරීමට ද ඉදිරිපත් වෙයි. |
| නිපුණතා මට්ටම 5.1 | : | සියළු කාර්යවල දී හලාල් හරාම් පිළිපදියි. |
| ක්‍රියාකාරකම 5.1 | : | ජීවිතයේ හරාම් හලාල් පිළිපැද ක්‍රියා කරමු. |
| කාලය | : | |
| ගුණාත්මක යෙදවුම් | : | ● ඇමුණුම 5.1.1 හි ඇතුළත් විස්තර පත්‍රිකා<br>● ඇමුණුම 5.1.2 හි ඇතුළත් ගවේෂණ පත්‍රිකා<br>● ඕමයි කඩදාසි, ෆෙල්ට් පෑන් |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.1.1 :

★ හලාල් හා හරාම් යනු කුමක් දැයි විමසා සිසුන් දැන සිටින හලාල් හා හරාම් වූ කරුණු පැවසීමට අවස්ථාව දෙන්න.

★ පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> ● හලාල් හා හරාම් වූ දෑ පිළිබඳ කුර්ආන්හි හා හදීස් හි මනාව පහදා දී ඇති බව
> ● හලාල් හි පිහිටුවීම හා හරාම්වලින් වැළකී සිටීම නිසා මෙලොව හා පරලොව යහඵල අත්වන බව
> ● හරාම් හලාල් නොසලකා ක්‍රියාකිරීම නිසා, පාඩු රැසක් ද දඬුවම් ද හිමිවන බව

පියවර 5.1.2 :

★ සිසුන් පස්දෙනාගෙන් යුත් කණ්ඩායම් සාදන්න.

★ තමා මුලදී සඳහන් කළ හලාල් හරාම් වූ කරුණු ලැයිස්තුගත කිරීමට යොමු කරන්න.

★ ඕමයි කඩදාසි, ෆෙල්ට් පෑන් ආදිය ලබාදෙන්න.

★ ඇමුණුම 5.1.1 හි ඇති වගුව පිටපත් කර සෑම කණ්ඩායමටම ලබා දෙන්න.

★ හලාල් ලකුණ මුද්‍රිත (ගුරුවරයා හා සිසුන් විසින් රැස් කළ) නිෂ්පාදන ද්‍රව්‍යවල ඇසුරුම් ආධාරයෙන් හලාල් වූ ද්‍රව්‍ය පහසුවෙන් හඳුනාගන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

පියවර 5.1.3 :

★ කණ්ඩායම් විසින් සකස් කළ හරාම් හලාල් වගුව සෑම කණ්ඩායමටම ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.

★ වාර්තාව පළමුව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

★ අනිකුත් කණ්ඩායම්වල අදහස් ද ලබාගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- හරාම් වූ කරුණු අල් කුර්ආනයේ හා හදීසියේ පැහැදිලිව අර්ථකතනය කර ඇත. එසේ නොවන සියල්ල හලාල් බව
- හරාම් හලාල් අතර සැක කටයුතු (මුතෂාබිආත්) වන කරුණු ඇති බව. මේවා ද වළක්වා ජීවත් විය යුතු බව
- පුද්ගලයාට හා සමාජයට හිතකරවන සියල්ල අල්ලාහ් විසින් හලාල් කර ඇත. ඒවාට අහිතකර සියල්ල හරාම් බවට පත් කර ඇත.
- හලාල් හරාම් යන ඒවා ආහාරවලට පමණක් සීමා නොවන බව
- හලාල් හරාම් යන්න තීරණය කිරීමේ අයිතිය අල්ලාහ්ට පමණක් ඇති බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- හලාල් වූ දේ රකිමින් හරාම් වූ දෙයින් වැළකී ජීවත් වීමෙන් අත්වන යහඵල සඳහන් කරයි.
- හලාල් නොරකිමින් හා හරාම්වලින් නොවැළකී සිටීම නිසා අපට අත්වන පාඩු සඳහන් කරයි.
- හරාම් වූ දේ වලින් වැළකී ජීවත් වෙයි.
- හලාල් රකිමින් හරාම්වලින් වැළකී ජීවත්වීමේ අවශ්‍යතාවය අවබෝධ කර ගනී.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 5.1.1

| හලාල් වූ කරුණු සුරැකීම නිසා අපට අත්වන යහඵල | හරාම් වූ කරුණු සුරැකීම නිසා අපට අත්වන යහඵල |
|---|---|
| 1. ජීවිතයේ අභිවෘද්ධිය ඇති වේ. ශාරීරික සුවතාව ලැබේ.<br>2. සිත සැනසේ<br>3. අල්ලාහ්ගේ ආදරය ලැබේ.<br>4. දුආ ප්‍රාර්ථනා පිළිගනු ලැබේ.<br>5. කියාමාවේදී ස්වර්ගය ලැබේ. | 1. ජීවිතයේ අභිවෘද්ධිය ඉවත් වී අයහපත් ඵල අත්වේ.<br>2. මනසේ නොසන්සුන් ස්වභාවයක් ඇති වේ.<br>3. අල්ලාහ් කෝපයට භාජනය වන්නේය.<br>4. ප්‍රාර්ථනා සහ නැමදුම් ප්‍රතික්ෂේප වේ.<br>5. කියාමාවේදී දැඩි දඬුවම් ලැබේ |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 5.2.1

කණ්ඩායම් ගවේෂණ උපදෙස්

- කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව හොඳින් නිරීක්ෂණය කරන්න.
- එම කරුණු පිළිබඳ ව කණ්ඩායම තුළ සාකච්ඡා කරන්න.
- තොරතුරු රැස්කර සටහන් කරන්න.
- සපයා ගත් තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් කර ගන්න.

ඇමුණුම 5.1.2

## ගවේෂණ පත්‍රිකාව

1. හලාල් වූ කරුණු රකිමින් ජීවත්වීම නිසා අපට අත්වන යහඵල 3 ක් ලියන්න.
2. හරාම් වූ දෑ හි නිරත වීමෙන් අපට සිදුවන පාඩු 3 ක් ලියන්න.
3. හලාල් ද හරාම් ද යන්න තීරණය කළ නොහැකි සැක සහිත දෙයින් වැළකී සිටිය යුත්තේ මන්දැයි ලියන්න.
4. ආහාර හා පාන අතර හලාල් වූ දෑ පහක් ද හරාම් වූ දෑ පහක් ද ලියන්න.
5. මූලික වශයෙන් හලාල් වූ දෙයක් හරාම් බවට පත්වන අවස්ථා 5 ක් ලියන්න.

නිපුණතාව 5.0 : එදිනෙදා ජීවිතයේ දී අනවශ්‍ය වියදම් වළක්වා ගැනීමට සුදුසු පියවර ඉගෙන ගන්නා අතර අන් අයට උදව් කිරීමටද ඉදිරිපත් වෙයි.

නිපුණතා මට්ටම 5.2 : සකසුරුවම්කමින් ජීවත් ව ඉතිරිකර අන් අයට දන් පින් කරයි.

ක්‍රියාකාරකම 5.2 : දන්පින් කර නිර්ලෝභී අයෙකු වෙමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.2.1 - තොරතුරු පත්‍රිකාව
- ඇමුණුම 5.2.2 - ගවේෂණ පත්‍රිකාව
- ලියන කඩදාසි
- පාට පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.2.1 :
- ★ ඇමුණුම 5.2.1 හි ඇති තොරතුරු පත්‍රිකාව කියවා පෙන්වන්න.
- ★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - මුස්ලිම්වරුන් සතු විය යුතු ගුණාංගවලින් එකක් දන් පින් කිරීම බව
> - සෑම යහක්‍රියාවක් ම කුසලයක් බව
> - යහ ක්‍රියාවක් කළ යුත්තේ අල්ලාහ් වෙනුවෙන් බව
> - දාන මානාදියෙන් පුද්ගලයාට හා සමාජයට විවිධ යහඵල අත්වන බව

පියවර 5.2.2 :
- ★ සිසුන් කණ්ඩායම් හතරකට වෙන් කරන්න.
- ★ එක් එක් කණ්ඩායමට ඇමුණුම 5.2.2 හි ගවේෂණ පත්‍රිකා හා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදී ඔවුන් ගවේෂණයෙහි සාර්ථකව යෙදෙන්නේ දැයි නිරීක්ෂණය කරන්න.
- ★ කණ්ඩායම් වාර්තාව පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 5.2.3 :
- ★ කණ්ඩායම්වල ගවේෂණ වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ පළමුව වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- නබි (සල්) තුමාගේ හා සහාබිවරුන්ගේ ජීවිතයේ දන් පින් කිරීම සම්බන්ධ උදාහරණ රැසක් ඇති බව
- "*අල්ලාහ් වෙනුවෙන්*"යන පිරිසිදු හැඟීමෙන් දානමානාදිය කරන විට යහඵල අත්වන බව
- දානමානාදිය නිසා අපගේ ධනය අනිවාර්යයෙන්ම වැඩෙන බව. අන් අය කෙරේ ආදරය හා කරුණාව ඇති වන බව. වෛරය, ක්‍රෝධය, මසුරුකම වැනි ගුණ ඉවත් වන බව
- "*කුසල්*"යන වචනය ඉතා පුළුල් අදහස් දරන දෙයකි. අයෙකුගේ මුහුණ දෙස බලා මඳහස පෑම ද කුසලයක් බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- දන් දීම කුර්ආනයේ අවධාරණය කරන යහ ක්‍රියාවක් බව පවසයි.
- දන් දීම නිසා කුසල් රැසක් අත්වන බව අවබෝධ කර ගනියි.
- දන් පින් කිරීමට ඉදිරිපත් වෙයි.
- දන් පින් කිරීමේ වැදගත්කම නිවැසියන්ට හා අන් අයට කියා දී දන් පින් කිරීමට උනන්දු කරවයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 5.2.1

***මෙය සිසුන්ට කියවා සවන්දීමට සලස්වන්න.***

බේරුවල ඇති චීන කොටුව ප්‍රදේශයේ උපත ලැබූ නලීම් හාජියාර් සුප්‍රසිද්ධ දානපතියෙකි. කුඩා අවධියේ දී සිය පියාගේ ඇවෑමෙන් දුප්පත්කමින් පීඩිත ව දුක් විය. සිය අධ්‍යාපන කටයුතු කරගෙන යාම ද ඔහුට අසීරු කරුණක් විය. එහෙත් ඔහුගේ නොමසුරු වෑයම නිසා ද අල්ලාහ්ගේ පිහිට නිසා ද පසු කාලයේ දී මහත් ධනවතෙක් බවට එතුමා පත් විය. තමා දුකින් පීඩා විඳි අයුරින් අන් කවරකුවත් පීඩා නොවිඳිය යුතුය යන හැඟීමෙන් සිය ධනය දුගී දුප්පත් ජනතාව වෙනුවෙන් නොමසුරුව වියදම් කළේය. මුස්ලිම් සමාජයේ අධ්‍යාපනය ප්‍රගතිය උදෙසා එතුමා වැය කළ මුදල් අසීමිතය. කොතරම් දන් පින් කළද එයින් ප්‍රසිද්ධිය ලැබීම හෝ නමක් ඇති කරගැනීම ඒ මහතාගේ බලාපොරොත්තුව නුවූයේය. එහෙයින් කුමක් කළද එතුමා අල්හම්දුලිල්ලාහ් යැයි සැමවිටම දෙවියන්ටම සියළු ප්‍රශංසා හිමි කළේය.

ඔහු දුගී තරුණියන්ගේ විවාහ කටයුතුවලට උදව් කිරීමෙන් ඔවුන්ගේ දුක තුනී කළේය. දුප්පත් සිසුන් සඳහා අධ්‍යාපන පුනරුද සංගමය ඇති කිරීම මඟින් රට පුරා පාසල්වල නොමිළේ පන්ති පැවැත්වූයේය. නලීමියා ඉස්ලාමියා යන උසස් ඉස්ලාමීය අධ්‍යාපන ආයතනයක් බිහි කළේය. මෙවැනි විවිධ සදහම් කටයුතු සඳහා තමා වැර වෑයමින් ඉපැයූ ධනය ලබා දුන්නේය.

අප රටේ මුස්ලිම්වරු අතර "*මිණි කැටයක්*" සේ දිදුලන එතුමා සැබවින් ම ඉතිහාසයේ මතක් කළ යුතු අයෙකි. ඔහුගේ සියළු දානමානාදිය අල්ලාහ් විසින් පිළිගනු ලැබෙත්වා.

ඇමුණුම 5.2.2

## ගවේෂණ පත්‍රිකාව

එක් එක් කණ්ඩායමට එක් ගවේෂණ කාර්ය පත්‍රිකාවක් බැගින් ලබාදෙන්න. සිසුන් කණ්ඩායම් ගවේෂණවල නිරත කරවන්න.

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | දන්දීම ගැන සඳහන් වන කුර්ආන් වාක්‍ය 05 ගවේෂණය කරන්න. ඒවායේ සිංහල පරිවර්තනය ද ඉදිරිපත් කරන්න. |
| කණ්ඩායම 2 | - | දන්පින් කිරීම නිසා ඇති වන කුසල් සාකච්ඡා කර ලියන්න. |
| කණ්ඩායම 3 | - | මෙම වර්ෂයේ දී ඔබ විසින් ඉටු කරන ලද දන් පින් හා ඉදිරියේ දී ඔබට ඉටු කළ හැකි දන් පින් ලැයිස්තුවක් සකස් කරන්න. |
| කණ්ඩායම 4 | - | ඉතිහාසයේ දී නබිවරු/සහාබාවරු ඉටුකළ සදහම් කාර්යයන් පිළිබඳව ආදර්ශමත් සිද්ධීන් දෙකක් ලියන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 5.0 | : | එදිනෙදා ජීවිතයේ දී අනවශ්‍ය වියදම් වළක්වා ගැනීමට සුදුසු පියවර ඉගෙන ගන්නා අතර, අන් අයට උදව් කිරීමට ද ඉදිරිපත් වෙයි. |
| නිපුණතා මට්ටම 52 | : | සකසුරුකමින් ජීවත් ව මුදල් ඉතිරි කර අනුන්ට දන් පින් ද කරයි. |
| ක්‍රියාකාරකම 5.2 | : | ජීවිතයේ සකසුරුවම හා ඉතිරි කිරීමේ පුරුද්ද අත්පත් කර ගනී. |
| කාලය | : | |
| ගුණාත්මක යෙදවුම් | : | ● ඇමුණුම 5.2.1 ගවේෂණ පත්‍රිකාව<br>● ඕමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.2.1 :

★ මී වදයක රූපය සිසුන්ට පෙන්වන්න.

★ මී මැස්සන් මල් පැණි සොයා ගොස් පැණි සුරකින බව සිසුන්ගෙන් විමසන්න.

★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාවේ යෙදෙන්න.

- අනාගතයේ දී විවිධ අවශ්‍යතා ඇති විය හැකි නිසා සකසුරුවමින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව
- සකසුරුවම හා මසුරුකම එකිනෙකින් වෙනස් බව
- ඉතිරි කිරීමේ පුරුද්ද මගින් අනාගතය වඩා සමෘද්ධිමත් වන බව
- සකසුරුවම හා ඉතිරි කිරීම ගැන අල්කුර්ආනයේ පැහැදීම්වල අවධාරණය කර ඇති බව
- ඉතිරි කිරීම තුළින් අනුන්ට උදව් කළ හැකි බව

පියවර 5.2.2 :

★ සිසුන් කණ්ඩායම් කරන්න.

★ එක් එක් කණ්ඩායම ඇමුණුම 5.2.1 හි ගවේෂණ පත්‍රිකාව ලබාදෙන්න.

★ සාකච්ඡා කර තොරතුරු ඕමයි කඩදාසියේ ලියාගැනීමට සලස්වන්න.

පියවර 5.2.3 :

★ කණ්ඩායම් ගවේෂණ පන්තියේ දී ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

★ පළමුව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

★ අන් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- අපතේ යෑම් වළක්වා සකසුරුවමින් කටයුතු කිරීමෙන් ජීවිතය සාර්ථක කර ගත හැකි බව
- ණයබර වලින් ඉවත් වී, සැනසීමෙන් හා අනුන්ට උදව් උපකාර කිරීමෙන් ජීවත් විය හැකි බව
- සකසුරුවම යනු අවශ්‍ය අවස්ථාවල පවා වියදම් නොකර සිටීම නොව අනවශ්‍ය විනෝද ක්‍රීඩාවල හා හරාම් වූ කටයුතුවලට වියදම් කිරීමෙන් වැළකී සිටීම බව
- ඉතිරි කිරීමේ පුරුද්ද නිසා අපගේ ජීවිතය මනාව සැලසුම් කළ හැකි බව
- අපතේ හැරීම් - ෂයිතාන්ගේ පුරුද්දක් බව. ඉතිරි කිරීම හා සකසුරුවම මූමින්වරුන්ගේ පුරුද්දක් බව

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- සකසුරුවම ඉතිරි කිරීම ආදියෙහි වැදගත්කම පැහැදිලි කරයි.
- අප සකසුරුකමින් ජීවත් විය යුතු ද යන්න ගැන දැන හැසිරෙයි.
- අපතේ හැරීම නිසා ඇතිවන ගැටළු වටහාගෙන සකසුරුකම අනුගමනය කරයි.
- සකසුරුකම හා ඉතිරි කිරීම තුළින් අනුන්ට උදව් කරයි.
- නිවසේ දී හා අවට පරිසරයේ දී අපතේ යෑම් වළක්වයි.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- තමාට දෙන ලද කාර්ය පත්‍රිකාව හොඳින් කියවන්න.
- ඔබට පවරා ඇති ක්‍රියාකාරකමෙහි යෙදීමෙන් ගවේෂණය කළ දෑ සටහන් කරගන්න.
- ඔබගේ අනාවරණයන් පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම්වන්න.

ඇමුණුම 5.2.1

## ගවේෂණ පත්‍රිකාව

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | සකසුරුවම, ඉතිරි කිරීම යන පුරුද්ද නිසා අපට අත්වන ප්‍රයෝජන මොනවා ද ? |
| කණ්ඩායම 2 | - | නිවසේ දී හා පාසලේ දී අපතේ යෑම් වළක්වා ගන්නේ කෙසේ ද ? |
| කණ්ඩායම 3 | - | අපතේ හැරීම අයෙකුගේ ජීවිතය කෙරේ කෙසේ බලපාන්නේ ද ? |
| කණ්ඩායම 4 | - | සකසුරුවමින් ජීවත්වන අයෙකුට කවර ආකාරයේ යහපත් ක්‍රියාවල යෙදිය හැකි වේ ද ? |

නිපුණතාව 6.0 : ෂරීඅත් හි මූලාශ්‍ර නිවැරැදිව වටහාගෙන ඒවා ඉගෙන අනුගමනය කරයි.

නිපුණතා මට්ටම 6.1 : අල්කුර්ආන් ප්‍රථම මූලාශ්‍රයබව තේරුම් ගෙන ක්‍රියා කරයි.

ක්‍රියාකාරකම 6.1 : අල්කුර්ආනය ප්‍රථම මූලාශ්‍රය බව දැන ගනිමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- සූරා අලක් පටිගත කළ කැසට්පටිය
- සූරා අලක් උසුරීම සඳහා සූදානම් කළ ශිෂ්‍යයෙක්
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්
- ඇමුණුම 6.1.1 ගවේෂණ පත්‍රිකාව

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 6.1.1 :
- ★ කැසට් පටිය ක්‍රියාත්මක කරන්න. නැතහොත් කලින්ම සූදානම් කරගත් ශිෂ්‍යයා ලවා එම සූරා අලක් පාරායනය කරවන්න.
- ★ මෙම ආයතය පහළ වූ වහී සම්බන්ධව සිසුන් දන්නා කරුණු කීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ ඉස්ලාමීය ජීවිතය සඳහා වූ මාර්ගෝපදේශය අල්කුර්ආනය මගින් පෙන්වා දී ඇති බව කියා අල්කුර්ආනය ප්‍රථම මූලාශ්‍ර යන සංකල්පය අවධාරණය කරන්න.
- ★ පහත කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - අල්කුර්ආනය යනු ඉස්ලාමයේ ප්‍රථම මූලාශ්‍ර බව
> - මෙය අල්ලාහ්ගෙන් ජිබ්රිල් (අලෛ) මගින් වහී ලෙස නබි සල් තුමාට පහළ වූ බව
> - නබි (සල්) තුමාගේ කාලයේ පටන්ම අල්කුර්ආනය ලිඛිතව ද කටපාඩම් මගින් ද සුරැකී පවතින බව

පියවර 6.1.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න. ඒ ඒ කණ්ඩායමට අදාළ ගවේෂණ පත්‍රිකා ලබාදෙන්න.
- ★ ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් ලබාදෙන්න.
- ★ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.
- ★ කණ්ඩායම්වල ගවේෂණ අනාවරණ පන්තියේ ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

පියවර 6.1.3 :
- ★ කුඩා කණ්ඩායම්වලට සිය ගවේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ පළමුව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ අන් කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට පොළඹවන්න.

★ පහත සඳහන් කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- නබි සල් තුමා හිරා නම් ගුහාවේ තනිව ඉඳින අවස්ථාවේ දී ජිබ්රීල් අලෙෙ තුමා පහළ වී "උසුරන්නා" යැයි කියා සූරා අලක් උසුරා පෙන්වීම පළමු වහීය පහළ වූ අවස්ථාව බව
- සෑම අවස්ථාවකම අවශ්‍යතාවය අනුව අල්කුර්ආනයේ වචන පහළ වූ බවත්, එමගින් අවශ්‍ය මගපෙන්වීම් ලබාදෙන ලද බවත්
- නබි(සල්) තුමා සහ සහබාවරු අල්කුර්ආනය කටපාඩම් කළෝය. නබි තුමා අල්කුර්ආනය පාරායනය කළ ආකාරයට උස්මාන් රලි තුමාගේ කාලයේ දී එය ගොනු කරන ලද බව
- අල්කුර්ආනය සූරා 114 කින් ද ජුස්උ 30 කින් ද, මන්සිල් 7කින් ද සමන්විත බව
- එය දිනපතා පාරායනය කළ යුතු බව
- සියළු ගැටළු සඳහා විසඳුම් අල්කුර්ආනයේ ඇති බව

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- අල්කුර්ආනය පහළ කළ ආකාරය හා එහි වැදගත්කම ගැන කියයි.
- අල්කුර්ආනය පළමු මාර්ගෝපදේශ බව හඳුනා ගනී.
- අල්කුර්ආනයේ උපදේශනයන් අනුව ජීවත් විය යුතුය යන ආකල්පය ලබයි.
- දිනපතා කුර්ආනය පාරායනය කර වටහා ගැනීමට වෑයම් කරයි.

ඇමුණුම 6.1.1

## ගවේෂණ පත්‍රිකාව

1. අල්ලාහ් තම අණ නබි (සල්) තුමාට දැන්වූයේ කෙසේ ද ?
2. නබි (සල්) හිරා ගුහාවේ සිටින විට වහී මඟින් අල් කුර්ආනයේ 96 වන සූරාව වන සූරා අලක් උසුරා පෙන්වූ මලාඉකාවරයා කවුද ?
3. වහී මඟින් පහළ කරනු ලැබූ අල්ලාහ්ගේ ආයත ගොනු කර ඇත්තේ කොහි ද?
4. මුස්ලිම්වරු කිසියම් කටයුත්තක් හරාම් හෝ හලාල් යයි තීරණය කරන්නේ කෙසේ ද ?

නිපුණතාව 6.0 : ෂරීආවල මූලාශ්‍ර නිවැරැදිව වටහාගෙන ඒවා අනුගමනය කරයි.

නිපුණතා මට්ටම 6.2 : දෙවන මූලාශ්‍රය සුන්නාත් බව තේරුම් ගෙන කටයුතු කරයි.

ක්‍රියාකාරකම 6.2 : ඉස්ලාමයේ දෙවන මූලාශ්‍රයවන සුන්නාව පිළිගෙන කටයුතු කරයි.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 6.2.1. දෙබස
- ඇමුණුම 6.2.2 ගවේෂණ පත්‍රිකාව
- ෆෙල්ට් පෑන් , ඩිමයි කඩදාසි

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 6.2.1 :
- ★ ඇමුණුම 6.2.1 හි ඇති දෙබස රඟදක්වා පෙන්වන ලෙස සිසුන් තිදෙනෙකු යොමු කරන්න.
- ★ හදීස්, සුන්තා යන පදවල තේරුම සිසුන්ගේ අත්දැකීම් වලින් ලබාගැනීමට යොමු කරන්න.
- ★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - ඉස්ලාමීය නීති මූලාශ්‍ර අතර හදීස් ද එකක් වන බව
> - හදීස් යනු නබි (සල්) තුමාගේ මුලු ජීවිතයම බව
> - හදීස් වනාහි අල්කුර්ආනය පහදා දෙන්නක් වන බව
> - හදීස් හා සුන්නා යන වදන් දෙකම එකම කරුණ පෙන්වා දෙන බව

පියවර 6.2.2 :
- ★ සිසුන් කණ්ඩායම් 6/3 කට බෙදන්න.
- ★ එක් එක් කණ්ඩායමට හදීස් ලියන ලද කාඩ්පතක් සහ ගවේෂණ පත්‍රිකාවක් ලබාදෙන්න.
- ★ ෆෙල්ට් පෑන්, ඩිමයි කඩදාසි ලබාදෙන්න.
- ★ සිසුන් ක්‍රියාකාරකම්වල යොදවා නිරීක්ෂණය කරමින් අවශ්‍ය විට උදව් ලබාදෙන්න.
- ★ සෑම කණ්ඩායමක්ම තම අනාවරණ මුළු පන්තියටම ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතු බව දන්වන්න.

පියවර 6.2.3 :
- ★ කුඩා කණ්ඩායම්වලට සිය අනාවරණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ පළමුව අනාවරණ ඉදිරිපත් කළ කණ්ඩායම පළමුව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- කුර්ආනයට පසුව එන නීතිමය මූලාශ්‍රය අල් හදීස් බව
- හදීස් මඟින් අල්කුර්ආනයට පැහැදිලි කිරීම් කෙරෙන බව
- සහාභාවරුන්ගේ කාලයේ දී අල්කුර්ආනය ගොනු කළාක් මෙන් තාබිඊන්වරුන්ගේ කාලයේ දී හදීස් ගොනු කර ලියන ලද බව
- හදීස් ඉගෙන ඒවා අන් අයට කියාදීම යහපත ගෙනදෙන ක්‍රියාවක් බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- හදීස් යනු කුර්ආනය පහදා දීමක් බව පවසයි.
- මාතෘකාවට අදාළ හදීස් රැස්කරයි.
- හදීස්වල මගපෙන්වීමට අනුව ජීවත් විය යුතු බව පිළිගනියි.
- හදීස්වල දෙනු ලබන උපදෙස් අනුව තම ජීවිතය සකස් කර ගනියි.
- අන් අයට හදීස් කියා දෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 6.2.1

අසර් සලාතය ඉටුකර අවසන් වූ අහමද් අලුත් තොරතුරක් රැගෙන විගසින් නිවසට ආවේය.

අහමද් : අම්මේ අසර් සලාතයෙන් පසු පල්ලියේ හදීස් මජ්ලිස් පවත්වනවාලු. සියලු දෙනාට එන්න කියා හසරත් කීවා. ඔහු හඬනගා කීවේය.

සුමයියා : මොකක්ද අම්මේ හදීස් මජ්ලිස් කියන්නේ. මාත් එන්න ද?

මව : හදීස් මජ්ලිස් කියන්නේ බයාන් වැඩසටහනක්. කැමැති නම් ඔබටත් එන්න පුලුවන්.

අහමද් : උම්මා හදීස් කියන්නේ නබි (සල්) තුමාගේ කියමන්, ක්‍රියා හා අනුමතිය බවයි අපට මද්රසාවේ කියලා දීලා තියෙන්නේ.

මව : බොහොම හොඳයි. හරියට කිව්වා. නබි (සල්) තුමා අල්කුර්ආනයේ උපදෙස් අනුව ජීවත් වී පෙන්වූවා. එම නිසා කුර්ආනයට පැහැදිලි කිරීම වශයෙන් හදීස් සලකනු ලබනවා. කුර්ආන්, හදීස්, අනෙකුත් ආගමික කටයුතු ගැන සාකච්ඡා කරන සභාවට තමයි හදීස් මජ්ලිස් කියන්නේ.

සුමයියා : එහෙනම් උම්මා හෙට මාත් ඔයාත් එක්ක හදීස් මජ්ලිසයට එනවා. හරි ...

මව : හොඳයි දුව හොඳයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 6.2.2

## ගවේෂණ පත්‍රිකාව

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | හදීස් යනු කුමක්දැයි පැහැදිලි කරන්න. |
| කණ්ඩායම 2 | - | අධ්‍යාපනය පිළිබඳ සඳහන් වන හදීස් තුනක් සොයා ලියන්න. |
| කණ්ඩායම 3 | - | සිහාහුස්සිත්තා යන ප්‍රධාන හදීස් ග්‍රන්ථ හය හා ඒවා ගොනු කළ ඉමාම්වරුන්ගේ නම් ලියන්න. |
| කණ්ඩායම 4 | - | ඉමාම් බුහාරි තුමාගේ ජීවිත සටහන්වලින් තෝරා එතුමා පිළිබඳ වාක්‍ය 10 ක් ලියන්න. |

| | | |
|---|---|---|
| නිපුණතාව 6.0 | : | ෂරීඅත් හි මූලාශ්‍ර නිවැරැදිව වටහා ගෙන ඒවා ඉගෙන අනුගමනය කරයි. |
| නිපුණතා මට්ටම 6.1 | : | ප්‍රථම මූලාශ්‍රයේ සූරා කීපයක් උසුරා පෙන්වයි. |
| ක්‍රියාකාරකම 6.1 | : | අවසන් සූරාහ් තුනෙහි තේරුම වටහාගෙන නිවැරැදිව උසුරීමට දැනගනිමු. |
| කාලය | : | |
| ගුණාත්මක යෙදවුම් | : | ● ටේප් රෙකෝඩරය<br>● අවසන් සූරාහ් තුන පටිගත කළ ශ්‍රව්‍ය පටිය<br>● තර්ජුමතුල් කුර්ආන්හි පිටපත්<br>● ඇමුණුම 6.1.1 හි සඳහන් ගවේෂණ පත්‍රිකාව |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 6.1.1 :

★ ටේප් පටිය මගින් හෝ ශිෂ්‍යයාගේ පාරායනය මගින් හෝ ඔබ උසුරා පෙන්වීමෙන් හෝ අවසන් සූරාහ් තුනට සවන්දීමට සිසුනට අවස්ථාව ලබාදෙන්න.

★ අන් සිසුන් එය අසා සිටීමට සලස්වන්න.

★ පහත සඳහන් කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- අල්කුර්ආනයේ අවසන් සූරාහ් තුන බව
- ඒවා උසුරන අවස්ථා රැසක් ඇති බව
- උසුරන විට පිළිපැදිය යුතු අංග රැසක් ඇති බව
- මෙම සූරාහ් මගින් අල්ලාහ් ගැන පැහැදිළි කරන බව

පියවර 6.1.2 :

★ අවසාන සූරාහ් තුන නිශ්ශබ්දව උසුරන්න එක් එක් ශිෂ්‍යයා යොමු කරන්න.

★ සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.

★ සෑම කණ්ඩායමකටම තර්ජුමතුල් කුර්ආන් පිටපතක් ලබාදෙන්න.

★ ඒ ඒ කණ්ඩායම්වල සිටින හොඳින් උසුරීමට හැකි සිසුවෙකු ලවා කණ්ඩායමේ අනික් සිසුන්ට උසුරුවා දීමට යොමු කරන්න.

★ පරිවර්තනය යොදාගෙන කාර්ය පත්‍රය සම්පූර්ණ කර සූරාහි තේරුම දැන ගැනීමට මගපෙන්වන්න.

පියවර 6.1.3 :

★ කණ්ඩායමෙන් දෙදෙනෙක් බැගින් තෝරාගෙන පන්තිය ඉදිරියට විත් උසුරා පෙන්වීමට අවස්ථාව ලබාදෙන්න.

★ තවත් දෙදෙනෙක් තෝරා එහි අර්ථය කීමට යොමු කරන්න.

★ උසුරන විට අඩුපාඩුකම් හඳුනාගෙන ඒවා මගහැරවීමට වෑයම් කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- නාස්, ෆලක්, ඉඛ්ලාස් යනු අවසන් සූරාහ් වන බව
- උදේ සවස මෙම සූරා පාරායනය කිරීම නබි තුමාගේ ආදර්ශය බව
- මිනිසාට ඇතිවන හිංසා පීඩාවලින් ආරක්ෂා වීමට මෙම සූරාහ් උදව් වන බව
- මෙම සූරාහ් තුන පහළ කරනු ලැබීමට පසුබිම් වූ හේතු ඇති බව
- අල්ලාහ් ඒකයාය. ඔහු අසමසමය. ඔහු රක්ෂිතයාය. අධිපතියෙකු සතු ලක්ෂණ ඔහුට අයත් ය යන බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- අවසන් සුරාහ් තුනෙහි වැදගත්කම දක්වයි.
- මෙම සුරාහ් උසුරීමෙන් සියළු අතුරු අන්තරාවලින් මිදිය හැකි බව විශ්වාස කරයි.
- මෙම සුරාහ් කණවැටුණු විට එහි තේරුම වටහා ගනී.
- මෙම සුරාහ් දිනපතාම උදේ සවස උසුරයි.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- ඔබ කණ්ඩායමට ලැබී ඇති කාර්ය පත්‍රිකා මනාව අධ්‍යයනය කරන්න.
- එහි ඇති සූරාහ් පාරායනය කරන විට අනුගමනය කළ යුතු තජ්විද් නීතිරීති ගවේෂණය කරන්න.
- දී ඇති සම්බන්ධතා සඳහා තේරුම වටහාගන්න.
- නිවැරැදිව උසුරන්න.
- කණ්ඩායම් අනාවරණය පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම්වන්න.

ඇමුණුම 6.1.1

# ගවේෂණ පත්‍රිකාව

- අවසන් සූරාහ් තුන උසුරන විට අනුගමනය කළයුතු තජ්විද් නීති හඳුනාගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 7.0 | : | නබි (සල්) තුමාගේ සීරාවේ සිදුවන ප්‍රධාන සිද්ධීන් වටහාගෙන ඉන් ලැබෙන ඉගැන්වීම් පූර්වාදර්ශ ලෙස ගෙන කටයුතු කරයි. |
| නිපුණතා මට්ටම 7.1 | : | නබි (සල්) තුමාගේ තරුණ අවධියේ පූර්වාදර්ශ ලෙස අනුගමනය කරයි. |
| ක්‍රියාකාරකම 7.1 | : | නබි(සල්) තුමාගේ උපත හා තරුණ අවධිය පිළිබඳ දැනගනිමු. |
| කාලය | : | |
| ගුණාත්මක යෙදවුම් | : | ● ගවේෂණ පත්‍රිකා 7.1.1<br>● ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.1 :

★ නබි සල්තුමා උපන් පරිසරය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

★ එතුමන්ගේ උපත ගැන හැඟීම්බර ව කියාදෙන්න.

★ නබි (සල්) තුමාගේ උපත අල්ලාහ්ගේ දායාදයක් බව සිසුන්ට ඒත්තු ගන්වන්න.

★ පෙළ පොතේ ඇති නබි (සල්) තුමාගේ උපත හා තරුණ අවධියට අදාළ කොටස් කියවීමට සලස්වන්න.

★ පහත කරුණු ඉස්මතුවන සේ සාකච්ඡා කරන්න.

- නබි සල් තුමාගේ උපත කාලීන අවශ්‍යතාව බව
- නබි (සල්) තුමා සිය තරුණ අවධියේදී ම උතුම් ගති ගුණවලින් හෙබි පුද්ගලයකු වූ බව
- කදීජා (රලි) තුමිය විවාහ කරගත් බව
- සිය සමාජයීය ගැටළු රැසකටම විසඳුම් සෙවූ බව

පියවර 7.1.2 :

★ පන්තියේ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.

★ ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් සිසුනට ලබාදෙන්න.

★ සෑම ශිෂ්‍යයෙකුම නිරීක්ෂණය කරමින් ක්‍රියාකාරකම් කෙරෙහි යොමු කරන්න.

★ සෑම කණ්ඩායමක් ම සිය ගවේෂණ අනාවරණ වාර්තාව පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 7.1.3 :

★ කුඩා කණ්ඩායම්වලට සිය ගවේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

★ ප්‍රථමයෙන් ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතුවන සේ සමාලෝචනයේ යෙදෙන්න.

- නබි (සල්) තුමා ඉපදෙන විට එම සමාජ පරිසරය සාරධර්ම වලින් පිරිහී තිබුණු බව
- නබි (සල්) තුමා සතුව උසස් ගති ගුණ රැසක් තිබූ බව
- කදීජා තුමිය හා විවාහ වී දරුවන් 7 දෙනෙකුගේ පියා ලෙස ඉතා පාරිශුද්ධ ජීවිතයක් ගත කළ බව
- සිය සමාජයේ මතු වූ විවිධ ගැටළු ඉතා සුහදව විසඳූ බව.
  *උදා :* හජ්රුල් අස්වද් ශුද්ධ වූ ගල ස්ථානගත කිරීම.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- නබි (සල්) තුමා ඉපැදුනු සමාජ පරිසරය පිළිබඳ විස්තර කරයි.
- නබි (සල්) තුමාණෝ සිය ළමා අවධියේදීම ලබා තිබූ උතුම් ගති ගුණ අගයයි.
- නබි (සල්) තුමාගේ උදාර ගුණ ආදර්ශයට ගෙන පිළිපදියි.
- නබි (සල්) තුමාගේ පෞරුෂය සිය ජීවිතයේ දී ආදර්ශයට ගනියි.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- ඔබගේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකා මනාව අධ්‍යයනය කර ඒ අනුව ක්‍රියා කරන්න.
- කණ්ඩායම් සාමාජිකයන් අතර සාකච්ඡා කරන්න.
- දී ඇති කවිය පරිස්සමින් කියවා තේරුම් ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.
- ලබාගත් කරුණු කණ්ඩායම් අනාවරණ ලෙස පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.7.1

## ගවේෂණ පත්‍රිකාව

සෑම කණ්ඩායමකටම මෙයින් පිටපතක් ලබාදී පිළිතුරු ලියා පන්තියේ දී ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

කණ්ඩායම 1 - නබි (සල්) තුමා ඉපදීමට පෙර මක්කාවේ පැවැති සමාජ ස්වභාවයේ අංග ලැයිස්තුගත කරන්න.

කණ්ඩායම 2 - නබි සල් තුමා ළමයෙකුව සිටි අවධියේ දී එතුමා සතු වූ උතුම් ගුණාංග ලියා දක්වන්න.

කණ්ඩායම 3 - නබි (සල්) තුමාට නබීත්වය ලැබීමට පෙර තරුණයෙකුව සිටි කාලයේ දී එතුමා ඉටුකළ කාර්යයන් සඳහන් කරන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 7.0 : නබි (සල්) තුමාගේ සීරාහි සිදුවන ප්‍රධාන සිද්ධීන් වටහාගෙන ඉන් ලැබෙන ඉගැන්වීම් පූර්වාදර්ශ ලෙස ගෙන කටයුතු කරයි.

නිපුණතා මට්ටම 7.2 : නබි (සල්) තුමාට නුබුව්වතය ලැබුණු පසුබිම වටහාගෙන නුබුව්වතය විශ්වාස කොට අනුගමනය කරයි.

ක්‍රියාකාරකම 7.2 : නුබුව්වතයේ වැදගත්කම දැනගනිමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.1 තොරතුරු පත්‍රිකාව
- ලියන කඩදාසි
- පාට පෑන්
- 7.2.2 හි ගවේෂණ පත්‍රිකාව

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.1 :
- ★ ඇමුණුම 7.2.1 හි තොරතුරු පත්‍රිකාව පන්තියේ කියවා පෙන්වන්න.
- ★ සෑම ශිෂ්‍යයෙක් ම එය සාවධානව අසා සිටීමට යොමු කරන්න.
- ★ පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- නුබුව්වතය සමාජ විපර්යාසය සඳහා වන පදනම බව
- එය නබි (සල්) තුමාට තිගැස්සුම ගෙන දුන් අත්දැකීමක් වූ බව
- කුරෛෂිවරුන් නුබුව්වතයට විරුද්ධ වූ බව
- නබි (සල්) තුමා සහ එතුමා පිළිගත් මුස්ලිම්වරු අපමණ දුක් කරදරවලට මුහුණ දුන් බව

පියවර 7.2.2 :
- ★ සිසුන් සම කණ්ඩායම්වලට බෙදන්න.
- ★ අවශ්‍ය ලේඛන හා උපකරණ ලබාදී කණ්ඩායම් ගවේෂණ අනාවරණ කාර්ය කෙරෙහි යොමුකරන්න.
- ★ තම කණ්ඩායම් ගවේෂණ පන්තියේ ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

පියවර 7.2.3 :
- ★ කණ්ඩායම් ගවේෂණ පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ ප්‍රථමයෙන් වාර්තාව ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ අනෙක් කණ්ඩායම්වලට ද තම නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමුකරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතු වනසේ සමාලෝචනයේ යෙදෙන්න.

- සෑම අන්දමින්ම පිරිහී පැවති එදා සමාජය වෙනස්කම් ඇති කිරීමට නුබුව්වතය අවශ්‍ය වූ බව
- ප්‍රථම වහීය ලැබුනු සිද්ධිය නබිතුමාට තිගැස්මක් ඇති කරන සුළු වූ බව
- සිය නුබුව්වතය ප්‍රසිද්ධියට පත් කළ විට එතුමාට නොයෙකුත් දුක් කරදර පීඩාවලට මුහුණදීමට සිදු වූ බව
- එතුමා මෙන්ම එතුමා පිළිගත් අනුගාමිකයන්ට ද විවිධ දුක් පීඩාවලට මුහුණ දීමට සිදු වූ බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- නුබුව්වතය පහළවීමට පෙර පැවැති සමාජ පරිසරය විස්තර කරයි.
- නුබුව්වතය මගින් ලොවට ලැබුණු යහපත් ඵල අගයයි.
- දෙවියන් විශ්වාස කළ අයට මුහුණදීමට සිදු වූ දුක් කරදර වේදනා දැන සත්‍යය පිළිගත් අය සැමවිටම පරීක්ෂණවලට ලක්වන බව වටහා ගනී.
- ජීවිතයේ මුහුණදීමට සිදුවන දුක් කරදර ඉවසීමෙන් පිළිගනී.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.2.1

# තොරතුරු පත්‍රිකාව

## පළමු වහී

නබි (සල්) තුමාණන් උපන් රට, සෑම අතින් ම නොදියුණු එකක් විය. සුදුසු රාජ්‍ය පාලනයක් හෝ සමාජ රටාවක් හෝ එහි දක්නට නොවීය. සුදුසු ආගමක් ද නොතිබුණි. එකල වැසියන් ද ජාහිල්වරුන් (අඥානයන්) වශයෙන් ජීවත් වූ බව, ඉතිහාසයෙහි දැක්වෙයි. මෙබඳු සමාජයක් තුළ බිහි වූ නබි (සල්) තුමාණෝ එකී සමාජ අක්‍රමිකතා කිසිවකට සම්බන්ධ නොවී ශ්‍රේෂ්ඨ පුරුෂයකු වශයෙන් ජීවත් වූහ. එලෙස ජීවත් වූවා පමණක් නොව, එකී සමාජයේ අඩු ලුහුඬුකම් නැතිකොට, සමාජය යහපත් ලෙස හැඩගස්වා ගනු පිණිස එතුමාණෝ ක්‍රම විධි සොයමින් පසු වූහ.

එවිට, එතුමාගේ වයස අවුරුදු 40 කි. මක්කාවේ සිට කිලෝමීටර පහක් (5) පමණ දුරින් පිහිටි, හිරා නම් කඳු ගුහාව තුළ, එතුමා ධ්‍යානයෙහි යෙදී සිටියහ. උක්ත සමාජයේ යහපත් සංශෝධනයක් උදෙසා මග සොයමින් සිටියේය. ඉහත ඉතිහාසය වෙනස් කළ, එකී හදිසි සිද්ධිය සිදුවූයේ එහිදී ය.

රමළානයේ පශ්චිම භාග රාත්‍රියක, අල්ලාහ්ගේ අණ පරිදි මුහම්මද් තුමාණන් අබියස ජිබ්රිල් (අලෛ) තුමා පෙනී සිට නබි (සල්) තුමාට "*කියවන්න*" යයි පවසයි. එවිට "*මම කියවීමට නොදනිමියි*" උම්මි නබි (සල්) තුමා පිළිතුරු දෙයි. එවිට ජිබ්රිල් (අලෛ), එතුමා වැළඳ ගෙන "*කියවන්නයි*" පවසයි. නබි (සල්) තුමාණෝ පෙර සේම පිළිතුරු දෙයි. නැවත වැළඳ ගෙන කියවන්න යයි පැවසූ විට නබි (සල්) තුමාණෝ නැවතත් පෙරසේ ම පිළිතුරු දෙයි.

(නබිවරයාණෙනි, සියල්ල) මැවූ ඔබේ පරමාධිපති (රබ්) ගේ නමින් (මගේ අණ පනත් සහිත අල්කුර්ආනය) ඔබ කියවන්න. මිනිසා ලේ කැටිත්තකින් (අලක්) මැව්වේ ඔහු ය. (නබිවරයාණෙනි, යළිත්) ඔබ කියවන්න ඔබේ රබ් (පරමාධිපතිය) ඉතා උදාරවන්ත වෙයි. ලියනය මගින් (ලියන්නට) ඉගැන්නුවේ ඔහු ය. හැරත් (ඒ මගින්) මිනිසා නොදන්නා දේවල් ඔහුට උගන්වයි. (96:1-5) නම් අල්කුර්ආන් ආයත (වාක්‍යය) පරායනය කර පෙන්වයි. මුහම්මද් (සල්) තුමා ද, එනයින් ම පාරායනය කරයි.

මුහම්මද් නබි (සල්) තුමාණන්ට මුල්වරට වහී පහළ වූ සිද්ධියයි, ඒ. වහීයෙහි කම්පනයෙන් එතුමාණෝ බයෙන් ගැහෙන්නට වූහ. එවිගස ම නිවසට හැරුණහ. මාව පොරවන්න මා පොරවන්නැ යි කියන්නට වූහ. තරමක් තැන්පත් වීමෙන් පසු, තමා ලද අත්දැකීම තම බිරිඳ කදීජා (රලි) තුමියට කීහ. මට අනතුරක්වත් වේවිද යි තුමාණෝ බියට පත් වූහ. එවිට, ඔබ බය නොවන්න. අල්ලාහ් ඔබව අත නොහරියි. ඔබ ඥාතීන්ගේ අයිතිවාසිකම් රකින්නෙහිය, සෙසු අයගේ බර දරා ගන්නෙහි ය, දිළින්දන්ට උදව් කරන්නෙහිය, ආගන්තුකයන්ට සත්කාර කරන්නෙහි ය, සාධාරණත්වය තහවුරු කරන්නෙහිය යනුවෙන් එතුමිය අස්වැසුවාය. ඉන්පසු වරකත් බින් නෞෆල් නැමැති පඬිවරයා වෙත නබි (සල්) තුමාණන් කැඳවාගෙන ගියාය. එකී පඬිවරයා නබි (සල්)තුමා, අල්ලාහ් ගේ රසූල් (දූතයා) බවට පූර්ව ආගම්වලින් සාක්ෂි ගෙනහැර දක්වමින් පැවසුවේය. මින් අනතුරුව, නබි (සල්)තුමාණෝ සිය නුබුව්වත් (නබිත්වයේ) සේවය ඇරඹූහ.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

ගවේෂණ කාර්ය පත්‍රිකා ලබාගෙන එහි දක්වා ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

ඇමුණුම 7.2.2

## ගවේෂණ පත්‍රිකාව

කණ්ඩායම 1 - වහී පහළ වීමට පෙර ලොව මගපෙන්වීමක් නොමැති ව අඳුරෙහි ගිලී පැවතුනේ යැයි අනුමාන කොට එදා පරිසරයේ පැවති තත්ත්වය විස්තර කරන්න.

කණ්ඩායම 2 - වහී පහළවීමෙන් පසු නබි (සල්) තුමා තුළ ඇති වූ වෙනස්කම් කුමක් දැයි ලැයිස්තු ගත කර දක්වන්න.

කණ්ඩායම 3 - නුබුව්වතයෙන් පසුව නබි (සල්) තුමා ද සහාබාවරු ද කුමන ගැටලුවලට මුහුණ දුන්නා ද යන්න විස්තර කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 7.0 : නබි සල් තුමාගේ සීරාහි සිදු වුන ප්‍රධාන සිද්ධීන් වටහාගෙන ඉන් ලැබෙන ඉගැන්වීම් පූර්වාදර්ශ ලෙස ගෙන කටයුතු කරයි.

නිපුණතා මට්ටම 7.3 : මිහ්රාජ් පිළිබඳ දැන විශ්වාස කර එහිදී ලැබුණු ත්‍යාගය වන සලාතය ඉටු කරයි.

ක්‍රියාකාරකම 7.3 : මිහ්රාජ් හි වැදගත්කම අවබෝධ කර ගමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- මිහ්රාජ් පිළිබඳ සටහන් - ඇමුණුම 7.3.1
- ගවේෂණ කාර්ය පත්‍රිකා - 7.3.2
- ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.1 :
- ★ ඇමුණුම 7.3.1 හි ඇති සිද්ධිය සිසුන්ට කියවා පෙන්වන්න.
- ★ මිහ්රාජ් ඉස්රා යන පදවල තේරුම සාකච්ඡා කරන්න.
- ★ පහත කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - නුබුව්වත් 12 වන වසරේ දී මිහිරාජ් සිද්ධිය සිදුවූ බව (ක්‍රි.ව. 621)
> - මෙය නබි (සල්) තුමාගේ ජීවිතයේ සිදුවූ වැදගත් සිද්ධියක් බව
> - මෙම සිද්ධිය නබීත්වයට සාක්ෂියක් වන බව

පියවර 7.3.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ ගවේෂණ උපදෙස් පත්‍රිකා, ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් ලබාදෙන්න. කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- ★ සෑම කණ්ඩායමකට සිය ගවේෂණ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්නා ලෙස දන්වන්න.

පියවර 7.3.3 :
- ★ කණ්ඩායම් ගවේෂණ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- ★ පළමුව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබාදෙන්න.
- ★ අනෙක් කණ්ඩායම්වල සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතුවන සේ සමාලෝචනය ඉදිරිපත් කරන්න.

- නුබුව්වත් 10 වන වසර නබි (සල්) තුමාට වේදනාවෙන් පිරි ආමුල් හුස්න් යන වසර වූ බව
- එහිදී සිදුවූ මිහ්රාජ් යන සිද්ධිය නබි සල් තුමාගේ සිත සනසන සිද්ධියක් වූ බව
- මුහම්මද් (සල්) තුමා තනි පුද්ගලයකු නොවන අතර එතුමාට පෙර පැමිණි නබිවරු බොහොමයක් වූ අතර, ඔවුන් මිහ්රාජ් ගමනේ දී නබි (සල්) තුමා හමු වූ බව
- ඉස්ලාමය පිළිගැනීම ප්‍රතික්ෂේප කළ අයට මෙය අවවාදයක් වූ බව හා ඉස්ලාමය පිළිගැනීමට සාධකයක් වූ බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- ඉස්රා, මිහ්රාජ් යන්නෙහි වැදගත්කම විස්තර කරයි.
- ඒවා මුස්ලිම්වරුන්ගේ විශ්වාසය කෙරෙහි වැදගත් බව අන් අයට පවසයි.
- මෙම සිද්ධියෙන් ලැබෙන ඉගෙනුම ජීවිතයේ දී අනුගමනය කරයි.
- කුද්ස්හි විමුක්තිය සඳහා ප්‍රාර්ථනා කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.3.1

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ කාර්ය පත්‍රිකාව හොඳින් නිරීක්ෂණය කරන්න.
- කණ්ඩායම තුළ සාකච්ඡා කර ගවේෂණය කළ දේ ගොනු කර ලියාගන්න.
- ගොනු කළ කරුණු පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

දී ඇති වගුවේ A තීරුව හා ගැලපෙන පිළිතුර B තීරුවෙහි ලියන්න.

| A | B |
|---|---|
| 1. ආමුල් හුස්න් යනු | ........................................ |
| 2. අල් ඉස්රා යනු | ........................................ |
| 3. අල් මිහ්රාජ් යනු | ........................................ |
| 4. නබිවරයා කැඳවාගෙන මලායිකාවරු | ........................................ |
| 5. නබි (සල්) ප්‍රථමයෙන් ගිය ස්ථානය | ........................................ |
| 6. නබි(සල්) අවසාන වරට ගිය ස්ථානය | ........................................ |
| 7. නබි (සල්) හමු වූ නබිවරු | ........................................ |
| 8. නබි(සල්) තුමාට ගෙන ලද ත්‍යාගය | ........................................ |
| 9. ඉස්රා, මිහ්රාජ් සිද්ධිය අපට දෙන ඉගැන්වීම් තුන | ........................................ |
| 10. මෙම සිද්ධිය පිළිබඳ පහදා දෙන සූරා | ........................................ |

ඇමුණුම 7.3.2

## අල් මිහ්රාජ්

අල්ලාහ් සිය දූතයා වූ මුහම්මද් (සල්) තුමාණන්, මිහ්රාජයට කැඳවී ය. මේ පිළිබඳව හදීස්වල මෙසේ සඳහන් වෙයි. ඉකුත් රාත්‍රියෙහි මගේ රබ් මට මහත් ගෞරවයක් කළේය. මා නිදා සිටින විට, ජිබ්රීල් (අලෛ) තුමා මාවෙත පැමිණියේ ය. මා කළබාවේ මිදුලට, කැටුව ගියේ ය. මගේ හදවත පලා zසම් zසම් දියෙන් සේදුවේය. මා ගමන් කරන්නට වාහනයක් ගෙනාවේ ය. එය බුරාක් නම් විය. එය අති වේගයෙන් ගමන් කරන්නකි. මා එහි නැග, හිඳගත් වහාම සණෙකින් බයිතුල් මුකද්දසයට ළඟා විය. එහි තිබෙන මස්ජිදුල් අක්සාවෙහි නැමදුවෙමි.

ඉන්පසු මිහ්රාජ් නම් ආකාශ ගමන ඇරඹුනි. එහි සිට අහස් හත ම තරණය කරමින් ඔවුහු සිද්රතුල් මුන්තහාවට ළඟා වූහ. අතරමග දී පූර්ව නබිවරුන් රැසක් සහ මලඉකාවරුන් රැසක් ද එතුමාට හමු වූහ. සිද්රතුල් මුන්තහාව පසු කොට, අල්ලාහ් හමුවට ගිය හ. ඔහු සමඟ සංවාදයෙහි යෙදුණාහ. පණස් කාල (50) සලාතය තෑගි වශයෙන් ලබා ගෙන, ආපසු හැරුණාහ. මග දී හමු වූ මූසා (අලෛ) තුමාගේ උපදෙස් අනුව, සලාත් සංඛ්‍යාව පියවරින් පියවර අඩු කර ගනිමින්, අවසානයේ දී පංචකාල සලාත් වශයෙන් ගෙනාහ. නබි (සල්) තුමාණන් අපා වේදනාව සහ ස්වර්ග සංතුෂ්ඨිය සියැසින් ම දුටුවේ මෙම ගමනෙහි දී ය. බයිතුල් මුකද්දසයට ළඟා වූ නබි (සල්) තුමාණෝ, එහි සිට මක්කාවට ආපසු පැමිණියහ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 7.0 : නබි (සල්) තුමාගේ සීරාහි සිදුවන ප්‍රධාන සිද්ධීන් වටහාගෙන ඉන් ලැබෙන ඉගැන්වීම් පූර්වාදර්ශ ලෙස ගෙන කටයුතු කරයි.

නිපුණතා මට්ටම 7.4 : හිජ්රතය වටහා ගෙන ඉස්ලාමය වෙනුවෙන් පරිත්‍යාග කර ජීවත් වෙයි.

ක්‍රියාකාරකම 7.4 : හිජ්රත් හි වැදගත්කම තේරුම් ගනිමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ගවේෂණ කාර්ය පත්‍රිකාව ඇමුණුම 7.4.1
- තව්ර් ගුහාවේ පින්තූර ඇමුණුම 7.4.2
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.4.1 :
- ★ ඇමුණුම 7.4.2 ඇතුළත් වී ඇති තව්ර් ගුහාවේ රූපය පෙන්වා සිසුන්ගේ අදහස විමසන්න.
- ★ හිජ්රත් ගමන යනු ඉස්ලාමීය ඉතිහාසයේ සිදුවූ ප්‍රධාන නැම්මකි. හිජ්රතයේ දී අල්ලාහ් නබි (සල්) තුමාට සෘජුව උදව් කළ බවට සාක්ෂි ඇතැයි පවසා සිසුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ පහත සඳහන් කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

> - හිජ්රත් යනු ආරක්ෂාව බව
> - මුස්ලිම්වරු තනි තනිව ද, කුඩා කණ්ඩායම් ලෙස ද මදීනාවට යමින් සිටි බව
> - හිජ්රතයට පෙර ම මදීනාවේ ඉස්ලාම් පැතිර තිබුණු බව
> - හිජ්රතය සිදුවූ අයුරු විස්තර කළ හැකි බව

පියවර 7.4.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ ඒ ඒ කණ්ඩායම්වලට ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන් හා ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබාදී ක්‍රියාකාරකම්වල යොමු කරන්න.
- ★ සිසුන් තමන්ගේ ගවේෂණ අනාවරණ වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 7.4.3 :
- ★ කුඩා කණ්ඩායම්වල ගවේෂණ අනාවරණ වාර්තා පන්තියට ඉදිරිපත් කරවන්න.
- ★ පළමුව ඉදිරිපත් කළ කණ්ඩායම පළමුව අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතුවන ලෙස සමාලෝචනය ඉදිරිපත් කරන්න.

- නබි (සල්) තුමා මක්කාව හැර මදීනාවට ගිය සිද්ධිය මිහ්රාජ් නම් වේ.
- හිජ්රතයට පෙර මදීනාවේ සිට මක්කාවට දා ගිය අය මගින් මදීනාවේ ඉස්ලාම් හඳුන්වා දී තිබුණි.
- කුරෙෂිවරුන්ගේ හිංසා පීඩා නිසා මුස්ලිම්වරු පියවරෙන් පියවර මදීනාවට යමින් සිටි බව
- හිජ්රතයට පෙර නබි (සල්) තුමා ඒ සඳහා සූදානම් වූ බව
- හිජ්රතයේ දී අල්ලාහ්ගේ දයාව නිසා අද්භූත සිද්ධීන් රැසක්ම සිදුවූ බව
- මදීනාව ඉස්ලාමීය පාලනයේ මධ්‍යස්ථානය වූ බව
- ඉස්ලාම් පැතිරීම වේගවත් වූ බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- හිජ්රතයේ වැදගත්කම පවසයි.
- හිජ්රතයේ ඓතිහාසික සිද්ධිය ගොනුකර පවසයි.
- දුක් පීඩාවලදී දෙවියන්ගේ උදව්ව අනිවාර්යයෙන්ම ලැබෙන බව විශ්වාස කරයි.
- නායකත්වයට බැඳී ජීවත් වෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- සෑම කණ්ඩායමක් ම තමාට දෙන ලද කාර්ය පත්‍රිකාව මනාව කියවා එහි උපදෙස් අනුව ක්‍රියා කිරීමට යොමු කරන්න.
- කණ්ඩායම් සාකච්ඡා මගින් ගවේෂණ අනාවරණ මුළු පන්තියටම ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

ඇමුණුම 7.4.1

## ගවේෂණ පත්‍රිකාව

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | නබි (සල්)තුමා හිජ්රත් ගමනෙහි යෙදීමට හේතු වූ කරුණු ගොනු කර ලියන්න. |
| කණ්ඩායම 2 | - | හිජ්රතය සිදුවීමට පෙර නබි (සල්) තුමා කළ පෙර සූදානම් ලියන්න. |
| කණ්ඩායම 3 | - | හිජ්රතයේ දී සිදුවූ අරුම පුදුම සිද්ධීන් තුනක් ලියන්න. |
| කණ්ඩායම 4 | - | ඉතිහාසයේ දී හිජ්රත් සිද්ධිය නිසා ඇති වූ ප්‍රධාන වෙනස්කම් පහක් ලියන්න. |

ඇමුණුම 7.4.2



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 7.0 : නබි (සල්) තුමාගේ සීරාහි සිදුවූ ප්‍රධාන සිද්ධීන් අවබෝධ කරගෙන එයින් ලැබෙන ඉගෙනුම් පූර්වාදර්ශ ලෙස ගෙන කටයුතු කරයි.

නිපුණතා මට්ටම 7.5 : සහාබාවරු කවුරුන්දැයි තේරුම් ගෙන ඔවුන් කළ පරිත්‍යාග හඳුනා ගනියි. ඒවා තම ජීවිතයේ අනුගමනය කරයි

ක්‍රියාකාරකම 7.5. : සහාබාවරුන්ගේ පරිත්‍යාගශීලී ගුණ අනුගමනය කරමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.5.1 තොරතුරු ගොනුව
- ඕමයි කඩදාසි, ෆෙල්ට් පෑන්
- ගවේෂණ කාර්ය පත්‍රිකා ඇමුණුම 7.5.2

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.5.1 :
- ★ ඇමුණුම් 7.5.1 සඳහන් සිද්ධිය ළමුන්ට කියාදෙන්න.
- ★ සිසුන් දන්නා සමාන සිද්ධීන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ★ සහාබාවරුන්ගේ පරිත්‍යාගයන් ඇගයීමට අවස්ථාව සලස්වන්න.
- ★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- සහාබාවරු යනු නබි (සල්) තුමාගේ මිතුරන් වන බව
- ඉස්ලාමය සුරැකීම සඳහා ඔවුන් කැපවීමෙන් ක්‍රියා කළ බව
- බද්ර් යුද්ධයට සහභාගී වූවෝ ඉතා ඉතුම් අය බව

පියවර 7.5.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ★ ඒ ඒ කණ්ඩායම් සඳහා ගවේෂණ කාර්ය පත්‍රිකා ලබාදෙන්න.
- ★ ලිපිලේඛන හා පෑන් ආදිය ලබාදී ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- ★ සෑම කණ්ඩායමකට සිය ගවේෂණ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

පියවර 7.5.3 :
- ★ කුඩා කණ්ඩායම්වලට සිය අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ පළමුව වාර්තාව ඉදිරිපත් කළ අයට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ අනෙකුත් කණ්ඩායම්වලට ද සිය සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පහත කරුණු ඉස්මතුවන සේ සමාලෝචනය ඉදිරිපත් කරන්න.

- ඉස්ලාමය පිළිගත් අවස්ථාවේ නබි (සල්) තුමා සමඟ සම්බන්ධකම් පැවැත්වූ අය සහබාවරු බව
- ඔවුන් නබි (සල්) තුමා සමඟ ඉතා කිට්ටු සම්බන්ධතාවක් පැවැත්වූ බව
- සිය ධනය, ජීවිත, සැප සම්පත්, දේපළ ආදී සියල්ල කැපකර ඉස්ලාමය සුරැකීමට සහබාවරු සූදානම්ව සිටි බව
- බද්ර් සටන සහාබාවරුන්ගේ පරිත්‍යාගයට උදාහරණයක් බව
- නබිවරුන්ගෙන් පසුව අල්ලාහ්ගේ පිළිගැනීමට පාත්‍ර වූ බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- සහාබාවරුන්ගේ වැදගත්කම, පරිත්‍යාග විස්තර කරයි.
- සහාබාවරුන්ගේ පරිත්‍යාගීය ගුණය උසස්කොට සලකයි.
- සහාබාවරුන්ගේ උතුම් දිවිය ආදර්ශනය කොට ජීවත් වෙති.
- සිය කාලය, ධනය හා ශ්‍රමය අන් අය වෙනුවෙන් වැය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 7.5.1

මෙම සිද්ධිය සිසුන්ට පවසන්න.

## පරිත්‍යාග

යර්මුක් නැමැති ස්ථානයේ රෝම හමුදාවට එරෙහිව නැගී සිටීමට මුස්ලිම්වරුන්ට සිදුවිය. මෙම සටනේ දී දෙපිරිසෙන්ම බොහෝ දෙනා මරණයටත්, තුවාලවීම්වලටත් ලක්විය.

අබුජහ්ම් ඉබ්නු හුදෙයිෆා දිය බඳුනක් රැගෙන තම සුළු පියාගේ පුතණුවන් සොයා ගමන් කළේය. දැඩි ලෙස තුවාල වූ පිරිස අතර සිටි ඔහු දිය බඳුන දැක සතුටු වී ජලය ඉල්ලා සංඥා කළේය. අබූ ජහ්ම් ගෙන් ජලය බීමට සූදානම් වෙද්දී තමන් අසල මරණාසන්නව වැතිරී සිටි කෙනෙකු ජලය ඉල්ලා කෙඳිරි ගාන හඬ ඇසුණි.

එලෙස කෙඳිරිගාමින් සිටියේ හිෂාම් ඉබ්නු අබුල් ආස්ය. මේ අවස්ථාවේ දී එම සුළු ජල ප්‍රමාණය ඔහුට දෙන ලෙස සංඥා කෙරුණි. අබූජහ්ම් විසින් එම ජලය ඔහුට දීමට තැත් කරද්දී ඒ අසල වැතිරී සිටි කෙනෙකුගේ කෙඳිරිලි හඬ ඇසුණි.

මේ අවස්ථාවේ හිෂාම් විසින් ඔහුට එම ජලය ලබා දෙන ලෙස සංඥා කළේය. එය රැගෙන යද්දී ඔහු මරණයට පත්විය. නැවත හිෂාම් වෙත දුව ආවිට ඔහු ද මැරී සිටියේය. අනතුරුව තම සුළු පියාගේ පුතනුවන් වෙත අබූජිහ්ම් දුව ආවිට ඔහු ද මරණයට පත්වී තිබුණි.

මරණාසන්නයේ සිටියදීත් තම අවශ්‍යතා පසෙකලා කොටසක් වත් නොගෙන අනුන් වෙනුවෙන් කැපවුණු පරිත්‍යාගශීලීන් නිසා ඒ යුගයේ මුස්ලිම්වරුන් ජයකොඩි බන්දහ, කීර්ති නාම තබා මෙලොවේත්, පරලොවේත් අසමසම සැනසුම ලබාගත්හ.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

| | | |
|---|---|---|
| පළමු කණ්ඩායම | - | ඔබ කණ්ඩායම තුළ සාකච්ඡා කර සහාබාවරුන්ගේ නම් ලියන්න. |
| දෙවන කණ්ඩායම | - | ඔබ කණ්ඩායමට දෙන ලද මාතෘකාව යටතේ තොරතුරු රැස්කර ලියන්න |
| තුන්වන කණ්ඩායම | - | ඉහත සිද්ධීන් කතාවක් ලෙස ලියන්න. ඒවා සාක්ෂි සහිත සිද්ධීන් වීම කෙරේ අවධානය යොමු කරන්න. ලියූ දේ පන්තියේ දී ඉදිරිපත් කිරීමට සූදානම් වන්න. |

ඇමුණුම 7.5.2

## ගවේෂණ පත්‍රිකාව

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | ඔබ දන්නා සහාබාවරු 10 දෙනෙකුගේ නම් ලියන්න. |
| කණ්ඩායම 2 | - | බද්ර් යුද්ධයේ දී සහාබාවරුන්ගේ කැපවීම කෙසේ වූයේ ද ? |
| කණ්ඩායම 3 | - | සහාබාවරු කළ පරිත්‍යාග පෙන්වන සිද්ධි දෙකක් ලියන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 8.0 : භෞතික පරිසරය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිකෝණය වටහාගෙන ක්‍රියාකරයි.

නිපුණතා මට්ටම 8.1 : භෞතික පරිසරයේ ඇති සියල්ල අල්ලාහ්ගේ දායාද බව දැන කෘතඥතාවය දක්වමින් ඒවා සුරැකීමට ඉදිරිපත් වෙයි.

ක්‍රියාකාරකම 8.1 : දෙවියන්ගේ දායාද වන භෞතික සම්පත් සුරකිමු.

කාලය :

ගුණාත්මක යෙදවුම් :
- භෞතික සම්පත් පිළිබඳ අත් පත්‍රිකාව - ඇමුණුම 8.1.1
- ගවේෂණ කාර්ය පත්‍රිකාව 8.1.2
- ඩිමයි කඩදාසි
- ෆෙල්ට් පෑන්

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.1.1 :
- ★ සිසුන් කණ්ඩායම් කරන්න.
- ★ කණ්ඩායම්වලට ගවේෂණ උපදෙස් පත්‍රිකා, ලිපිලේඛන හා අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.
- ★ අත් පත්‍රිකාව සිසුන්ට අවබෝධ කරගත හැකි අයුරු කියවන්න.
- ★ පහත කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- භෞතික පරිසරය අල්ලාහ්ගේ දායාදයක් බව
- එය සුරැකීම අපගේ වගකීමක් බව
- මිනිසාගේ ක්‍රමවත් ජීවිතයක් සඳහා භෞතික පරිසරය අවශ්‍ය වන බව
- එය ක්‍රමවත් ව සුරැකීම අපගේ වගකීම බව

පියවර 8.1.2 :
- ★ සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- ★ ගවේෂණ පත්‍රිකාවේ පිටපතක් බැගින් ලබාදෙන්න.
- ★ ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් ලබාදෙන්න.
- ★ ගවේෂණ කර වාර්තා සකස් කිරීමට උපදෙස් දෙන්න.
- ★ කණ්ඩායම් වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් කරගන්නා ලෙස දැනුම් දෙන්න.

පියවර 8.1.2 :
- ★ කුඩා කණ්ඩායම්වලට සිය ගවේෂණ අනාවරණ පන්තියේ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- ★ ප්‍රථමයෙන් ඉදිරිපත් කළ කණ්ඩායමට ප්‍රථමයෙන් අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ★ අනෙක් කණ්ඩායම්වලට සිය සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සමාලෝචනය ඉදිරිපත් කරන්න.

> - පොළොව, ජලය, වාතය, ශාක, සතුන් යන සියල්ල අල්ලාහ් අපට ලබාදුන් දායාද වන්නේ ය.
> - භෞතික පරිසරය ක්‍රමවත්ව සුරැකීමේ සෑම මුස්ලිම්වරයෙකුගේම වගකීම බව
> - සෞන්දර්ය හැඟීම ඉස්ලාමයේ පදනම බව
> - භෞතික සම්පත් අනිසි ආකාරයට පරිහරණය කිරීම වරදක් බව
> - අවශ්‍යතාවය නොමැතිව ගස්කොළන් කැපීම, ගිනි තැබීම, සතුන්ට හිංසා පීඩා කිරීම කිසිසේත් නොකළ යුතු බව

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- භෞතික සම්පත් නම් කරයි.
- භෞතික සම්පත් අල්ලාහ්ගේ දායාද බව අවබෝධ කරයි.
- භෞතික සම්පත් විධිමත්ව සුරකියි.
- භෞතික සම්පත් සුරැකීමේ අවශ්‍යතාව අනුන්ට ද අවබෝධ කරවීමට කටයුතු කරයි.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය උපදෙස්

- ඔබේ කණ්ඩායමටලැබී ඇති කණ්ඩායම් ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
- ක්‍රියාකාරකම් සිදු ගවේෂණ වාර්තාවේ සකස් කරන්න.

ඇමුණුම 8.2.1

# භෞතික සම්පත් සුරකිමු

★ අප ජීවත්වන පරිසරයේ ඇති අපගේ ජීවිතයට උදව්වන අංග භෞතික සම්පත් නම් වේ.

- භූමිය
- ජලය
- වාතය
- සතුන්
- ශාක
- පක්ෂීන්

★ භූමිය, ජලය, වාතය ආදිය අප ජීවත්වීමට මූලික අවශ්‍යතා වේ.

- භූමිය - ගෙවල් සෑදීමට
  කෘෂි කටයුතු සඳහා
  රැකියා කිරීමට භූමිය අවශ්‍ය වේ
  කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීමට
- ඛනිජ තෙල්
- ජලය - බීමට
  නෑමට
  වගා කිරීමට
  සේදීමට
- වාතය - ශ්වසනය කිරීමට
  අන් සතුන් ජීවත් වීමට
  ශාක ජීවත්වීමට
  අන් ජීවීන් ශ්වසනය කිරීමට
- සජීවීන් - අපට ආහාර ලබාගැනීමට
  අපගේ වැඩ කටයුතු පහසු කිරීමට

එහෙයින් භෞතික පරිසර සුරැකීම අපගේ යුතුකමයි.

පොළොව හා ජලය පහත කරුණු නිසා දූෂණය වේ.

- කෘමිනාශක එකතු කිරීම
- කාර්මික අපද්‍රව්‍ය එක්රැස්වීම.
- අපවිත්‍ර ජලය එකතුවීම.
- රෝහල් ආපනශාලා වැනි ස්ථානවලින් බැහැරවන ජලය එකතුවීම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ශාක හා සතුන් ද අද විවිධ තර්ජනවලට ලක් වේ.

- ශාක විනාශ කිරීම
- ශාක ක්‍රමවත් ව භාවිතා නොකිරීම
- නාගරීකරණය හා අන් සංවර්ධන වැඩ සටහන් සඳහා කැලෑ විනාශ කිරීම
- නීති විරෝධී ලෙස ගස් කපන්නන්ගේ ක්‍රියාකාරකම්
- සත්ත්ව අභයභූමි නිසි පරිදි පාලනය නොකිරීම
- දඩයම් කිරීම
- මිනිසා සහ සතුන් අතර සිදුවන තරගය
- ව්‍යාපාරික කටයුතු සඳහා මරාදමනු ලැබීම

ඉස්ලාම් පරිසරය සුරැකීමට අණ කරයි.

- මුස්ලිම්වරයෙක් ගසක් වවා එයින් පක්ෂීන්, සතුන්, ප්‍රයෝජනය ලැබුවද එය ඔහු කළ කුසලයක් සදකාවක් වන්නේ ය.

  "*කියාමාව ආසන්න වූ විටදී වුව ද ඔබගේ අතෙහි රටඉඳි පැළයක් වේ නම් එය ඔබ හිටවන්න.*" මේවා මිණිවදන් ය.

- අනවශ්‍ය ලෙස ගස් නොකපන්න. ගිනි නොතබන්න. ආහාර සඳහා මිස සතෙක් නොමරන්න.
- සෙවන දෙන ගස්, මහමඟ දෙපස රැඳී තිබෙන ජලයේ මළ මූත්‍ර පහ නොකරන්න.

ඇමුණුම 8.2.2

## ගවේෂණ පත්‍රිකාව

| | | |
|---|---|---|
| කණ්ඩායම 1 | - | භෞතික සම්පත් වූ පොළොව, ජලය, වායුගෝලය ආදියෙන් අප ලබන ප්‍රයෝජන 10 ක් ලියන්න. |
| කණ්ඩායම 2 | - | ශාක හා සතුන්ගෙන් අපට ලැබෙන ප්‍රයෝජන 10ක් ලියන්න |
| කණ්ඩායම 3 | - | ශාක හා ජීවීන් රැක ගැනීම සඳහා අප අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 10ක් ලියන්න. |
| කණ්ඩායම 4 | - | සිය භෞතික පරිසරය සුරැකීම මුස්ලිම්වරයෙකුගේ වගකීම වේ යන්න වටහා ගැනීමට උපකාරවන ඉස්ලාමීය දේශන ලියා දක්වන්න. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| නිපුණතාව 8.0 | : | භෞතික පරිසරය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිකෝණය අවබෝධ කොට ගෙන ක්‍රියා කරයි. |
| නිපුණතා මට්ටම 8.1 | : | භෞතික පරිසරයේ ඇති සියල්ල අල්ලාහ්ගේ දායාද බව දැන කෘතඥතාවය දක්වමින් ඒවා සුරැකීමට ඉදිරිපත් වෙයි. |
| ක්‍රියාකාරකම 8.1 | : | පොදු දේපළ සුරකිමු. |
| කාලය | : | |
| ගුණාත්මක යෙදවුම් | : | ● ඇමුණුම 8.1.1 තොරතුරු ගොනුව<br>● ඇමුණුම 8.1.2 ගවේෂණ කාර්ය පත්‍රිකා<br>● ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්<br>● බ්‍රිස්ටල් බෝඩ් |

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.1.1 :
- ★ ඇමුණුම් 8.1.1 හි ඇති කතාව සිසුන්ට කියන්න.
- ★ පොදු දේපළ සුරැකීම සම්බන්ධයෙන් අප මුතුන් මිත්තන් කෙසේ සැලකිලිමත් වූවා ද යන්න අසා ඒ පිළිබඳ සිසුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- ★ පහත කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- ● පොදු දේපළ අපට ප්‍රයෝජනවත් බව
- ● පොදු දේපළ ආරක්ෂා කළ යුත ඒවා බව
- ● පොදු දේපළ සුරැකීම අපගේ යුතුකම බව
- ● පොදු දේපළ සුරැකි ආකාරය කියාමාවේ දී විමසනු ලබන බව

පියවර 8.1.2 :
- ★ සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- ★ ඒ ඒ කණ්ඩායමට ගවේෂණ උපදෙස් පත්‍රිකා, ඩිමයි කඩදාසි හා ෆෙල්ට් පෑන් ලබාදෙන්න. එම උපදෙස් අනුව ගවේෂණයේ යෙදෙන සිසුන්ට අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.
- ★ ඩිමයි කඩදාස්, ෆෙල්ට් පෑන්, බ්‍රිස්ටල් කාඩ්, ආදිය පන්තියට බෙදා දී සිසුන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරන්න.
- ★ කණ්ඩායම්වල ගවේෂණ අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

පියවර 8.1.3 :
- ★ එක් එක් කණ්ඩායමට සිය ගවේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

★ පළමුව ඉදිරිපත් කළ කණ්ඩායමට පළමුව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

★ පහත කරුණු මතුවන සේ සමාලෝචනය ඉදිරිපත් කරන්න.

- පොදු ජනතාවගේ ප්‍රයෝජන සඳහා ඇති දේ පොදු දේපළ නමින් හැඳින්වෙන බව. *උදා* : පාසල්, දුම්රිය
- ඒවා සුරැකීම සෑම අයෙකුගේම අනිවාර්ය වගකීම බව
- අල්ලාහ් අපට බාර කළ දේවල් වන පොදු දේපළ ගැන කියාමාවේදී අපගෙන් විමසනු ලබන බව
- ඉස්ලාම් පොදු දේපළ සුරකින ලෙස අණ කරන බව

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක

- පොදු දේපළ නම් කරයි.
- පොදු දේපළ අල්ලාහ් අපට හිමි කළ දායාද බව සලකා ක්‍රියා කළ යුතු බව පිළිගනී.
- පොදු දේපළ විධිමත් ව පරිහරණය කරයි.
- පොදු දේපළ සැලකිල්ලෙන් සුරකී.
- පොදු දේපළ සුරැකීමේ අවශ්‍යතාව අන් අයට වටහා දෙයි.

කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා උපදෙස්

- ඔබට ලබා දී ඇති ගවේෂණ කාර්ය පත්‍රිකාව හොඳින් නිරීක්ෂණය කරන්න
- සාකච්ඡා කර ගවේෂණ කළ දේවල් ගොනුකර ලියාගන්න.
- ඒවා පන්තියේ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 8.1.2

## ගවේෂණ කාර්ය පත්‍රිකාව

කණ්ඩායම 1 - ඔබේ පරිසරයේ ඇති පොදු දේපළ ලැයිස්තුගත කරන්න.

කණ්ඩායම 2 - පොදු දේපළ අනිසි ලෙස යොදා ගැනීම නිසා අත්වන බලපෑම් 5 ක් ලියන්න.

කණ්ඩායම 3 - පොදු දේපළ සුරැකීමට අප අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 5 ක් ලියන්න.

කණ්ඩායම 4 - පොදු දේපළ සුරැකීමේ අවශ්‍යතාවය දක්වන ඉස්ලාමීය ඉගැන්වීම් දෙකක් ලියන්න.

ඇමුණුම 8.1.1

## තොරතුරු ගොනුව

උමර් (රලි) තුමා මුස්ලිම්වරුන්ගේ දෙවන කලීෆාවරයා වූහ. ඉතිහාසයේ සඳහන් වන ඉතා උතුම් ආදර්ශයක් ලෙස එතුමා ජීවත් වූහ.

දිනක් එතුමා සිය රාජකාරි කටයුතුවල යෙදෙමින් සිටියහ. රාත්‍රී කාලය වූ නිසා එතුමා කටයුතු කළේ පහන් එළියෙන් ය. එම අවස්ථාවේ එතුමන්ගේ මිත්‍රයෙක් එතුමා බැහැදැකීමට පැමිණියේය. මිතුරා පිළිගත් කලිෆාතුමා තමා ඉදිරියේ අසුන් ගැන්වීය. තමා ඉදිරියේ දැල්වෙමින් තිබූ පහන නිවා දමා වෙනත් පහනක් දැල්වූයේය. මෙය දුටු මිතුරා පුදුමයෙන් කලීෆා තුමනි, මා එන විට දැල්වෙමින් තිබූ පහන නිවාදමා වෙනත් පහනක් දැල්වීමට හේතුව කුමක් දැයි ඇසුවේය. මිතුර, ඔබ එනවිට මම රාජකාරියෙහි යෙදී සිටියෙමි. එහෙයින් රජයේ බෛතුල් මාලයට අයත් පහනක් දල්වා තැබුවෙමි. අප දැන් යෙදී සිටින්නේ පෞද්ගලික වැඩකය. එහෙයින් බෛතුල් මාල් භාණ්ඩාගාරයට අයත් පහන නිවා දමා මට අයත් පහන දැල්වූයෙමි යි උමර් (රලි) තුමා පැහැදිලි කළහ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# තක්සේරුව හා ඇගයීම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩසටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම හඳුන්වා දිය හැකිය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සියලු ම සිසුනට අදාළ නිපුණතා සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාව හෝ ලබා ගැනීම අපහසු නොවේ. අනෙක් අතට ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීමය.

තක්සේරු කිරීමේ යෙදී සිටින ගුරුවරුනට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණ (FEED BACK) හා ඉදිරි පෝෂණය (FEED FORWARD) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ නිපුණතා අතරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය (STUDENT-CENTRED) නිපුණතා පාදක (COMPETENCY-BASED) ක්‍රියාකාරකම් දිශාභිමුඛ (ACTIVITY-ORIENTED) කර ගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම, ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ (TRANSFORMATION ROLE) හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සන්තතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂයමාලාව ඉගෙනුම හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමග සමෝධාන කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේ දී සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරුකරණයටත් ක්‍රියාකාරකම්වල තුන් වැනි පියවරේ දී සිසුන් ස්වකීය අනාවරණය ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකි වේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණපා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශී වී තිබෙන දැනුම, ආකල්ප හා කුසලතා මූලික කොට සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුනට අත දේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්තිකාමරය තුළ සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ගොඩනැගීම තහවුරු කිරීමටත් ඇගයීම යටතේ එසේ ගොඩ නගා ගත් චර්යා ප්‍රමාණනය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරුව හා ඇගයීම පිළිබඳ වැඩපිළිවෙල වැඩිදියුණු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. මෙසේ ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා මුලින්ම කළ යුත්තේ ක්‍රියාකාරකම් සන්තතියට ඇතුළත් ක්‍රියාකාරකම්, කාණ්ඩ කිහිපයකට වෙන්කර ගැනීමයි. සිසු ඉගෙනුම විකසිත කළ හැකි ප්‍රභේද කිහිපයක් ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩය හා බැඳෙන විෂය සන්ධාරය පදනම් කර ගනිමින් දෙවනුව හඳුනා ගත යුතුයි. තෝරාගත් ප්‍රභේද පදනම් කර ගෙන ගුරුවරයාට හා සිසුන්ට උපදෙස් ඇතුළත් වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කෙරෙන උපකරණ සකසා ගැනීම ඊළඟ පියවර වන අතර, සෑම ක්‍රියාකාරකම් කාණ්ඩයක් ආරම්භයේ දී ම මෙම උපකරණ සිසුන්ට හඳුන්වා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යයි. මේ අනුව ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරුවරයෙකුට යොදා ගත හැකි ප්‍රභේද කිහිපයක් මතු දැක්වේ.

- සංකල්ප සිතියම් (CONCEPT MAPS)
- බිත්ති පුවත්පත් (WALL NEWS PAPERS)
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් (QUIZZES)
- ප්‍රශ්න සහ පිළිතුරු පොත් (QUESTION AND ANSWER BOOK)
- ශිෂ්‍ය කාර්ය සාධන ගොනු (PORTFOLIOS)
- සිසු නිර්මාණ ප්‍රදර්ශන (EXHIBITIONS)
- විවාද (DEBATES)
- සාකච්ඡා මණ්ඩල (PANEL DISCUSSIONS)
- සම්මන්ත්‍රණ (SEMINARS)
- ක්ෂණික කථා (INPROMPTU SPEECHES)
- භූමිකා රංගන (ROLE PLAYS)
- සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම (PRESENTATION OF LITERATURE REVIEWS)
- ක්ෂේත්‍ර පොත්/ස්වභාව අධ්‍යයන දිනපොත්/හොඳ වැඩ පොත් (FIELD BOOKS/ NATURE DIARIES)
- ප්‍රායෝගික පරීක්ෂණ (PRACTICAL TESTS)

පාඨමාර්ගයේ තුන්වන කොටස යෝජිත ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීමේ අවස්ථා හා ඒ සඳහා තෝරාගෙන ඇති උපකරණ හඳුන්වා දීමට සැලසුම්කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් තක්සේරුව හා ආගයීම දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පුළුල් වන අතර ආශාවෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමේ නියැලීමට සිසුනට හැකි වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් දීර්ඝ කිරීම සඳහා වන උපකරණ

1. පාසල් වාරය හා උපකරණ අංකය : පළමු වාරය - 01

2. ඇතුළත් නිපුණතා මට්ටම් : 1.3, 1.4, 1.5, 1.6

3. ආවරණය කරන විෂය සන්ධාරය :
   - මලාඉකාවරු
   - ආගම්
   - දූතයින්
   - කියාමා දිනය

4. උපකරණයේ ස්වභාවය : විශ්වාසය හා සම්බන්ධ අංග විස්තරාත්මකව ගවේෂණය කිරීම සඳහා අත්පත්‍රිකා සෑදීම.

5. උපකරණයේ අරමුණු : විශ්වාසය හා සම්බන්ධ අංග විස්තරාත්මකව දැන ගනියි. එය හා සම්බන්ධ තොරතුරු විස්තරාත්මක ව රැස් කරයි.

   රැස්කළ කරුණු විශ්ලේෂණය කොට අත්පත්‍රිකාව සකස් කරයි.

6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :
   1. ගුරුවරුන් සඳහා :
      - ක්‍රියාකාරකම ක්‍රියාත්මක කිරීමට පෙර ඒ පිළිබඳව පන්තියේ සිසුන්ට හඳුන්වා දෙන්න.
      - කණ්ඩායම් වශයෙන් එක්ව තොරතුරු රැස්කිරීමෙන් ආරම්භ කොට සෑම කෙනාම තනි තනිව අත්පත්‍රිකා සකස් කළ යුතු බව සිසුන්ට පවසන්න.
      - සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
      - එක් එක් කණ්ඩායමට අදාළ ක්‍රියාකාරකම් බෙදා දෙන්න.
      - තොරතුරු රැස්කිරීම සඳහා පොත්පත් පරිශීලනයට සිසුන් යොමු කරන්න.
      - රැස්කළ තොරතුරු සටහන් කර ගැනීමට සිසුන් යොමු කරන්න.
      - රැස්කළ තොරතුරු පිළිබඳව තමන් අතර සාකච්ඡා පැවැත්වීමට සිසුන් යොමු කරන්න.
      - ඒවා අත්පත්‍රිකාවක් ලෙස සකස් කර ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- අත්පත්‍රිකාව ඉදිරිපත් කළ යුතු දිනය සිසුන්ට දන්වන්න.
- නිර්ණායකවලට අදාළව ලකුණු පවරන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණය සිසුන්ට ලබා දෙන්න.

2. සිසුන්ට උපදෙස් :
- දෙන ලද උපදෙස් අනුව ක්‍රියාකාරකම්වල යෙදෙන්න.
- නියමිත දිනයේ දී අත්පත්‍රිකාව ඉදිරිපත් කරන්න.

## කණ්ඩායම් සඳහා ක්‍රියාකාරකම්

කණ්ඩායම් අංක 1 - පහත සඳහන් මාතෘකා යටතේ තොරතුරු පොත්පත්වලින් සොයා බලා ලියන්න.

1. අල්ලාහ්ගේ මලාඉකාවරු පිළිබඳ තොරතුරු විස්තරාත්මක ව ගවේෂණය කරන්න.
2. මලාඉකාවරුන්ගේ ගති ලක්ෂණ
3. ඔවුන්ගේ කාර්යයන්
4. ඔවුන් විශ්වාස කිරීම නිසා අපගේ චර්යාවේ ඇතිවන වෙනස්කම්

කණ්ඩායම අංක 2 -

1. අල්ලාහ් විසින් පහළ කරන ලද ආගම් පිළිබඳ විස්තර
2. එම ආගම් පහළ කරන ලද භාෂාවන්
3. ඒවා පහළ කරනු ලැබූ සමාජ
4. ඒවා විශ්වාස කිරීම නිසා අපගේ චර්යාවේ ඇතිවන වෙනස්කම්

කණ්ඩායම් අංක 3 -

1. රසූල් හා නබි යන පද අතර වෙනස්කම්
2. රසූල්වරු පිළිබඳ ව ඔබ දන්නා කරුණු
3. අල්කුර්ආනයේ සඳහන්වන නබිවරුන්ගේ නම්
4. රසූල්වරු හා නබිවරු විශ්වාස කිරීම නිසා අපගේ චර්යාවේ ඇතිවන වෙනස්කම්

කණ්ඩායම් අංක 4 -

1. කියාමා දිනය යන්නෙහි අර්ථය
2. කියාමා දිනයට අදාළ සුළු හා මහා ලක්ෂණ
3. සිදුවූ හා ඇති හා සිදුවීමට ඇති ලක්ෂණ
4. කියාමා දිනය ගැන විශ්වාස කිරීම නිසා අපගේ චර්යාවේ ඇතිවන වෙනස්කම්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිර්ණායක / කණ්ඩායම් අංකය/නම | අරමුණ පැහැදිලි කරයි | තොරතුරු රැස්කිරීමට ගත් උපාය මාර්ගවල අදාළ බව | තොරතුරු රැස්කිරීම සහ ඒ පිළිබඳ සටහන් තබාගැනීම | ක්‍රියාකාරී උපාය මාර්ගවල අදාළත්වය සහ තර්කානුකූල බව | තීරණවලට එළෙඹීම සහ වාර්තාවේ පරිපූර්ණත්වය | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

ලකුණු දීමේ පටිපාටිය :

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| මධ්‍යස්ථයි | 02 |
| සංවර්ධනය විය යුතුයි | 01 |

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ

1. පාසල් වාරය හා උපකරණ අංකය : දෙවන වාරය - 02
2. ආවරණය වන නිපුණතා මට්ටම් : 3.2
   3.5
   3.6
3. ආවරණය කරන විෂය සන්ධාරය :
   - ආහාර ගැනීම සහ ඇඳුම් ඇඳීම පිළිබඳ ඉස්ලාමීය පිළිවෙත්
   - ගුරුවරුන්ට ගෞරව දැක්වීම
   - සතුන් කෙරෙහි කරුණාව දැක්වීම
4. උපකරණයේ ස්වභාවය :
   - ඉස්ලාමීය ආචාරධර්ම පිළිබඳව වටහාගෙන ඒ පිළිබඳ ව කෙටියෙන් කතාවක් පවත්වයි
5. උපකරණයේ අරමුණු :
   - ඉස්ලාමීය ආචාරධර්ම පිළිබඳව ගවේෂණය කරයි.
   - ඒ පිළිබඳ තොරතුරු රැස්කරයි.
   - රැස්කළ තොරතුරු පදනම් කරගෙන විශ්ලේෂණයක යෙදෙයි
   - රැස්කළ තොරතුරු පදනම් කරගෙන කෙටි කතාවක් පවත්වයි
6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :
   1. ගුරුවරුන් සඳහා :
      - ගවේෂණය පිළිබඳ ව සිසුන්ට හඳුන්වා දෙන්න.
      - කණ්ඩායම් වශයෙන් එක්ව තොරතුරු රැස්කිරීමෙන් ආරම්භ කොට එක් එක් ශිෂ්‍යයා තනි තනි ව සිය කතාව සකස් කර ගත යුතු බව සිසුන්ට කියන්න.
      - පහත සඳහන් ගවේෂණ මාතෘකාවට අනුව තොරතුරු රැස්කර ඒවා සටහන් කර ගැනීමට සිසුන් යොමු කරන්න.
      - තොරතුරු ලබා ගැනීමට සුදුසු පොත්පත් කියවා තොරතුරු රැස්කර ගන්නා ලෙස සිසුන් යොමු කරන්න.
      - රැස්කළ තොරතුරු සිය කණ්ඩායම සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබාදෙන්න.
      - තම කණ්ඩායමෙන් පළමුව කතාව පවත්වන්නා තෝරා ගැනීමට සිසුන් යොමු කරන්න.
      - කතාව පැවැත්විය යුතු වේලාව සිසුන්ට දන්වන්න.
   2. සිසුන්ට උපදෙස් :
      - ඔබට දෙන ලද උපදෙස් අනුව ක්‍රියාකාරකම්වල යෙදෙන්න.
      - විශ්වාසවන්ත පොත්පත්වලින් ලබාගත් නිවැරදි තොරතුරු පමණක් සටහන්වලට ඇතුළත් කරන්න.
      - අදාළ දිනයේ දී කථාව පැවැත්වීමට සූදානම්වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## කණ්ඩායම් සඳහා ක්‍රියාකාරකම්

කණ්ඩායම් අංක 1 -
1. ආහාර ගැනීම හා ඇඳුම් ඇඳීම පිළිබඳ අල්කුර්ආනීය මගපෙන්වීම්
2. ආහාර ගැනීම හා ඇඳුම් ඇඳීම පිළිබඳ සුන්නාහි උපදෙස්
3. ආහාර ගැනීමේ දී හා ඇඳුම් ඇඳීමේ දී පිළිපැදිය යුතු ආචාරධර්ම

කණ්ඩායම අංක 2 -
1. ගුරුවරුන්ට සැළකීම පිළිබඳ අල්කුර්ආනීය මගපෙන්වීම්
2. ගුරුවරුන්ට සැළකීම පිළිබඳ සුන්නාහි උපදෙස්
3. ගුරුවරයාට ඉටුකළ යුතු යුතුකම්

කණ්ඩායම් අංක 3 -
1. ජීවීන්ට කරුණාව දැක්වීම පිළිබඳ ඉස්ලාමීය අවවාදයක්
2. ජීවීන් කෙරෙහි අනුකම්පාව දැක්වීම පිළිබඳ ඉස්ලාමීය ඓතිහාසික සිද්ධීන්
3. ජීවීන්ට කළ යුතු යුතුකම්

| නිර්ණායක<br>සෑම නිර්ණායකයටම ලකුණු 04 බැගින්<br>කණ්ඩායම් අංකය<br>නම | ප්‍රවේශය, මාතෘකාව, හැඳින්වීම හා එහි අදාළත්වය | මාතෘකාවට අදාළ කරුණු ඇතුළත්වීම, සංවිධානය, නිවැරදිව භාෂාව යොදා ගැනීම | සුවිශේෂ යොමුව, සිය අදහස් දැක්වීම, නිර්මාණාත්මක හැකියාව | පැහැදිලි කිරීම්, හඬ, මුහුණින් අදහස් දැක්වීම, කාලය හා විනය | සමාලෝචනය හා අවසානය | මුළු ලකුණු - 20 න් | අවසාන ලකුණු - 10 න් |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |
| 5 | | | | | | | |

ලකුණු දීමේ පටිපාටිය :

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| මධ්‍යස්ථයි | 02 |
| සංවර්ධනය විය යුතුයි | 01 |



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ

1. පාසල් වාරය හා උපකරණ අංකය : තුන්වන වාරය - 3
2. ආවරණය වන නිපුනතා මට්ටම් : 7.1, 7.2, 7.3, 7.4, 7.5
3. ආවරණය කරන විෂය සන්ධාරය :
   - නබිතුමාගේ උපත හා තරුණ අවධිය
   - නුබුව්වතය ලැබූ පසුබිම
   - නබිතුමාගේ මිහ්රාජ් ගමන
   - හිජ්රතුන් නබි
4. උපකරණයේ ස්වභාවය :
   - නබිතුමාගේ සීරාව අවබෝධ කරගෙන එතුමන්ගේ ජීවිත අත්දැකීම් හා පූර්වාදර්ශ ඇතුළත් බිත්ති පුවත්පතක් සකස් කිරීම.
5. උපකරණයේ අරමුණු :
   - නබිතුමාගේ සීරාවේ සුවිශේෂී සිද්ධීන් ගවේෂණය කරයි.
   - ඒවා එක්රැස් කරයි.
   - එක්රැස් කළ කරුණු පදනම් කරගෙන බිත්ති පුවත් පතක් සකස් කරයි.
6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :
   1. ගුරුවරුන් සඳහා :
      - ගවේෂණ කාර්ය පත්‍රිකාව දීමට පෙර ඒ පිළිබඳ සිසුන්ට හැඳින්වීමක් කරන්න.
      - කණ්ඩායම් ලෙස එක්ව තොරතුරු රැස්කර බිත්ති පුවත් පත සකස් කරන ලෙස සිසුන් යොමු කරන්න.
      - සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
      - නබිතුමාගේ ජීවිත කතාව ලියන ලද පොත්පත් කියවා තොරතුරු රැස්කිරීමට සිසුන් යොමු කරන්න.
      - ගොනුකළ තොරතුරු ඇසුරෙන් බිත්ති පුවත්පත් සඳහා ලිපි, කවි, විවරණ ආදිය සකස් කිරීමට සිසුන් යොමු කරන්න.
      - බිත්ති පුවත්පත සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබාදෙන්න.
   2. සිසුන්ට උපදෙස් :
      - ගුරුතුමාගේ උපදෙස් අනුව ක්‍රියා කරන්න.
      - පොත්පත් කියවා ලබා ගත් දැනුම ඇසුරෙන් විවිධ නිර්මාණ සකස් කරගන්න.
      - ඒවා සිත් ගන්නා අන්දමින් බිත්ති පුවත්පතෙහි ප්‍රදර්ශනය කරන්න.
      - අන් පන්තිවල සිසුන්ට ද එය නැරැඹීමට අවස්ථාව උදාකර දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## කණ්ඩායම් සඳහා ක්‍රියාකාරකම්

කණ්ඩායම් අංක 1 - නබි (සල්)තුමාගේ උපත හා තරුණ විය පිළිබඳ තොරතුරු රැස්කර කවි ලිපි හෝ වෙනත් නිර්මාණ සකස් කර බිත්ති පුවත්පතෙහි ප්‍රදර්ශනය කරන්න.

කණ්ඩායම අංක 2 - නුබුව්වතය ලැබූ පසුබිම පිළිබඳ තොරතුරු රැස්කොට කවි, ලිපි, කතා හෝ එවැනි වෙනත් නිර්මාණ සකස් කර බිත්ති පුවත්පතෙහි ප්‍රදර්ශනය කරන්න.

කණ්ඩායම් අංක 3 - නබිතුමාගේ මිහ්රාජ් ගමන පිළිබඳ තොරතුරු රැස්කොට කවි, ලිපි වැනි නිර්මාණ සකස් කර බිත්ති පුවත්පතෙහි ප්‍රදර්ශනය කරන්න.

කණ්ඩායම් අංක 4 - හිජ්රතුන් නබි පිළිබඳ තොරතුරු රැස්කොට ලිපි, කවි වැනි නිර්මාණ සකස් කර බිත්ති පුවත් පතෙහි ප්‍රදර්ශනය කරන්න.

| නිර්ණායක / සෑම නිර්ණායකයටම ලකුණු හතරක් ලැබේ. / කණ්ඩායම් අංක හෝ නම | ගෙන්වීමේ අරමුණ හා නිර්මාණය අතර ගැළපීම | නිර්මාණය සඳහා යොදාගත් විවිධ උපාය මාර්ගවල අදාළත්වය | සංවිධානය හා ඉදිරිපත් කිරීම | අරමුණට අදාළ වන අයුරින් කරුණු ගොනු කිරීම. | නිර්ණායක ලෙස සකස් කිරීම සඳහා යොදාගෙන ඇති ප්‍රයෝග හා ඒවායේ අදාළත්වය | මුළු ලකුණු 20 න් | අවසාන ලකුණු 10 න් |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ලකුණු දීමේ පටිපාටිය :

| | |
|---|---|
| ඉතා හොඳයි | 04 |
| හොඳයි | 03 |
| මධ්‍යස්ථයි | 02 |
| සංවර්ධනය විය යුතුයි | 01 |